# WERANJASUTRAYA

සන්න සහිත

# වෙරඤ්ජ සූත්‍රය.

බටුවඳර තිලකාරම විහාර වාසී
**මාගම්මන මෙධානන්ද ස්වාමීන්වහන්සේ විසින්**
සංශොධනය කරණලදි.

වෙන්නාවත්තේ පදින්චි
**ඕ. පී. පේ්‍රරා වනමා විසින්**
බ්‍රැන්ඩියවත්තේ
**විද්‍යාසාගර යන්ත්‍රාලයෙහි**
මුද්‍රණයකරවනලදි.

*Printed at the "Vidyáságara" Press,*
*Brandiyawatte.*

1893.

# දැන්වීමයි.

මජ්ඣිම නිකායෙහි මූලයමකවග්ගයට අන්තර්ගතවූ මෙම සූත්‍රදේශනාව භූතලතිලකවූ අප සම්‍යක්සම්බුද්ධරජාණන් වහන්සේ විසින් වේරඤ්ජා නම් නුවර වැසි බ්‍රාහමණ ගෘහපතීන්ට ඓහලෞකික පාරලෞකිකාර්ථ යන් ප්‍රකාශකිරීම් වශයෙන් දෙශනාකරණ ලද්දකි. මීට පුරාතන පණ්ඩිතුමෙකු විසින් අට්ඨකථාදියට අනුව මාහැඟි ව්‍යාඛ්‍යානයක් කරණලද්දේය. එම ව්‍යාඛ්‍යානයසහිත මේ අගාහී දෙශනාපාලිය මුද්‍රණයකරවා ප්‍රසිද්ධකළහොත් ලොක ශාසනාභිවෘද්ධිය පිණිස පවත්නේයයි බොහෝ දෙනෙකුන්ගේ අයදීම ඇති හෙයින් **මාගම්මන මෙධාඥාභිධාන** සවාමීන් වහන්සේ ලවා ලෙඛක දොෂාපහරණ වශයෙන් සකස් කරවාගෙන මුද්‍රණය කරවනලදි.

මෙය නැවත අච්චුගැස්වීමේ අයිතිවාසිකමද මෙහි පහත අත්සන් කාරණ මටම තබාගත්බැව් දතයුතු.

මීවගම,

සී පී පෙරේරා,

වෙක්ඛාදින්න

# ශුද්ධි පත්‍රය.

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
| --- | --- | --- | --- |
| 2 | 16 | අදිනාදෘයි | අදිනාාදෘසී |
| ,, | 32 | චගනකරණී | චගනකරණීං |
| ,, | 35 | සමඵපලාපි | සමඵ්පලාපි |
| 3 | 5 | පදුට්ඨමනසාසං | පදුට්ඨමනසං |
| ,, | 37 | කරණී | කරණීං |
| 4 | 10 | පදුට්ඨමනසාසං | පදුට්ඨමනසං |
| 7 | 28 | මහිරුහ | මහීරුහ |
| 8 | 1 | නිඛිල | නිඛිල |
| ,, | 4 | ආනාථ | අනාථ |
| ,, | 19 | සාවත්ථීයං | සාවත්ථීයං |
| ,, | 23 | ශිශ්‍යවූ | ශිෂ්‍යවූ |
| ,, | 30 | එශ්‍රමණ | ඒශ්‍රමණ |
| 16 | 9 | සමචයරීා | සමචරියා |
| 17 | 5 | විජින් | විජින් |
| 19 | 23 | ප්‍රසිශුනාය | පෙපසිශුනාය |
| 23 | 20 | ප්‍රසිශුනාය | පෙපසිශුනාය |

# වෙරඤ්ජ සුත්තං.

**නමො තස්ස භගවතො අරහතො**
**සම්මාසම්බුද්ධස්ස.**

එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථ පිණ්ඩිකස්ස ආරාමෙ–තෙන ඛො පන සමයෙන වෙරඤ්ජකා බ්‍රාහ්මණ ගහපතිකා කෙනචිදෙව කරණීයෙන සාවත්ථියං පටිවසන්ති–අස්සොසුං ඛො වෙරඤ්ජකා බ්‍රාහ්මණගහපතිකා සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ–තං ඛො පන භගවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො, ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිස දම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා, සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා, සච්ඡිකත්වා පවෙදෙති සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවල පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොතීති.

අථ ඛො වෙරඤ්ජකා බ්‍රාහ්මණගහපතිකා යෙන භගවා තෙනුපසං කමිංසු උපසංකමිත්වා අප්පෙකච්චෙ භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු අප්පෙකච්චෙ භගවතා සද්ධිං සම්මොදිංසු සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු අප්පෙකච්චෙ යෙන භගවා තෙනඤ්ජලිම්පනාමෙත්වා එකමන්තං නිසීදිංසු අප්පෙකච්චෙ භගවතො සන්තිකෙ නාමගොත්තං සාවෙත්වා එකමන්තං නිසීදිංසු අප්පෙකච්චෙ තුණ්හීභූතා එකමන්තං නිසීදිංසු එකමන්තං නිසින්නාඛො වෙරඤ්ජකා බ්‍රාහ්මණගහපතිකා භගවන්තං එතදවොචුං. කොනු ඛො භො ගොතම හෙතු කො පච්චයො යෙනමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති කොපන භො ගොතම හෙතු කො පච්චයො යෙනමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්තීති. අධම්මචරියා විසම

චරියා හෙතු ඛො ගහපතයො එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා, පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති ධම්මචරියා සමචරියා හෙතු ඛො ගහපතයො එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා, පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්තීති, න ඛො මයං ඉමස්ස භොතො ගොතමස්ස සංඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං ආජානාම සාධු නො භවං ගොතමො තථා ධම්මං දෙසෙතු යථා මයං ඉමස්ස භොතො ගොතමස්ස සංඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං ආජානෙය්‍යාමාති, තෙනහි ගහපතයො සුණාථ සාධුකං මනසිකරොථ භාසිස්සාමීති, එවම්භොති ඛො වෙරඤ්ජකා බ්‍රාහ්මණගහපතිකා භගවතො පච්චස්සොසුං භගවා එතදවොච, තිවිධං ඛො ගහපතයො කායෙන අධම්මචරියා විසමචරියා හොති චතුබ්බිධං වාචාය අධම්මචරියා විසමචරියා හොති තිවිධං මනසා අධම්මචරියා විසමචරියා හොති කථඤ්ච ගහපතයො තිවිධං කායෙන අධම්මචරියා විසමචරියා හොති ඉධ ගහපතයො එකච්චො පාණාතිපාතී හොති ලුද්දො, ලොහිතපාණී හතපහතෙ නිවිට්ඨො අදයාපන්නො පාණභූතෙසු—අදින්නාදායී ඛො පන හොති යන්තං පරස්ස පරවිත්තූපකරණං ගාමගතං වා අරඤ්ඤගතං වා අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදාතා හොති, කාමෙසුමිච්ඡාචාරී ඛො පන හොති යා තා මාතුරක්ඛිතා පිතුරක්ඛිතා මාතාපිතුරක්ඛිතා භාතුරක්ඛිතා භගිනිරක්ඛිතා ඤාතිරක්ඛිතා සස්සාමිකා සපරිදණ්ඩා අන්තමසො මාලාගුණපරික්ඛිත්තාපි තථාරූපාසු චාරිත්තං ආපජ්ජිතා හොති එවං ඛො ගහපතයො තිවිධං කායෙන අධම්මචරියා විසමචරියා හොති.

කථඤ්ච ගහපතයො චතුබ්බිධං වාචාය අධම්මචරියා විසමචරියා හොති ඉධ ගහපතයො එකච්චො මුසාවාදී හොති සභාගතොවා පරිසගතොවා ඤාතිමජ්ඣගතොවා පූගමජ්ඣගතොවා රාජකුලමජ්ඣගතොවා අභිනීතො සක්ඛිපුට්ඨො එවම්භො පුරිස යං ජානාසි තං වදෙහීති සො අජානංවා ආහ ජානාමීති ජානංවා ආහ නජානාමීති අපස්සංවා ආහ පස්සාමීති පස්සංවා ආහ නපස්සාමීති ඉති අත්තහෙතුවා පරහෙතුවා ආමිස කිඤ්චික්ඛ හෙතුවා සම්පජානමුසාභාසිතා හොති පිසුණාවාචො ඛො පන හොති ඉතො සුත්වා අමුත්‍ර අක්ඛාතා ඉමෙසම්භෙදාය අමුත්‍ර වා සුත්වා ඉමෙසං අක්ඛාතා අමූසම්භෙදාය ඉති සමග්ගානං වා භෙත්තා භින්නානං වා අනුප්පදාතා වග්ගාරාමො වග්ගරතො වග්ගනන්දී වග්ගකරණිං වාචම්භාසිතා හොති, ඵරුසාවාචො ඛොපන හොති යාසාවාචා අණ්ඩකා කක්කසා පරකටුකා පරාභිසජ්ජනී කොධසාමන්තා අසමාධිසංවත්තනිකා තථාරූපිං වාචම්භාසිතා හොති, සම්ඵප්පලාපී ඛො පන හොති අකාලවාදී අභූතවාදී අනත්ථවාදී අධම්මවාදී අවිනයවාදී අනිධානවතිං වාචම්භාසිතා අකාලෙන අනපදෙසං අපරියන්තවතිං අනත්ථසංහිතං එවං ඛො ගහපතයො

චතුබ්බිධං වාචාය අධම්මචරියා විසමචරියා හොති, කථඤ්ච ගහපතයො තිවිධං මනසා අධම්මචරියා විසමචරියා හොති ඉධ ගහපතයො එකච්චො අභිජ්ඣාලු හොති යන්තං පරස්ස පරවිත්තූපකරණං තං අභිජ්ඣිතා හොති අහොවතායං පරස්ස තං මම අස්සාති, ව්‍යාපන්නචිත්තො ඛො පන හොති පදුට්ඨමනසංකප්පො ඉමෙ සත්තා හඤ්ඤන්තු වා වජ්ඣන්තු වා උච්ඡිජ්ජන්තු වා විනස්සන්තු වා මා වා අහෙසුං ඉතිවාති මිච්ඡාදිට්ඨි ඛො පන හොති විපරීතදස්සනො නත්ථි දින්නං නත්ථි යිට්ඨං නත්ථි හුතං නත්ථි සුකතදුක්කටානං කම්මානං ඵලං විපාකො නත්ථි අයං ලොකො නත්ථි පරලොකො නත්ථි මාතා නත්ථි පිතා නත්ථි සත්තා ඔපපාතිකා නත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මා පටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තීති එවං ඛො ගහපතයො තිවිධං මනසා අධම්මචරියා විසමචරියා හොති එවං අධම්මචරියා විසමචරියා හෙතු ඛො ගහපතයො එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්තීති, තිවිධං ඛො ගහපතයො කායෙන ධම්මචරියා සමචරියා හොති චතුබ්බිධං වාචාය ධම්මචරියා සමචරියා හොති තිවිධං මනසා ධම්මචරියා සමචරියා හොති.

කථඤ්ච ගහපතයො තිවිධං කායෙන ධම්මචරියා සමචරියා හොති ඉධ ගහපතයො එකච්චො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතහිතානුකම්පී විහරති, අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති යන්තං පරස්ස පරවිත්තූපකරණං ගාමගතං වා අරඤ්ඤගතං වා අදින්නං ථෙය්‍යසංඛාතං න ආදාතා හොති කාමෙසු මිච්ඡාචාරං පහාය කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති යාතා මාතුරක්ඛිතා පිතුරක්ඛිතා මාතාපිතුරක්ඛිතා භාතුරක්ඛිතා භගිනීරක්ඛිතා ඤාතිරක්ඛිතා සස්සාමිකා සපරිදණ්ඩා අන්තමසො මාලාගුණපරික්ඛිත්තාපි තථා රූපාසු චාරිත්තං අනාපජ්ජිතා හොති එවං ඛො ගහපතයො තිවිධං කායෙන ධම්මචරියා සමචරියා හොති කථඤ්ච ගහපතයො චතුබ්බිධං වාචාය ධම්මචරියා සමචරියා හොති ඉධ ගහපතයො එකච්චො මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති සභාගතොවා පරිසගතොවා ඤාතිමජ්ඣගතො වා පූගමජ්ඣගතො වා රාජකුලමජ්ඣගතො වා අභිනීතො සක්ඛිපුට්ඨො එවං භො පුරිස යං ජානාසි තං වදෙහීති සො ජානං වා ආහ ජානාමීති අජානං වා ආහ නජානාමීති පස්සං වා ආහ පස්සාමීති අපස්සං වා ආහ නපස්සාමීති ඉති අත්තහෙතුවා පරහෙතුවා ආමිසකිඤ්චික්ඛහෙතුවා න සම්පජානමුසා භාසිතා හොති පිසුනාවාචං පහාය පිසුනාවාචාය පටිවිරතො හොති ඉතො සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය අමුත්‍ර වා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය ඉති භින්නානං වා සන්ධාතා සහිතානං වා අනුප්පදාතා සමග්ගාරාමො සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණී

වාචම්භාසිතා හොති ඵරුසාවාචම්පහාය ඵරුසාවාචාය පටිවිරතො හොති
යාසාවාචා නෙලාකණ්ණසුඛා පෙමණීයා හදයංගමා පොරී බහුජනකන්තා
බහුජනමනාපා තථාරූපිං වාචම්භාසිතා හොති, සම්ඵප්පලාපං පහාය
සම්ඵප්පලාපා පටිවිරතො හොති කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී
විනයවාදී නිධානවතිං වාචම්භාසිතා හොති කාලෙන සාපදෙසං පරිය
න්තවතිං අත්ථසංහිතං එවං ඛො ගහපතයො චතුබ්බිධං වාචාය ධම්මචරියා
සමචරියා හොති, කථංච ගහපතයො තිවිධං මනසා ධම්මචරියා සමචරියා
හොති ඉධ ගහපතයො එකච්චො අනභිජ්ඣාලු හොති යන්තං පරස්ස පර
විත්තූපකරණං තං නාභිජ්ඣිතා හොති අහොවතායං පරස්ස තං මම
අස්සාති, අව්‍යාපන්න චිත්තො ඛො පන හොති අප්පදුට්ඨ මනසා සංකප්පො
ඉමෙ සත්තා අවෙරා අබ්‍යාපජ්ඣා අනීඝා සුඛී අත්තානං පරිහරන්තූති සම්මා
දිට්ඨිකො පන හොති අවිපරීත දස්සනො අත්ථි දින්නං අත්ථියිට්ඨං අත්ථි හුතං
අත්ථි සුකතදුක්කටානං කම්මානං ඵලං විපාකො අත්ථි අයං ලොකො
අත්ථි පරලොකො අත්ථි මාතා අත්ථි පිතා අත්ථි සත්තා ඔපපාතිකා අත්ථි
ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මා පටිපන්නා යෙ ඉමංච ලොකං
පරංච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තීති—එවං ඛො ගහ
පතයො තිවිධං මනසා ධම්මචරියා සමචරියා හොති එවං ධම්මචරියා සම
චරියා හෙතු ඛො ගහපතයො එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා
පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති ආකංඛෙය්‍ය චෙ ගහ
පතයො ධම්මචාරී සමචාරී අහොවතාහං කායස්සභෙදා පරම්මරණා
ඛත්තිය මහාසාලානංවා සහව්‍යතං උපපජ්ජෙය්‍යන්ති ඨානං ඛො පනෙ
තං විජ්ජතියං සො කායස්ස භෙදා පරම්මරණා ඛත්තිය මහාසාලානංවා
සහව්‍යතං උපපජ්ජෙය්‍ය තං කිස්ස හෙතු? තථාහි සො ධම්මචාරී සමචාරී
ආකංඛෙය්‍ය චෙ ගහපතයො ධම්මචාරී සමචාරී අහොවතාහං කායස්ස
භෙදා පරම්මරණා බ්‍රාහ්මණ මහාසාලානංවා සහව්‍යතං උපපජ්ජෙය්‍යන්ති
ඨානං ඛොපනෙතං විජ්ජති යං සො කායස්සභෙදා පරම්මරණා බ්‍රාහ්මණ
මහාසාලානංවා සහව්‍යතං උපපජ්ජෙය්‍ය තංකිස්සහෙතු? තථාහි සො
ධම්මචාරී සමචාරී ආකංඛෙය්‍ය චෙ ගහපතයො ධම්මචාරීසමචාරී අහොව
තාහං කායස්සභෙදා පරම්මරණා ගහපතිමහාසාලානංවා සහව්‍යතං උප
පජ්ජෙය්‍යන්ති ඨානං ඛො පනෙතං විජ්ජති යං සො කායස්ස භෙදා පරම්ම
රණා ගහපතිමහාසාලානංවා සහව්‍යතං උපපජ්ජෙය්‍ය තං කිස්ස හෙතු?
තථාහි සො ධම්මචාරී සමචාරී ආකංඛෙය්‍ය චෙ ගහපතයො ධම්මචාරී
සමචාරී අහොවතාහං කායස්සභෙදා පරම්මරණා චාතුම්මහාරාජිකානං
දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍යන්ති ඨානං ඛොපනෙතං විජ්ජතියං
සො කායස්සභෙදා පරම්මරණා චාතුම්මහාරාජිකානං දෙවානං සහව්‍යතං
උපපජ්ජෙය්‍ය තං කිස්ස හෙතු? තථාහි සො ධම්මචාරී සමචාරී ආකං
ඛෙය්‍ය චෙ ගහපතයො ධම්මචාරී සමචාරී අහොවතාහං කායස්සභෙදා

පරම්මරණා තාවතිංසානං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍යන්ති ඨානං
ඛො පනෙතං විජ්ජතියං සො කායස්සභෙදා පරම්මරණා තාවතිංසානං
දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍ය තං කිස්ස හෙතු? තථාහි සො ධම්ම
චාරී සමචාරී ආකඞ්ඛෙය්‍ය චෙ ගහපතයො ධම්මචාරී සමචාරී අහොවතා
හං කායස්සභෙදා පරම්මරණා යාමානං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍ය
න්ති ඨානං ඛො පනෙතං විජ්ජති යං සො කායස්සභෙදා පරම්මරණා
යාමානං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍ය තං කිස්ස හෙතු? තථාහි සො
ධම්මචාරී සමචාරී ආකඞ්ඛෙය්‍ය චෙ ගහපතයො ධම්මචාරී සමචාරී අහො
වතාහං කායස්ස භෙදා පරම්මණා තුසිතානං දෙවානං සහව්‍යතං උපප
ජ්ජෙය්‍යන්ති ඨානං ඛො පනෙතං විජ්ජතියං සො කායස්ස භෙදා පරම්ම
රණා තුසිතානං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍ය තං කිස්ස හෙතු?
තථාහි සො ධම්මචාරී සමචාරී ආකඞ්ඛෙය්‍ය චෙ ගහපතයො ධම්මචාරී
සමචාරී අහොවතාහං කායස්සභෙදා පරම්මරණා නිම්මාණරතීණං දෙවා
නං සහව්‍යතං උපපජ්ජෙය්‍යන්ති ඨානං ඛොපනෙතං විජ්ජති යං සො
කායස්සභෙදා පරම්මරණා නිම්මාණරතීනං දෙවානං සහව්‍යතං උප
පජ්ජෙය්‍ය තංකිස්ස හෙතු තථාහි සො ධම්මචාරී සමචාරී ආකඞ්ඛෙය්‍ය චෙ
ගහපතයො ධම්මචාරී සමචාරී අහොවතාහං කායස්ස භෙදා පරම්මරණා
පරනිම්මිතවසවත්තීනං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍යන්ති ඨානං
ඛොපනෙතං විජ්ජතියං සො කායස්සභෙදා පරම්මරණා පරනිම්මිතවස
වත්තීනං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍ය තං කිස්ස හෙතු? තථාහි සො
ධම්මචාරී සමචාරී ආකඞ්ඛෙය්‍ය චෙ ගහපතයො ධම්මචාරී සමචාරී අහො
වතාහං කායස්සභෙදා පරම්මරණා බ්‍රහ්මකායිකානං දෙවානං—පෙ—ආක
ඞ්ඛෙය්‍ය චෙ ගහපතයො ධම්මචාරී සමචාරී අහොවතාහං කායස්සභෙදා
පරම්මරණා ආභානං දෙවානං—පෙ—ආකඞ්ඛෙය්‍ය චෙ ගහපතයො ධම්ම
චාරී සමචාරී අහොවතාහං කායස්සභෙදා පරම්මරණා පරිත්තාභානං දෙ
වානං—පෙ—ආකඞ්ඛෙය්‍යචෙ ගහපතයො ධම්මචාරී සමචාරී අහොවතාහං
කායස්සභෙදා පරම්මරණා අප්පමානාභාණං දෙවානං—පෙ—ආකඞ්ඛෙය්‍ය
චෙ ගහපතයො ධම්මචාරී සමචාරී අහොවතාහං කායස්සභෙදා පරම්මර
ණා ආභස්සරානං දෙවානං—පෙ—ආකඞ්ඛෙය්‍ය චෙගහපතයො ධම්මචාරී
සමචාරී අහොවතාහං කායස්සභෙදා පරම්මරණා පරිත්තසුභානං දෙ
වානං—පෙ—ආකඞ්ඛෙය්‍ය චෙ ගහපතයො ධම්මචාරී සමචාරී අහො
වතාහං කායස්ස භෙදා පරම්මරණා අප්පමාණසුභානං දෙවානං—පෙ—
ආකඞ්ඛෙය්‍ය චෙ ගහපතයො ධම්මචාරී සමචාරී අහොවතාහං කායස්ස
භෙදා පරම්මරණා සුභකිණ්ණකානං දෙවානං—පෙ—ආකඞ්ඛෙය්‍ය චෙ ගහ
පතයො ධම්මචාරී සමචාරී අහොවතාහං කායස්සභෙදා පරම්මරණා වෙ
හප්ඵලානං දෙවානං—පෙ—ආකඞ්ඛෙය්‍ය චෙ ගහපතයො ධම්මචාරී සම
චාරී අහොවතාහං කායස්සභෙදා පරම්මරණා අවිහානං දෙවානං—පෙ—

ආකඞ්ඛෙය්‍ය චෙ ගහපතයො ධම්මචාරී සමචාරී අහොවතාහං කායස්ස
භෙදා පරම්මරණා අතප්පානං දෙවානං—පෙ—ආකඞ්ඛෙය්‍ය චෙ ගහ
පතයො ධම්මචාරී සමචාරී අහොවතාහං කායස්සභෙදා පරම්මරණා සුදස්සා
නං දෙවානං—පෙ—ආකඞ්ඛෙය්‍ය චෙ ගහපතයො ධම්මචාරී සමචාරී
අහොවතාහං කායස්සභෙදා පරම්මරණා සුදස්සීනං දෙවානං—පෙ—ආක
ඞ්ඛෙය්‍ය චෙ ගහපතයො ධම්මචාරී සමචාරී අහොවතාහං කායස්සභෙදා
පරම්මරණා අකනිට්ඨානං දෙවානං—පෙ—ආකඞ්ඛෙය්‍ය චෙ ගහපතයො
ධම්මචාරී සමචාරී අහොවතාහං කායස්සභෙදා පරම්මරණා ආකාසාන
ඤ්චායතනූපගානං දෙවානං—පෙ—ආකඞ්ඛෙය්‍ය චෙ ගහපතයො ධම්මචාරී
සමචාරී අහොවතාහං කායස්සභෙදා පරම්මරණා විඤ්ඤාණඤ්චායතනූප
ගානං දෙවානං—පෙ—ආකඞ්ඛෙය්‍ය චෙ ගහපතයො ධම්මචාරී සමචාරී
අහොවතාහං කායස්සභෙදා පරම්මරණා ආකිඤ්චඤ්ඤායතනූපගානං
දෙවානං—පෙ—ආකඞ්ඛෙය්‍ය චෙ ගහපතයො ධම්මචාරීසමචාරී අහොවතා
හං කායස්සභෙදා පරම්මරණා නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපගානං දෙවා
නං—පෙ—ආකඞ්ඛෙය්‍ය චෙ ගහපතයො ධම්මචාරී සමචාරී අහොවතාහං
ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ
සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යන්ති ඨානං ඛොපනෙතං
විජ්ජතියං සො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමු
ත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍ය
තං කිස්ස හෙතු? තථාහි සො ධම්මචාරී සමචාරී. එවං වුත්තෙ වෙර
ඤ්ජකා බ්‍රාහ්මණගහපතිකා භගවන්තං එතදවොචුං අභික්කන්තං භො
ගොතම අභික්කන්තං භො ගොතම සෙය්‍යථාපි භො ගොතම නික්කු
ජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං
ආචික්ඛෙය්‍ය අන්ධකාරෙවා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො
රූපානි දක්ඛින්තීති එවමෙවං භො ගොතමෙන අනෙකපරියායෙන
ධම්මො පකාසිතො එතෙ මයං භගවන්තං ගොතමං සරණං ගච්ඡාම
ධම්මංච භික්ඛුසඞ්ඝංච උපාසකෙ නො භවං ගොතමො ධාරෙතු අජ්ජ
තග්ගෙ පාණුපෙතෙ සරණංගතෙති.

නිට්ඨිතං.

# වෙරඤ්ජ සූත්‍ර සන්නය.

නමො තස්ස භගවතො අරහතො
සම්මාසම්බුද්ධස්ස.

මෙ, (ආයුෂ්මත්වූ මහාකාශ්‍යපස්ථවිරයන්වහන්ස) මා විසින්, (නානානය නිපුන අනෙකාධ්‍යාශයානුකූල අර්ථව්‍යඤ්ජනසම්පන්න ශ්‍රොතෘජන මනඃප්‍රසාදජනකවූ මේ වෙරඤ්ජ සූත්‍රාන්ත ධර්මදෙශනාව); එවං සුතං, (මේ ආකාරයෙන් අසනලද මෙසේ අසනලද) මෙසේම අසනලදී; (නොහොත්) මෙ, මාගේ; සුතං, ශ්‍රැතිය (හෙවත් ඇසීම); එවං, මෙසේමැයි; ඒකං සමයං, (සංවත්සර ඍතු මාස පක්ෂ රාත්‍රි දිවා පූර්වාහ්න මධ්‍යාහ්න පරාහ්න ප්‍රථම මධ්‍යම පශ්චිම යාම ක්ෂණ මුහුර්තාදි කාල ප්‍රභෙදයන් අතුරෙන් එක් කාලයෙක්හි දෝහෝ නොහොත් ගර්භාවක්‍රාන්ති සමය ජාති සමය සංවෙග සමය අභිනිෂ්ක්‍රමන සමය දුෂ්කරක්‍රියා සමය මාරවිජය සමය සම්‍යක් සම්බොධි සම්බිගම කාල සමය දෘෂ්ටධර්ම සුඛවිහාර සමය අත්තහිත පටිපත්ති සමය පරහිතපටිපත්ති සමය දෙශනා සමය පරිනිර්වාණසමය යනාදී දිව්‍ය මනුෂ්‍යයන්කෙරෙහි ප්‍රකාශ සමයන් අතුරෙන් කරුණාකෘත්‍ය සමය සඞ්ඛ්‍යාත) එක් ධර්මදෙශනා සමයෙක්හි; භගවා, (සකරාමර සකල ලොකවාසීන් විසින් උත්තම ගෞරවසර්වනීයවූ) භාග්‍යවත් සර්වඥයන්වහන්සේ; සාවත්ථියං, (සවසතී නම් ඍෂීහුගේ නිවාසස්ථානයෙහි කරණලද හෙයින් ශ්‍රාවස්ති නම් පුරප්‍රවරසන්නයෙහිවූ; ජෙතවනෙ, (ජෙතනම් රාජකුමාරයා විසින් සමුත්පන්නවූ නන්ද පුරප්‍රවර තිලකාභරණායමාන අපරිමිත කරිතුරඞ්ග රථපදඞ්ග මණිකනක රජත ධන යුවති විබුධජනනිවාස, සකල ශ්‍රීසමෘද්ධියෙන් හා සුරනගරවර ශ්‍රාවස්ති පුර සුවරසන්නයෙහි රොපිත සංවර්ධිතවූ විකසිත යසෝවිධ පද්මොත්පල සංජාත මධුර ජලසම්පූර්ණ පුෂ්කරණියෙන් හා සුරභිමකරන්ද බින්දු සංජීවන ශක්තබරිත භෘඞ්ග කොකිලාලාප වාචාල මයූර පුච්ඡමන්ද කුන්ද මන්දාර පූග පුන්නාග නාග තාල තමාල තින්තිනාළ වකුල ඛර්ජූරිකා ක්‍රමුකාම්‍රජම්බීර පනස පාටල කෙතකාශොක චම්පකාදි නිත්‍යඵල නිත්‍යපුෂ්පයෙන් යුක්ත නෙකමහීරුහ සඞ්ඝාතයෙන් සකලජනමනොනන්දනීයවූ ජෙතවනොද්‍යානයෙහි; අනාථපිණ්ඩිකස්ස, ආරාමෙ, (සන්තත සුචරිත විසදසකරුණාහෘදය පරිහත පූරිත සමුදය සකල ගුණනිධි විබුධ

ජනසක නිඛිල ජන පරහිත නිරත නිජ දෙහධරවූ සියලු අනාථ යාචක ජනයන්ට සුරනි සුරම්ණි සුරතුරු සුවිතරණයෙන් කැමැති මහරු ඉසුරු සිරි දීමෙන් පරමනාථවූ සතසනශ්‍රාම්නකාලයක් මුළුල්ලෙහි බුදුකෙනෙකුන්ට නිබඳ වසන සේ සෙනස්නක් කරදෙන පිණිස පනා ආ) ආනාථ පිණ්ඩික නාම් මහසිටානන් විසින් (ත්‍රිභුවනෛක ප්‍රදීපායමාන ලොකනාථ ජගදීශ්වරවූ සර්වඥරජොත්තමයානන්වහන්සේ උදෙසා සිව් පණස් කෙලක් ධන වියදම් කොට) කරවා පිළිගන්වන ලද (ප්‍රාසාදමණ්ඩප කූටාගාරදියෙන් සශ්‍රීකවූ ප්‍රවරතර) ජෙතවනාරාමයෙහි; විහරති, (ස්ථාන ගමන නිසජ්ජාදී චතුර්විධ ආයඊ ර්‍ය්‍යඊාපථ බ්‍රහ්මවිහරණයෙන් යුක්තව) වැඩවාසයකරවදාරණසේක.

තෙන ඛොපන සමයෙන, (යම්සමයෙක්හි ප්‍රවරදීහ කුම්භස්ථල විද්‍රුරනෙක සිංහායමානවූ සර්වඥරජොත්තමයානන්වහන්සේ ශ්‍රාවස්ති නාම් පුරප්‍රවරය ගොචරග්‍රාම කොට ජෙතවන මහවිහාරයෙහි වැඩවාසයකරණසේක්ද) එසමයෙහි වනාහි; වෙරඤ්ජකා, වෙරඤ්ජානාම් නුවර වාසීවූ (හෙවත් මීට පස්වැනි කල්පයෙහි බොධිසත්වයන් කෙරෙහි රන් තලිය නිසා දෙව්දත් මහ තෙරහු වෛරකළ ස්ථානයෙහි වූහෙයින්) වෙරඤ්ජා යයි නම්ලද නුවර වාසීවූ; බ්‍රාහ්මණ ගහපතිකා, බ්‍රාහ්මණයන් හා ගෘහපතිහු; කෙනචිදෙව කරණීයෙන, යම් කිසි ක්‍රියාවක් හෙතු කොට ගෙණ; සාවත්ථියං, ශ්‍රාවස්ති නාම් පුරප්‍රවරයෙහි; පටිවසනති, වාසය කරන්නාහුය; වෙරඤ්ජකා, (එසේ සැවත් නුවරට අවුත් වාසයකරන්නාවූ) වෙරඤ්ජානාම් නුවර වාසීවූ; බ්‍රාහ්මණ ගහපතිකා, බ්‍රාහ්මණ ගෘහපතිහු; හො, පින්වත්නි; ගොතමො, (කපිලවංශයෙහි ජාත ගෞතම සෘෂීහුගේ සිශ්‍යවූ ශාක්‍යවංශයෙහි උපන්හෙයින් ගුරුගොත්‍ර වසයෙන්) ගෞතම නාම්වූ; සමණො ඛලු, “සමිතපාපා සමණොති” යනුහෙයින් නිරුත්තරයයි මාර්ගඥානයෙන් සවාසනා සර්වක්ලෙශශමථනයකළහෙයින් ශ්‍රමණ නාම්ලද) තථාගත වූකලී; සක්‍යපුත්තො, (උදිතොදිත විපුල ශාක්‍යකුලතිලකායමාන) සුධොදන මහරජහුගේ පුත්‍රවූ; සක්‍යකුලා, වෛවස්වත මනුසඞ්ඛ්‍යාත මහාසම්මත මහරජහුපටන් අසඞ්කීර්ණව පැවතආ උදාරතර) ශාක්‍යරජ කුලයෙන් නික්ම; පබ්බජිතො, ඥාතිව්‍යසන භොගව්‍යසනාදි කිසි පරිහානියක්නැතිව උදක් ශ්‍රද්ධායෙන්ම පැවිදිවූ) එ ශ්‍රමණ භවත් ගෞතම තෙම; සාවත්ථියං, ශ්‍රාවස්තිනාම් පුරප්‍රවරස්ථානයෙහිවූ; ජෙතවනෙ, (ජෙතනාම් රාජකුමාරයා විසින් රොපිත සංවර්ධිත හෙයින්) ජෙතවන නාම්වූ; අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, අනේපිඩුමහසිටුහු විසින් කරවා පිළිගන්වනලද සර්ව සමෘද්ධියෙන් යුක්තවූ ජෙතවන මහා විහාරයෙහි; විහරති, වාසයකරනසේකැයි (යන මේ ප්‍රවෘත්තිය); අස්සොසුං ඛො, ඇසුවාහු මය (හෙවත් ශ්‍රොත්‍රද්වාර විඥානවීථියට සම්ප්‍රාප්තවූ වාග්ඝොෂානුසාරයෙන් පරිඥානය කළාහුයි.)

මෙසේ අසා ඊට ඉක්බිතෙන් පූර්වානුස්මෘති වශයෙන් ඔවුන් කර
යාමත් ඔහු ගුණත් සලකන්නේ “ තං ඛො පන භගවන්තං ” යනාදී
බුදුගුණ සිතුවාහුයි.

තං ඛො පන භගවන්තං ගොතමං (තස්ස ඛො පන භො ගොතමස්ස),
ඒ භවත් ගෞතම ගොත්‍රඇති සර්වඥා සම්බන්ධිවූ; කල්‍යාණො, (ශොභන
ගුණවිශෙෂයන්විසය කොට පවත්නා හෙයින්) ශොභනවූ; කිත්තිසද්දො,
(“ තත්‍රතත්‍ර ගුණකථනම් කීර්තිඃ ” යනුහෙයින් ඒ ඒ තන්හි ගුණකථන
වශයෙන් ප්‍රවෘත්තිනවූ) කීර්ති ඝොෂාවෙක්; එවං, මේ වක්ෂ්‍යමාන ප්‍රකා
රයෙන්; අබ්භුග්ගතො, (අභි උග්ගතො) සමස්තසත්වලොකයා අභිභවනය
කොට පැවැත්තේය; (ඒ කීර්ති ඝොෂාව නම් කවරේද?) සො භගවා,
ඒ භාග්‍යවත් තෙම; ඉතිපි අරහං, (සර්වකෙලශයන් කෙරෙන් දුරුවූ
බැවින්ද රාගාදී කෙලෙස් නැමැති ශත්‍රූන් මාර්ගඥාණයෙන් සමූලඝාතව
නැසූ හෙයින්ද සංසාරචක්‍රයාගේ අරකැපූ හෙයින්ද දිව්‍යබ්‍රහ්ම නාග
සුපර්ණගරුඩගන්ධර්වසිද්ධවිද්‍යාධරාදීන් විසින් කරණලද උදාරතර ප්‍රත්‍යය
ප්‍රතිපත්තිපූජාවට යොග්‍ය හෙයින්ද ලොභවෙසාදී පාපහෙතූන් සුප්‍ර
හීණ බැවින්ද රහසත් පව් නොකරණහෙයින්ද යන මෙතෙක් කාරණ
යෙන්) අර්හත්නම් වන සේක; සො භගවා, ඒ භාග්‍යවත්තෙම; ඉතිපි
සම්මාසම්බුද්ධො, (අවිපරීතකොට පරප්‍රත්‍යය නොවී ස්වලක්ෂණ සාමාන්‍ය
ලක්ෂණ වශයෙන් විශිෂ්ටඥානයෙන් දතයුතුවූ චතුස්සත්‍ය ධර්මයන් පූර්ව
භාගයෙහි විදර්ශනා ඥානයෙන්ද අධිගම ක්ෂණයෙහි මාර්ගඥානයෙන්ද
අපරභාගයෙහි සර්වඥතාඥානයෙන්ද අවබොධය කෙළේය යන මෙතෙක්
කාරණයෙන්) සම්‍යක්සම්බුද්ධනම් වනසේක; සො—පෙ—විජ්ජාචරණ
සම්පන්නො, (ස්වවිසයවිදිත කරණාර්ථයෙන් විද්‍යා නම්වූ විදර්ශනාඥාන
මනොමය ඍද්ධිවිධ දිව්‍ය ශ්‍රොත්‍ර පරචිත්තවිජානන පූර්වෙනිවාසානුස්මෘති
දිව්‍යචක්ෂුරභිඥාන ආශ්‍රවක්ෂයඥාණය යන අෂ්ටවිද්‍යාවෙන් හා ශීලසං
වරය ඉන්ද්‍රියයෙහි ගුප්තද්වාරතාවය භොජනයෙහි මාත්‍රඥබවය ජාගරියානු
යොගය ශ්‍රද්ධාය හිරිය අපත්‍රපාය බහුශ්‍රැත්‍යය වීර්‍ය්‍යය ස්මෘතිය ප්‍රඥාය යන
එකොළොසහා රූපාවචරධ්‍යාන සතරය යන පසළොස්චරණධර්මයෙන්
යුක්තහෙයින්ද යන මෙතෙක් කාරණයෙන් විජ්ජාචරණ සම්පන්නනම්
වනසේක; සො—පෙ—ඉතිපි සුගතො, (ශොභනගති සඞ්ඛ්‍යාත විශුද්ධාර්‍ය්‍ය
මාර්ගයෙන් නිර්වාණයට ක්ෂිප්‍රාභිඥාවශයෙන් ගිය හෙයින්ද නොහොත් දීප
ඞ්කරපාදමූලයෙහි පටන් බොධිමූලය දක්වා සමත්‍රිංශත් පාරමී ධර්මයන්
පුරන්නාවූ අවිපරීත ප්‍රතිපත්තියෙන් සියළුසත්වයන්ට හිතසැප එළවමින්
ශාස්වතොච්ඡෙද කාමසුඛ ආත්ම ක්ලමථය යන චතුරන්තරයට නො
ගොස් ආර්‍ය්‍යමාර්ග ගතියෙන් මනාකොට ගියහෙයින්ද සකල සංස්කාර
ප්‍රවෘත්තීන්ගේ අභාවයෙන් ඒකාන්ත සුන්දරවූ අමෘත මහා නිර්වාණයට
ගිය හෙයින්ද තත්තත් මාර්ගයෙන් ප්‍රහීණකෙලශයන්ගේ අපුනරාවෘත්ති

කාරණවශයෙන් මනාකොට ගියහෙයින්ද යුක්තවචනයන් නිෂ්පාද්‍ය කල්හි සත්‍යසාර්‍ථ ප්‍රිය වචනයන් කථනය කළ හෙයින්ද ද්වාත්‍රිංශත්වර මහා පුරුෂලක්‍ෂණාශීත්‍යානුව්‍යඤ්ජන ව්‍යාමප්‍රභානුරඤ්ජිත රූප කාය සම්පත්තියක් ඇතිබැවින්ද ද්‍රැත විලම්බිතස්ඛලිතානුකර්‍ෂණ නිෂ්පීඩනොත්කුටිතාකුලතාදි දෝෂ රහිතව අපහසිත රාජහංසවෘෂභ වරවාරණ මෘගරාජ ගමන විලාස ඇති ශෝභනවූ කායගමනින් හා විපුල විමල කරුණාසමාධි වීර්‍යාදි ගුණ විශෙෂ සහිතවූ ඥානගමනින් යුක්ත හෙයින්ද යන මෙතෙක් කාරණයෙන්) සුගතනාම් වනසේක; සො-පෙ- ඉතිපි ලොකවිදූ, ("එකො ලොකො සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා ද්වෙ ලොකා නාමඤ්ච රූපඤ්ච තයො ලොකා තිස්සො වෙදනා චත්තාරො ලොකා චත්තාරො ආහාරා පඤ්ච ලොකා පඤ්චුපාදානක්ඛන්ධා" යනාදීන් දක්වන ලද ඉන්ද්‍රියානින්ද්‍රිය ප්‍රතිබද්ධ ස්කන්ධයන්ගේ සමූහසඞ්ඛ්‍යාත සංස්කාරලොකයද, "සබ්බසම්පි සත්තානං ආසයං ජානාති අනුසයං ජානාති චරිතං ජානාති අධිමුත්තිං ජානාති අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ" යනාදීන් දක්වනලද ඉන්ද්‍රියප්‍රතිබද්ධ ස්කන්ධයන්ගේ සමූහ සඞ්ඛ්‍යාත සත්ව ලොකයද "යාවතා චන්දිමසූරියා පරිහරන්ති දිසාභන්ති විරොචනා" යනාදීන් දක්වනලද අගමින් විතරින් දොළොස්ලක්‍ෂ තුන්දහස් සාරසිය පණස් යොදුන් පමණඇති වටින් සතිස්ලක්‍ෂ දසදහස් තුන්සිය පණස්යොදුන් පමණඇති චක්‍රවාලය දෙලක්‍ෂ සතලිස් දහස් යොදුන් පමණ බොලඇති මහා පස්පොලවය ඒ පස්පොලව දරූ සාරලක්‍ෂ අසූදහසක් යොදුන් පමණ බොල ඇති දියපොලවය ඒ දියපොලව දරූ නවලක්‍ෂ සැට දහසක් යොදුන් පමණ බොලඇති වා පොලවය මෙයේ සිටි මෙර සුවාසූදහසක්යොදුන් පමණ සාගරයෙහි ගැලීසිටි සුවාසූදහසක් යොදුන් පමණ නැගීසිටි මහාමෙරු පර්වතය එම මහාමෙරුපර්වතයට අර්ධාර්ධ ප්‍රමාණයෙන් සමුද්‍රයෙහි ගැලී නැගී සිටි දෙව්‍යක්‍ෂවාස නානාවිධ රත්නයෙන් විචිත්‍රවූ යුගන්ධර ඊෂධර කරවීක සුදර්ශන නෙමින්ධර විනතකාදී සප්තකුල පර්වතයෝය පන්සියයක් යොදුන් පමණ උසඇති අගමින් විතරින් තුන් දහසක් යොදුන් පමණ සුදර්ශන චිත්‍රකූට කෛලාසකූට යනාදී සුවාසූ දහසක් කූටයෙන් ප්‍රතිමණ්ඩිතවූ හිමාලපර්වතය මෙම දඹදිවට සලකුණුවූ මුලසිට වෙලප පණස් යොදුන් පමණඇති එසේම පණස්පණස් යොදුන් පමණවූ පඤ්චමහා ශාඛාවන් ඇති සියක් යොදුන් පමණ විස්තාරොද්වෙධ ඇති සිසාරා තුන්සියයක් යොදුන් පමණඇති මහාජම්බුවෘක්‍ෂය දෙයසූදහසක් යොදුන් පමණ සාගරයෙහි ගැලීසිටි දෙයසූදහසක් යොදුන් පමණ නැගී සිටි සක්වළගලය අගමින් විතරින් උසින් එකුන්පණස් යොදුන් සඳමඩලය, එසේම සමපණස් යොදුන් හිරුමඩලය දශදහසක් යොදුන් පමණ ඇති සක්දෙව්රජහට නිවාසවූ තව්තිසාභවනය එසේම දශදහසක් යොදුන් පමණ ඇති අසුරභවනය හා අවීචිමහනරකය හා ජම්බුද්වීපය

සද්දහසක් යොදුන් පමණ ඇති අපර ගොයානය හා පූර්වවිදේහය, අට
දහසක් යොදුන් පමණඇති උතුරුකුරු දිවයිනය යන ක්ෂුද්‍රද්වීප පන්සිය
යක් පන්සියයක් පිරිවර කොට ඇති සතරමහාද්වීපය යනාදිවසයෙන් අන
න්තාපරියන්ත ලොකධාතුයයි කියනලද අතීන්ද්‍රිය ප්‍රතිබද්ධ රූපයන්ගේ
සමූහ සඞ්ඛ්‍යාත අවකාශ ලොකයද යනාමේ ත්‍රිවිධ ලොකයම සර්වප්‍රකාර
යෙන් අවබොධ කෙළේය යන මෙනෙක් කාරණයෙන්) ලොකවිදූනම්
වනසේක; සො–පෙ–ඉතිපි අනුත්තරෙ පුරිසදම්මසාරථි, (ඉමස්මිං ලො
කෙ පරස්මිං වා පන බුද්ධෙන සදිසො සසෙයා නවිජ්ජති" යනුහෙයින්
ශීල සමාධි ප්‍රඥා විමුක්ති විමුක්තිඥාන දර්ශනාදි ගුණවිශෙෂයෙන් ආත්ම
සදෘශාධිකපුද්ගලාන්තරයක්හු නැතිබැවින්ද දම්‍යයයිකියනලද අපලාල
නාගරාජ චූලොදරමහොදරාග්නි සිඛ ධූමසිඛ ධන පාලාදිවූ තිරශ්චීන
පුරුෂයන්ද සච්චක නිගන්ඨපුත්‍ර අම්බෂ්ඨමානවක පුෂ්කරසාති සොණ
දණ්ඩ කූටදන්ත ඝොටමුඛ උපාලි ගෘහපති ආදිවූ මනුෂ්‍ය පුරුෂයන්ද
ආලවක සූචිලොම ඛරලොම යක්ෂ ශක්‍රදෙවරාජ බකබ්‍රහ්මාදිවූ අමනුෂ්‍ය
පුරුෂයන්ද යන කායවාක් සමථාදියෙහි යෙදියයුතුවූ පුරුෂයන්ද සුදුසු
සුදුසු පරිද්දෙන් තදඞ්ගවිනයාදියෙහි පිහිටුවන හෙයින්ද යන මෙනෙක්
කාරණයෙන්) අනුත්තර පුරිසදම්මසාරථිනම් වනසේක; සො–පෙ–ඉතිපි
සත්ථාදෙවමනුස්සානං, (උත්කෘෂ්ට සත්ව භව්‍යපුද්ගල පරිච්ඡෙද වශයෙන්
දිව්‍ය මනුෂ්‍යයන්ට හා උපනිශ්‍රය සම්පත්තිප්‍රදානයෙන් තිර්යග්ගතයන්ටද
යථාර්හයෙන් ඓහිකාමුෂ්මික පරමපුරුෂාර්ථය යනමෙයින් අනුශාසනා
කරණහෙයින්ද චොර කාන්තාරාදියෙන් අතික්‍රමණය කොට නිරුපද්‍රව
ස්ථානයට පමුණුවන්නාවූ සාර්ථවාහයක්හු මෙන් ජාතිකාන්තාරාදියෙන්
සත්වයන් තරණය කොට නිර්වාණක්ෂෙමභූමියට පමුණුවන්නේය යන
මෙනෙක් කාරණයෙන්) ශාස්තෘනම් වනසේක; ඉතිපි බුද්ධො, (භූත
භවිෂ්‍යත් වර්තමාන ස්ථාවර ජඞ්ගම නිත්‍යානිත්‍යාදි සකලඥෙය මණ්ඩ
ලය කරතලාමලක ක්‍රමයෙන් අවබොධය කළහෙයින්ද නොහොත්
"සම්මාසම්බුද්ධ" පදයෙන් ප්‍රතිවෙධ ඥානානුභාවය ප්‍රකාශිත බැවින්ද
නානානය නිපුන අනෙකාධ්‍යාශයසමුත්ථානාර්ථව්‍යඤ්ජනසම්පන්න විවිධ
ප්‍රාතිහාර්යයෙන් යුක්ත සද්ධර්මදෙශනා ඥානානුභාවසමායොගයෙන්ද යන
මෙනෙක් කාරණයෙන්) බුද්ධනම් වනසේක; සො–පෙ–ඉතිපි භගවා,
(ලෞකිකලොකොත්තර හිතසුඛාභිනිර්වර්තක දානශීලාදි පාරප්‍රාප්තභාග්‍ය
යෙන් යුක්තබැවින්ද ලොභ ද්වෙෂ මොහ විපරීත මනස්කාරාදිවූ ක්ලෙශ
ශතසහස්‍රයන් හා සංක්ෂෙපයෙන් ක්ලෙශ ස්කන්ධාභිසංස්කාර මෘත්‍යුදෙව
පුත්‍ර මාරයන් භග්නයකළ හෙයින්ද ඓශ්වර්ය පුණ්‍යයශශ්‍රී සඞ්කල්පසිද්ධි
ප්‍රයත්නය යන ෂඩ්ගුණයෙන් පරිපූර්ණහෙයින්ද කුශලාදි ධර්මයන්
පඤ්චස්කන්ධ ද්වාදශායතනාෂ්ටාදශ ධාතු චතුස්සත්‍ය ද්වාවිංශතීන්ද්‍රිය ද්වාදශා
ඞ්ග ප්‍රතීත්‍ය සමුත්පාද චතුස්සමෘති ප්‍රස්ථාන සම්‍යක් ප්‍රධානාදි වශයෙන්

විභාගකළහෙයින්ද දිව්‍ය බ්‍රහ්මාර්‍යවිහාර කායචිත්තෝපධි විවේක ශූන්‍යතා ප්‍රණිහිතා නිමිත්ත විමොක්ෂ සමාභිඥාදිවූ ලෞකික ලොකොත්තර උත්තරිමනුෂ්‍යධර්මයන් භජනය කළහෙයින්ද කාම රූපාරූප සඞ්ඛ්‍යාත භවත්‍රයෙහි තෘෂ්ණාගමනය අභීත් මාර්ගඥානමුඛයෙන් වාන්තකළහෙයින්ද යන මෙතෙක් කාරණයෙන්) භගවත්නම් වනසේක.

සො, (යථොක්තවූ "අරහං සම්මා සම්බුද්ධො" යනාදී හෙතුඵල සන්තාපකාර වසයෙන් විභාවිත ගුණානුභාව ඇති) ඒ සර්වසත්වොත්තමවූ සර්වඥතෙම; සදෙවකං, (පරිසෙසන්‍යායෙන්) පඤ්චකාමාවචර දෙවියන් සහිතවූ; සමාරකං, (ප්‍රත්‍යාසත්තින්‍යායෙන් සවැනි) කාමාවචර දෙවියන් සහිතවූ; සබ්‍රහ්මකං, (බ්‍රහ්මකායිකාදී) බ්‍රහ්මයන් සහිතවූ; සස්සමණබ්‍රාහ්මණිං, (ශාසන ප්‍රතිපක්ෂ මහණ බමුණන් හා සමිත පාප බාහිතපාප ශ්‍රමණබ්‍රාහ්මණයන් සහිතවූ; සදෙවමනුස්සං, සංවෘති දෙවියන් හා පූර්වොක්ත ශ්‍රමණ බ්‍රාහ්මණයන් හැර අවශෙෂ මනුෂ්‍යයන් සහිතවූ; පජං, සත්ත්වලොකයද (යන); ඉමං ලොකං, ("සදෙවකං සමාරකං සබ්‍රහ්මකං" යන පදත්‍රයෙන් සඞ්ගෘහීතවූ අවකාශ ලොකයද "සස්සමණබ්‍රාහ්මණිං සදෙවමනුස්සං" යන පදද්වයෙන් සඞ්ගෘහීතවූ සත්ත්වලොකයද යන) මේ සියලු ලොකය; නොහොත් සදෙවකං, අරූපාවචර ලොකයන් සහිතවූ; සමාරකං, කාමාවචර දිව්‍යලොකයන් සහිතවූ; සබ්‍රහ්මකං, රූපී බ්‍රහ්ම ලොකයන් සහිතවූ; සස්සමණබ්‍රාහ්මණිං, ශ්‍රමණබ්‍රාහ්මණ පර්ෂත්සහිතවූ; සදෙව මනුස්සං, ක්ෂත්‍රිය ගෘහපති පර්ෂත් සහිතවූ; පජං, මේ චතුර්විධ පර්ෂත් සඞ්ඛ්‍යාතවූ ප්‍රජාවය, නොහොත්, පජං, (නාගගරුඩාදි වශයෙන්) අවශෙෂ ප්‍රජාවයයි කියනලද; ඉමං ලොකං, දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍යාදි වශයෙන් විභාග කළාවූ) මේ සියලු ලොකය; සයං අභිඤ්ඤාය, තමන්වහන්සේ විසින් පරොපදෙස රහිතවූ) විශිෂ්ටඥානයෙන් දැන; සච්ඡිකත්වා, අනුමානාපගම උපමානාපී ප්‍රත්‍ය අභාවසම්භවාදි ප්‍රමාණාන්තර සම්භාවයකින් නොවී අස්ඛලිත ප්‍රවෘත්තිගුණගති ඇතිවනබැවින් කෙවල ප්‍රත්‍යක්ෂ ප්‍රමාණයෙන් දැන; පවෙදෙති, ලොකයාහට ප්‍රකාශ කොට දක්වන්නේය; සො, ඒ ත්‍රෛධාතුක ස්වයම්භූඥානයෙන් දැන ලොවට ප්‍රකාශ කොට දක්වන්නාවූ) සර්වඥතෙම; ආදි කල්‍යාණං, පර්‍යාප්ති ධර්මයන් සර්වභාගයෙන් සුන්දර බැවින්ද එකගාථාවෙක්හි ප්‍රථමපාදවශයෙන්ද එකානුසන්ධික සූත්‍රයෙහි නිදානවශයෙන්ද නානානුසන්ධික සූත්‍රයෙහි ප්‍රථමානුසන්ධිවශයෙන්ද තමහට අර්ථභූතවූ ශීලයෙන්ද නොහොත් ශීල සමාධියෙන්ද සම්‍යක් සම්බුද්ධත්වයෙන්ද අභිසම්බොධිඥානයෙන්ද ශ්‍රොතෘපථොපගමනයෙන්ද ප්‍රභවශුද්ධියෙන්ද) ආදියෙහි ශොභනවූ; මජ්ඣෙ කල්‍යාණං, (ද්විතිය තෘතියපාදයෙන්ද නිදාන නිගමනයන්ගේ මධ්‍යයෙහිද සමථවිදර්ශනාමාර්ගඵලයෙන්ද (නොහොත්) විදර්ශනාමාර්ගයෙන්ද ධර්මසුධර්මත්වයෙන්ද ප්‍රත්‍යෙකබොධිඥානයෙන්ද ප්‍රතිපත්තියෙන්ද අර්ථශුද්ධියෙන්ද

මධ්‍යයෙහි ශොභනවූ; පරියොසානකල්‍යාණං, (පශ්චිම පාදයෙන්ද නිගමනයෙන්ද නිර්වාණයෙන්ද සඞ්ඝසුප්‍රතිපත්තියෙන්ද ශ්‍රාවක බොධිඥානයෙන්ද ප්‍රතිපත්ති ඵලකෘත්‍ය ශුද්ධියෙන්ද)අවශානයෙහි ශොභනවූ; ධම්මං, සියලු ත්‍රිපිටක පර්‍ය්‍යාප්ති)ධර්මය; දෙසෙති,(වෛනෙජනයන්කෙරෙහි කරුණාවෙන් ඵලසමාපත්තිසුඛය හැර උද්ඝටිත ඥයන්ට සංක්‍ෂෙපකොටද විපඤ්චිතඥෙය්‍යාදීන්ට විස්තරකොටද මධුමදමුදිත ලලිත රතිකර මනොහර කුරවීකනාද නිර්විශෙෂාෂ්ටාඞ්ග සමුපෙත බ්‍රහ්මස්වරවිනිද්‍රුවා සර්වසත්ව ස්වකීය භාෂානුරාග ශ්‍රවණීය මධුරවචනයෙන්) මෙසේ දෙශනාකරන්නේය; සාත්ථං, (මේ ශාසනධර්මය ප්‍රකාශකරන්නේ අනෛර්‍ය්‍යාණිකාර්ථරහිත අනාපාන සත්පුරුෂ වර්ණනාවන් හැර සමෘති ප්‍රස්ථානාදි නිශ්‍රිත දෙශනාව පවත්වන හෙයින්) අර්ථ සම්පන්නවූ; සව්‍යඤ්ජනං, (ද්‍රවිඩකිරාත වනපර්ෂිකාදි භාෂාවන් මෙන් එක විප්‍රකාර ව්‍යඤ්ජන මාත්‍රයක් නොවී සිථිලධනිතාදිවූ දශවිධ ව්‍යඤ්ජනයෙන් සම්පූර්ණබැවින් ව්‍යඤ්ජන සම්පූර්ණවූ; නොහොත් සාත්ථං, මහාශ්‍රාවක කාත්‍යායන මහාස්ථවිර භාෂිතවූ නෛරුක්තික ක්‍රමයෙන් සංකාසන ප්‍රකාශන විවරණ විභජන උත්තානිකරණ ප්‍රඥප්ත්‍යර්ථ පදසමායොගයෙන් අර්ථගම්භීර ප්‍රතිවෙධ ගම්භීරයෙන්) සාර්ථවූ; සව්‍යඤ්ජනං, (අක්‍ෂර පද ව්‍යඤ්ජනාකාර නිරුක්ති නිර්දෙශයෙන් ව්‍යඤ්ජනසම්පූර්ණවූ; කෙවල පරිපූර්ණං, (ප්‍රක්‍ෂෙප අනුක්තව්‍යවදනාර්ථයක් නැතිබැවින් සර්වභාගයෙන්) සම්පූර්ණවූ; පරිසුද්ධං, (පරිත්‍යජ්‍ය සංක්ලෙශ ධර්මයක්හුගේ අභාවයෙන් නිර්දොෂ බැවින්) පරිශුද්ධවූ; බ්‍රහ්මචරියං, ශික්‍ෂාත්‍රය සඞ්ගෘහිතවූ සකල ශාසනමාර්ග) බ්‍රහ්මචර්‍ය්‍යාව; පකාසෙති, ප්‍රකාශ කරන්නේය; නොහොත් සාත්ථං, ශීලවිශුද්ධ්‍යාදී සම්‍යක් ප්‍රතිපත්ති නිමිත්තවූ සත්‍ය ප්‍රතිවෙධය හෙතුකොටගෙන අධිගම චෛත්‍යසත්භාවය වනහෙයින් කපිලකනචර මානාදිය මෙන් තුච්ඡ නිරර්ථක නොවී අර්ථසම්පන්නවීමෙන්) සාර්ථවූ; සව්‍යඤ්ජනං, දුරධ්‍යාත ධර්මයෙහි අභියොග කරන්නාහට මෙන් ව්‍යාමොහ නූපදවා පර්‍ය්‍යාප්ති ධර්ම පරිචය හෙතුකොටගෙණ බහුශ්‍රැත්‍ය චෛත්‍යසත්භාවය වනහෙයින් ව්‍යඤ්ජනසම්පත්තියෙන්) සව්‍යඤ්ජනවූ; කෙවලපරිපූර්ණං, ශීලසමාධි ප්‍රඥාදිප්‍රභෙද ධර්මාඞ්ගසමාගමයෙන් සමන්නාගත බැවින්) පරිපූර්ණවූ; පරිසුද්ධං, (දෘෂ්ටිමානාද්‍යුපක්ලෙශාභාව වෘත්තදුඃඛ නිස්සරණ ප්‍රවෘත්ත ලොකාමිස නිරපෙක්‍ෂත්වාදී හෙතුවෙන්) අත්‍යන්ත නිර්මලවූ; බ්‍රහ්මචරියං, ශ්‍රෙෂ්ඨාර්ථයෙන්වාච්‍යවූ බුද්ධශ්‍රාවකයන්ගේ චර්‍ය්‍යාවයයි කියනලද ශාසනමාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව; පකාසෙති, (නානානය සමුපෙත කොට ප්‍රකාශ කරන්නේයයි; (යන) කිත්තිසද්දො, ඒ ඒ තන්හි ගුණකථනවසයෙන් ප්‍රවෘත්තිතවූ ස්තුතිඝොෂාවෙක්; අබ්භුග්ගතො, (සමස්තසත්වලොකය අභිභවනය කොට) ඉතා උස්ව පැවැත්තේය; තථා රූපානං, (තාදෘශ යථාභූත ස්වභාව ගුණාධි

ගමයෙන් චතුස්ප්‍රමාණිකවූ ලොකයා හට හැමකල්හිම) ප්‍රසාදවහවූ; අර හතං, අභිත් ශබ්දයෙන් ප්‍රසිඬ නිහතකෙලශවූ) පූජ්‍යයන්ගේ; දස්සනං, සෙනහරසයෙන් කඬලිතවූ ප්‍රීතිභරිත ලොචන යුග්මය උන්මීලනය කොට) දර්ශනමාත්‍රයකුදු; සාධු ඛො පන හොතීති, දෘෂ්ටධාර්මික සාම්පරායික පරමාර්ථ සංඥිතවූ හිතසුඛය එලවනහෙයින් ශොභනාවන්නේයයි (යන මෙබඳුවූ ආධ්‍යාශයක් ඇතිව නොහොත්) සාධු ඛො පන හොන්ති අර්වත සිතවහවන්නේයයි (සිතුවාහුය).

අථ ඛො, මෙසේ සිතා ඉක්බිත්තෙන්; වෙරඤ්ජකා, වෙරඤ්ජා නම් නුවර වාසීවූ; බ්‍රාහ්මණගහපතිකා, බමුණන් හා ගොවීහු; භගවා, (සත පුණ්‍යලක්ෂණ ධරත්වාදී ගුණගණාලංකෘත) භාග්‍යවත්හෙම; යෙන, යම් තැනෙක්හිද; තෙන, එතැන්හි; උපසඞ්කමිංසු, එළඹියාහුය; නොහොත් භගවා, අපරිමිත නිරූපම ප්‍රභව ශීලසමාධ්‍යාදී ගුණවිශෙෂ සමන්විතව යෙන් භගවත්නාමවූ) සර්වඥයන්වහන්සේ; යෙන, යම්සේ (නානාප්‍රකාර ගුණ විශෙෂාධිගමයක් හෙතුකොට ගෙණ මධුරඵල රසාස්වාදය පිණිස කීර කොකිල ශාරිකාදී පක්ෂිසමූහයා විසින් නිත්‍ය ඵලභරිත මහාවෘක්ෂ යක්මෙන් දිව්‍යමනුෂ්‍යයන් විසින්) එළඹිය යුතුවේද; තෙන, ඒකාරණ යෙන්; උපසංකමිංසු, (නමා නුන්නැතින් නික්ම තත්තත් මාර්ග ප්‍රදෙශාතික්‍රමනය කොට) සමීපස්ථව ගියාහුය; උපසංකමිත්වා, උපසංකමණ ක්‍රියාව අවසන් කොට නොහොත් යම්තැනකට ගියාහුද ඒ උපගතස්ථාන යෙන් ප්‍රශ්න විචාරණ ධර්මශ්‍රවණාදී කාර්‍ය්‍යයට යොග්‍යවූ ආසන්නතර ස්ථානයකට) එළඹ; අප්පෙකච්චෙ, එසේ එළඹියවුන් අතුරෙන් බුඞාදී රත්නත්‍රයෙහි අචලශ්‍රඬාවෙන්යුක්ත) සමහර බ්‍රාහ්මණගෘහපති කෙනෙක් භගවන්තං, භාග්‍යවතුන්වහන්සේට; අභිවාදෙත්වා, පඤ්චාඞ්ග ප්‍රතිෂ්ඨිතව නමස්කාර කොට; එකමන්තං නිසීදිංසු, එකත්පස්ව හුන්නාහුය; අප්පෙකච්චෙ, (පිළිසඳර කථාවෙහි දක්ෂවූ) සමහර බ්‍රාහ්මණගෘහපති කෙනෙක් භගවතාසද්ධිං, ඓශ්චර්‍ය්‍ය පුණ්‍ය යශශ්‍රීසංකල්පසිඬිප්‍රයත්නය යන ෂාඞ්ගුණ්‍ය පරිපූර්ණත්වයෙන් පරමොත්කෘෂ්ටයට පැමිණි භාග්‍යවතුන්වහන්සේ හා සමග; සම්මොදිංසු, ("කච්චි තෙ ගහපතයො ඛමණීයං කච්චියාපණීයං" යනාදීන් විචාර වදාළ පූර්ව භාෂණයට අනුකාරීව ඔවුහුද "කච්චි භෝ ගොතම ඛමණීයං කච්චියාපණීයං" යනාදී කුශල ප්‍රශ්න ව්‍යාකරණයෙන් උෂ්ණොදකයහා ශීතොදකය මෙන්) සම්මොදනක්‍රියාවෙන් සමාන රූපත්වයට පැමිණියාහුය, හෙවත් ප්‍රියකථා කළාහුය; සම්මොදනීයං, ප්‍රීතිප්‍රමොද්‍ය ජනනය කරන්නාවූ හෙවත් සමග සතුටු වියයුතුවූ; සාරාණීයං, ශබ්දාර්ථ මධුරත්වයෙන් කළ ක්‍රියාවන් පවත්වන්ට සුදුසුවූ හෙවත් නැවතනැවත සිහිකටයුතුවූ; කථං, (අපාතමධුර විමර්ද රමණීයාදී වචන චාතුර්‍ය්‍යාදීන් යුක්තවූ) කථාව; වීතිසාරෙත්වා, නිට්ඨා සමාප්ත කොට; එකමන්තං නිසීදිංසු; එකත්පස්ව උන්නාහුය; අප්පෙ

ක්වෙච්, සමහර (උභයපාක්ෂිකවූ) බ්‍රාහ්මණගෘහපතී කෙනෙක්; භගවා, භග්නකරණලද රාගාද්‍යරීයෙන්) භගවත් නම්වූ සර්වඥයන්වහන්සේ; යෙන, යම්දිශාභාගයෙක් හිඳ; තෙන, ඒදිශාභාගයට, අඤ්ජලිම්පනාමෙත්වා; දසනඛ සමොධානයෙන් යුක්තවූ හස්තපුටමස්තකයෙහි තබා නමස්කාර කොට; එකමන්තං නිසීදිංසු, එකත්පස්ව හුන්නාහුය; අප්පෙකච්චෙ, සමහර (දරිද්‍ර බ්‍රාහ්මණ ගෘහපති කෙනෙක්;) භගවතො සන්තිකෙ, (කුශලාදි ධර්මයන් විභාගකළ හෙයින් භගවත්නම්වූ) සර්වඥයන්වහන්සේගේ සමීපයෙහි; නාමගොත්තං සාවෙත්වා, (මහත් පක්ෂීන් මධ්‍යයෙහි නම් ගොත් කීමෙන් ප්‍රසිද්ධවම්හ යන ලාමකාධ්‍යාශයෙන් යුක්තබැවින් අපි කාත්‍යායන ගොත්‍රයම්හ අපි කාශ්‍යප ගොත්‍රයම්හ යනාදීන් තමන්ගේ) නාමගොත්‍රයන් අසවා; එකමන්තං නිසීදිංසු, එකත් පස්ව හුන්නාහුය; අප්පෙකච්චෙ, සමහර (කෛරාටික බ්‍රාහ්මණගෘහපති) කෙනෙක්; තුණ්හීභූතා, තුෂ්ණීම්භූතවූවාහු මෙන් (මුවෙන් බිඳුවහොත් විශ්වාස වියයුතුවේ විශ්වාසවුවහොත් දන් දියයුතුවේ දන් දුනහොත් වස්තුව ක්ෂයභාවයට යෙයි මුවෙන් නොබැන උන්කල්හි මේ සියල්ල නොවන්නේය යන මෙබඳු ලාමකාධ්‍යාශ ඇති බැවින්) මුවෙන් නොබැනම; එකමන්තං නිසීදිංසු, එකත්පස්ව හුන්නාහුය; එකමන්තං නිසින්නා ඛො, එකත්පස්ව හුන්නාවූ; වෙරඤ්ජකා, වෙරඤ්ජා නම් නුවර වාසීවූ; බ්‍රාහ්මණගහපතිකා, බ්‍රාහ්මණගෘහපතීහු; භගවන්තං, (ශීලසමාධ්‍යාදී සර්ව ධර්මයන් සර්වාකාරයෙන් විභාග කොට දත්තාවූ සර්වඥයන් වහන්සේට; එතදවොචුං, (කොනුඛො භො ගොතම හෙතු කො පච්චයො, යනාදී මේ මතු කියනලද පරිද්දෙන් අපි විචාළාහුය.

භො ගොතම, භවත් ගෞතම ගොත්‍ර ඇති සර්වඥරත්නයාණන් වහන්ස; යෙන, යමක් හෙතු කොට ගෙන; ඉධ, මේ ලොකයෙහි; එකච්චෙ සත්තා, සමහර සත්ත්වකෙනෙක්; කායස්ස භෙදා, ශරීරභෙදයෙන්; පරම්මරණා, චුති චිත්තයෙන් මත්තෙහි; අපායං, අයසංඛ්‍යාත සැපයෙන් පහවූහෙයින් අපාය නම්වූ; දුග්ගතිං, (කායිකමානසික දුඃඛදෞර්මනස්‍ය සම්භාරණහෙයින්) දුර්ගති නම්වූ; විනිපාතං, (විවශව පතිතවනාවීයෙන් විනිපාතනම්වූ; නිරයං, (ආස්වාදමාත්‍රයකුත් නැති හෙයින්) නිරයනම්වූ; (සතර අපායෙහි) උපපජ්ජන්ති, උපදනාහුය; කොනු ඛො හෙතු, (එසේ අපායාදියෙහි ඉපදීමට) හෙතු කවරේද; කො පච්චයො, ඊට ප්‍රත්‍යයකවරේද; භො ගොතම, භවත් ගෞතම ගොත්‍ර ඇති භාග්‍යවතුන් වහන්ස; යෙන, යමක් හෙතුකොට ගෙන; ඉධ, මේ ලොකයෙහි; එකච්චෙ සත්තා, සමහර සත්ත්වකෙනෙක්; කායස්ස භෙදා, කරජකායයාගේ භෙදයෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; සුගතිං, (ශොභනගති ඇතිහෙයින්) සුගතිනම්වූ; සග්ගං, (සියලු පඤ්චකාම සම්පත්තියෙන් සුෂ්ඨු අග්‍රහෙයින්)

ස්වර්ගනම්වූ; ලොකං, දිව්‍යලොකයෙහි; උපපජ්ජන්ති, උපදනාහුය; කො නු ඛො හෙතු, ඊට හෙතු කවරේද; කො පච්චයො, ඊට ප්‍රත්‍යය කවරේ දැයි (යන) එතං, මේ වචනය; අවොචුං, දැන්වූවාහුය.

ගහපතයො, එම්බා ගෘහපතීනි; අධම්මචරියා විසමචරියා හෙතු ඛො, අධර්මචර්‍ය්‍යාවයයි කියනලද විෂමක්‍රියාව හෙතුකොටගෙන; එවං, මෙසේ; ඉධ, මේ ලොකයෙහි; එකච්චෙ සත්තා, සමහර (අඥාන) සත්ත්වකෙනෙක්; කායස්ස භෙදා, කරජකායයාගේ භෙදයෙන්; පරම්මරණා, මරණින්මත් තෙහි; අපායං–පෙ–උපපජ්ජන්ති, උපදනාහුය; ගහපතයො, පින්වත්ගෘහපතීනි; ධම්මචරියා සමචරියා හෙතු ඛො, ධර්මචර්‍ය්‍යාවයයි කියනලද සම ක්‍රියාව හෙතුකොට ගෙන; එවං, මෙසේ; ඉධ, මේ ලොකයෙහි; එක ච්චෙ සත්තා–පෙ–උපපජ්ජන්ති, උපදනාහුයයි ඔවුන්ගේ මානානිග්‍රහ පිණි ස සංක්ෂෙපයෙන් විසඳුවදාළසේක.

ඉක්බිති අඹයෙකුගේ අභිමුඛයෙහි සත්රුවනක් තුබූකල ගත නො හෙන්නාගේ බුදුන්වදාළ පාඨයෙහි අර්ථ දැනගත නොහී නිහතමානීව විස්තරදෙශනාව පිණිස යාච්ඤාකරන්නාහු "න ඛො මයං" යනාදී පාඨපදනීය කීහු.

මයං, අපි; භො ගොතමස්ස, භවත් ගෞතම ගොත්‍ර ඇති සර්වඥයා සම්බන්ධිවූ (නොහොත්) භවත් ගෞතමගොත්‍රඇති සර්වඥරාජොත්තමයා ණන්වහන්සේ විසින්; සංඛිත්තෙන භාසිතස්ස, සංක්ෂෙපයෙන් වදාරණ ලද්දාවූ; විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස, විස්තරවසයෙන් අර්ථය විභාග නොකරණලද්දාවූ; ඉමස්ස, (ධම්මචරියා සමචරියා හෙතු ඛො ගහපතයො, යනාදි) මේපාඨයාගේ; අත්ථං, වචනාර්ථය; විත්ථාරෙන, විස්තර වස යෙන්; න ඛො ආජානාම, නොම දැනගණුම්හ; භවත් තත්වූපරිද්දෙන් නොදන්නුම්හ (එහෙයින්) මයං, අපි; භො ගොතමස්ස, භවත් ගෞතම ගොත්‍ර ඇති සර්වඥරාජොත්තමයාණන්වහන්සේ විසින්; සංඛිත්තෙන භාසි තස්ස, සංක්ෂෙපයෙන් දෙශනාකරනලද්දාවූ; විත්ථාරෙණ, විස්තර වශ යෙන්; අත්ථං අවිභත්තස්ස, අර්ථවිභාග නොකරණලද්දාවූ; ඉමස්ස, මේ පාඨයාගේ; අත්ථං, අර්ථය; විත්ථාරෙණ, විස්තරවශයෙන්; මයං, අපි; යථා, යම්ප්‍රකාරයකින්; ආජානෙය්‍යාම, (තත්වූ පරිද්දෙන්) දැනගණුමෝද; තථා, එපරිද්දෙන්; භවං ගොතමො, භවත් ගෞතම ගොත්‍ර ඇති සර් වඥයන්වහන්සේ; නො, අපට; ධම්මං, (නුඹවහන්සේගේ පාලි) ධර්මය; දෙසෙතු, දෙසනා කළසේක් වීනම්; සාධූති, යහපත්වන්නේයයි කියා යාච්ඤා කළාහුය.

එසේ යාච්ඤාකළකල්හි ඔවුන් මනොරථ පූර්ණය කෙරෙමින් අනන්‍ය සාධාරණවූ සර්වඥප්‍රවාරණයෙන් පවරණසේක් "තෙනහි ගහපතයො සුණාථ සාධුකං මනසිකරොථ භාසිස්සාමීති" යනාදි පාඨපදනීය වදාළසේක.

තෙනාහි, එසේවීනම් හෙවත් තෙපි මේ වචනයාගේ අර්‍ථය මා අතින් විස්තරවශයෙන් අසනු කැමැත්තාහු වීනම්; ගහපතයො, ගෘහපතීනි; සුණාථ, අසව්; සාධුකං මනසි කරොථ, මාගේ වචනාර්‍ථයද අර්‍ථ ගම්භීර ප්‍රතිවේධගම්භීරත්වයෙන් යුක්ත වනබැවින් සුවර්ණ භාජනයෙක්හි නික්ෂිප්ත සිංහතෛලයක් මෙන් තොපගේ මනොද්වාර විඥානවීථින් අර්‍ථය මනාකොට අසා ධරගණුව; භාසිස්සාමීති, (විස්තරවශයෙන්) දෙශනා කරමි කියා; (අනන්‍ය සාධාරණොත්තමප්‍රවර සර්‍වඥප්‍රවාරණයෙන් පවරා වදාළසේක). එවං භොතිබො, එසේය පින්වතුන්වහන්සැයි කියා; වෙරඤ්ජකා, වෙරඤ්ජානම් නුවර වාසීවූ; බ්‍රාහ්මණගහපතිකා, බ්‍රාහ්මණගෘහපතීහු; භගවතො, අපරිමිත විවිධ ගුණගණාධාර භාග්‍යවතුන් වහන්සේට; පච්චස්සොසුං, ප්‍රතිවචන දුන්නාහුය; නොහොත් භාග්‍යවතුන්වහන්සේගේ වචනය ආදර ඇතිව පිළිගත්තාහුය; භගවා, විපුලතර භාග්‍යයෙන් යුක්ත බුදුරජාණන්වහන්සේ; එතං, මේ වක්ෂ්‍යමාන වචනය; අවොච, වදාළසේක.

ගහපතයො, පින්වත්වූ ගෘහපතීනි; කායෙන, කායද්වාරයෙන් සිඳුවන්නාවූ; අධම්මචරියා විසමචරියා, අධර්‍මචර්‍ය්‍යාවයයි කියනලද විසම දුශ්චරිත ක්‍රියා තොම; තිවිධං හොති, ත්‍රිවිධ වන්නේය හෙවත් තුන් කොටසෙක් වන්නේය; වාචාය, වාග්ද්වාරයෙන් සිඳුවන්නාවූ; අධම්මචරියා විසම චරියා, අධර්‍මචර්‍ය්‍යාවයයි කියනලද විසමවූ දුශ්චරිත ක්‍රියා තොම; චතුබ්බිධං හොති, චතුර්විධ වන්නේය; හෙවත් සතර කොටසෙක් වන්නේය; මනසා, මනොද්වාරයෙන් සිඳුවන්නාවූ; අධම්මචරියා විසමචරියා, අධර්‍මචර්‍ය්‍යාවයයි කියන ලද විසමවූ අකුසලක්‍රියා තොම; තිවිධං හොති, ත්‍රිවිධ වන්නේය; ගහපතයො, ගෘහපතීනි; කායෙන, කයින් සිඳුවන්නාවූ; අධම්මචරියා විසමචරියා, අධර්‍මචර්‍ය්‍යාවයයි කියනලද විසම ක්‍රියා තොම; කථංච තිවිධං හොති, කවර ප්‍රකාරයකින් තුන් කොටසක් වේද? ගහපතයො, ගෘහපතීනි; ඉධ, මේ ලොකයෙහි; එකච්චො, සමහර අඥාන සත්ත්වයෙක් තෙම; ලුද්දො, රෞද්‍ර වූයේ; ලොහිතපාණි, නිරන්තරයෙන් සත්ත්වඝාතනය හෙතුකොටගෙන ලෙහෙ වැකුනු අත් ඇත්තේ; හතපහතෙ නිවිට්ඨො, විශෙෂයෙන් ප්‍රාණවධ කිරීමෙහි පිහිටි සිත් ඇත්තේ; පාණභූතෙසු, සකල ප්‍රාණීන් විෂයෙහි; අදයාපන්නො, නිෂ්කරුණාවට පැමිණි සිත්ඇතිව; පාණාතිපාතී හොති, සතුන් මැරීම ස්වභාව කොට ඇත්තේය; මේ කායද්වාරයෙන් සිඳුවනා එක් දුශ්චරිත කොට්ඨාශයෙක් වන්නේය.

අදින්නාදායී ඛො පන හොති, වස්තුස්වාමීහු විසින් කයින් වචසින් නුදුන් වස්තුව ගැන්ම ස්වභා කොට ඇත්තේ වනාහි; පරස්ස, අනුන් සන්තකවූ; පරවිත්තූපකරණං, අනුන්ගේ තුෂ්ටි ජනනය කරන්නාවූ;

යං, හිරඤ්ඤසුවණ්ණමුක්තාමණිකාදී යම්කිසි වස්තුවක් ඇද්ද; තං, ඒ වස්තුව; ගාමගතං වා, ග්‍රාමස්ථවූ හෝ හෙවත් ඇතුළු ගම්හි තබනලද්දාවූ හෝ; අරඤ්ඤගතං වා, අරණ්‍යයෙහි තබනලද්දාවූ හෝ හෙවත් වෘක්ෂ පර්වත පුෂ්කරණී ආශ්‍රය කොට තබනලද්දාවූ හෝ; තං, ඒ වස්තුව; ථෙය්‍ය සඞ්ඛාතං, ථෙය්‍යයයි කියනලද සොරසිත් කොට්ඨාසය හේතුකොටගෙන; ආදාතා හොති, ග්‍රහණයකිරීම ස්වභාව කොට ඇත්තේය; මේ කයින් සිදුවන දෙවෙනිවූ දුශ්චරිත කොට්ඨාශයෙක් වන්නේය.

කාමේසු මිච්ඡාචාරී ඛො පන හොති, අගමනීයස්ථාන ව්‍යතික්‍රමණ යයි කියනලද කාමමිථ්‍යාචාරයෙහි හැසිරෙන්නේ වේද; යානා, යම් ස්ත්‍රීයක් තොම; මාතුරක්ඛිතා, (ජනකවූ පියාණන් පරලොව ගියකල්හි අසනවසනප්‍රදානය කිරීමෙන් පරකුලයකට දෙනු පිණිස) මෑනියන් විසින් රක්ෂාකරණලද්දීද; පිතුරක්ඛිතා, (එසේම මෑනියන් පරලොක ප්‍රාප්තවූ කල්හි) පියාණන් විසින් රක්ෂාකරණලද්දීද; මාතාපිතු රක්ඛිතා, මවුපිය දෙදෙනා විසින් රක්ෂාකරණලද්දීද; භාතු රක්ඛිතා, (එසේම) බැයා විසින් රක්ෂාකරණලද්දීද; භගිණිරක්ඛිතා, බුහුනානිය විසින් රක්ෂා කරණලද්දීද; ඤාතිරක්ඛිතා, (මාතෘපිතෘ යන උභය පක්ෂයෙහිවූ) නෑ කෙනෙකුන් විසින් රක්ෂාකරණ ලද්දීද; සස්සාමිකා, සමාන කුලයක් විසින් මව්කුස උපන් කලම ඔවුනොවුන් හා කනිකා කොට විවාහය පිණිස නියමකරණලද හෙයින් සස්සාමික තැනැත්තීද; සපරිදණ්ඩා, යමෙක් මෙනම් නැනැත්තිය සමීපයට ගියේ වීනම් ඕහට මෙපමන දඩයයි රජ්දරුවන් විසින් දඩ නියම කොට තබනලද හෙයින් දණ්ඩ නිග්‍රහ සහිත නැනැත්තීද; අන්තමසො, අධමාන්තයෙන් හෙවත් යටත් පිරිසෙයින්; මාලාගුණපරික්ඛිත්තාපි, යම් කිසි පුරුෂයකු විසින් මේ ස්ත්‍රීතොම මට භාර්‍ය්‍යාවන්නේයයි කියා යම්කිසි මල්දමක් පමනාකුදු පලඳවා තමනට නියමකරණලද තැනැත්තීද යන; තථාරූපාසු, එබඳු ස්ත්‍රීන් කෙරෙහි; චාරිත්තං, මෛථුනසෙවනයයි කියනලද ව්‍යතික්‍රමන යට; ආපජ්ජිතා හොති, පැමිණෙන්නේය; මේ තුන්වැනිවූ දුශ්චරිත කොට්ඨාශයෙක් නම් වන්නේය.

ගහපතයො, එම්බා පින්වත්වූ බ්‍රාහ්මණ ගෘහපතීනි; කායෙන, කාය ද්වාරයෙන් සිදුවන්නාවූ; අධම්මචරියා විසමචරියා, අධර්මචර්‍ය්‍යාවයයි කියනලද විෂමවූ දුශ්චරිත ක්‍රියා තොම; එවං ඛො, මේ ප්‍රකාරයෙන් වනාහි; තිවිධං හොති, තුන් කොටසෙක් වන්නේයයි වදාළසේක.

ගහපතයො, පින්වත් ගෘහපතීනි; වාචාය, වාග්ද්වාරයෙන් සිදුවන් නාවූ; අධම්මචරියා විසම චරියා, අධර්මචර්‍ය්‍යාවයයි කියනලද විෂමවූ අකුසලක්‍රියා තොම; කථං චතුබ්බිධං හොති, කෙසේ සතර කොටසෙක් වේද? ගහපතයො, එම්බා ගෘහපතීනි; ඉධ, මේසත්වලොකයෙහි; එකච්චො,

සමහර සත්ව කෙනෙක් තෙම; මුසාවාදී හොති, වාක්සංයම රහිත බැවින් බොරුකියනසුළුවූයේද; සභාගතො වා, යුක්තිබණන්නාවූ විනිශ්චයසභාවකට පැමිනියේ හෝ; පරිසගතො වා, පිරිස්මැදට ගියේ හෝ; ඤාතිමජ්ඣගතො වා, නෑයන්ගේ දයාදනිසා උපන් යුක්ති විනිශ්චයස්ථානයට පැමිනියේ හෝ; පූගමජ්ඣගතො වා, සෙනාවගේ මධ්‍යයට පැමිනියේ හෝ; රාජකුලමජ්ඣගතො වා, රජහුගේ වාස භවනයෙහිදී රජහු සම්මුඛව කියනලද විනිශ්චයස්ථානයට පැමිනියේ හෝ; අභිනීතො, සමීපයට පමුනුවන ලදුව; අම්භො පුරිස, එම්බා පුරුෂය; යං ජානාසි, තෝ යමක් දන්නෙහි වීනම්; තං වදෙහීති, ඒ තෝ දන්නා දෙය කියවයි කියා; සක්ඛිපුට්ඨො, සාක්ෂි කොට විචාරණලද්දේ; සො, ඒ පුද්ගලතෙම; අජානං වා, නොදන්නා දෙය හෝ; ජානාමීති, දනිමි කියා; ආහ, කියන්නේය; ජානං වා, දන්නා දෙය හෝ; නජානාමීති, නොදනිමි යි; ආහ, කියන්නේය; අපස්සංවා, තමා ඇසින්නුදුටු දෙය හෝ; පස්සාමීති, දිටිමි කියා; ආහ, කියන්නේය; පස්සං වා, දුටු දෙය හෝ, නපස්සාමීති, නුදුටිමි කියා; ආහ, කියන්නේය; ඉති, මෙසේ; අත්තහෙතුවා, තමාගේ හස්තපාදදී අඞ්ගප්‍රත්‍යඞ්ගයන් හෙතු කොටගෙන හෝ; පරහෙතු වා, තමාගේ බන්ධුවර්ගාදීන්ගේ අඞ්ග ජීවිත වස්තූන් හෙතුකොට ගෙන හෝ; ආමිස කිංචික්ඛහෙතු වා, අත්ලස් වශයෙන් තමහට දෙනලද තිත්තිර වට්ටක ස්නානපිණ්ඩාදී යම්කිසි වස්තුවක් හෙතුකොටගෙන හෝ; සම්පජාන මුසාභාසිතා හොති, දැන දැන බොරු කියන්නේය; මේ වාග්වාරයෙන් සිද්ධවන පළමුවන දුශ්චරිත කොට්ඨාශ නම් වන්නේය.

පිසුණා වාචො ඛො පන හොති, ප්‍රසිශූන්‍ය වචනයන් කීම ස්වභාව කොට ඇත්තේ වේද; සො, හෙතෙම; ඉතො සුත්වා, මෙතනින් යමක් අසා; ඉමෙ සංභෙදාය, මොවුන්ගේ භෙදය පිණිස; අමුත්‍ර අක්ඛාතා, එතැන්හි කියන සුලුවූ; අමුත්‍ර වා සුත්වා, එතනින් යම් කිසිවක් අසා; අමූසංභෙදාය, ඔවුන්ගේ භෙදය පිණිස; ඉමෙසං, මොවුන්ට; අක්ඛාතා, කියනසුලුය; ඉති, මෙසේ; සමග්ගානං වා, සමගිවූවන් සම්බන්ධව හෝ; භෙත්තා, භෙදකරණසුළුය, භින්නානං වා, භින්නවූවන් සම්බන්ධව හෝ; අනුප්පදාතා, භෙදයට අනුබලදෙන සුලුය; වග්ගාරාමො, වගීවූවාහු යම්තැනෙක්හිවෙසෙද්ද එතැන්හි ඇලුම් ඇත්තේය; වග්ගරතො, වගිවූවන් කෙරෙහි අභිරති ඇත්තේය; වග්ගනන්දී, වගීවූවන් අසාත් දැකත් සතුටුවන සුළුය; වග්ගකරණිං වාචම්භාසිතා හොති, යම් වචනයක් කීකල සත්වයන් වගීකෙරේද ඒ භෙදකරණ වචනයන් කියන සුළු වේ. මේ වාග්වාරයෙන් සිද්ධවන්නාවූ දෙවෙනි දුශ්චරිත කොට්ඨාසය වන්නේය.

ඵරුසාවාචො ඛො පන හොති, අනුන්ගේ කර්ණයට නොමිහිරිවූ ඵරුෂවචන කීම ස්වභාව කොට ඇත්තේ වේද; යාසාවාචා, යම් වචනයෙක්; අණ්ඩකා, යම්සේ සදෙසක වෘක්ෂයෙක්හි අණ්ඩකයෝ පහලවෙද්ද එපරිද්දෙන් බුංසනවම්භනකාදී වචනයන් කියන්නාවූ; කක්කසා, යම්සේ පූතික වෘක්ෂයෙක්හි කර්කශවීමෙන් වැහෙනාලද චූර්ණීයන් ඇතිවේද එබඳුවූ කර්කශවචනයන් කියන්නාවූ; පරකටුකා, මෙරමාහට අමනාප මෙශ උපදවන්නාවූ පරාභිසජ්ජනි, කුටිලකණ්ටක ශාඛාවක් මෙන් මෙරමා හට මර්මච්ඡේදක වචනයන් කියන්නාවූ; කොධසාමන්තා, ක්‍රෝධයට ආසන්නවූ; අසමාධි සංවත්තනිකා, අර්පණා සමාධි උපචාර සමාධි පිණිස නොපවත්නාවූ; තථාරූපිං වාචම්භාසිතා හොති, එබඳු වචනයන් කියනසුළු වන්නේය. මේ වාග්ද්වාරයෙන් සිඩවන තුන් වන දුශ්චරිත කොට්ඨාසය වන්නේය.

සම්ඵප්පලාපි ඛො පන හොති, නිෂ්පලවූ සම්ප්‍රලාපවචනයන් කියන්නේ වනාහි; අකාලවාදී, කල්නොදන කියනසුළුය; අභූතවාදී, අවිද්‍යමාන වචනයන් කියනසුළුය; අනත්ථවාදී, අනර්ථ නිශ්‍රිත වචනයන් කියන සුළුය; අධම්මවාදී, අසභාව තෙපුල් කියන්නාවූ; අවිනයවාදී, සංවර විනය ප්‍රතිසංයුක්ත නොවන වචනයන් කියනසුළුය; අකාලෙන, කියයුතුකලට පූර්වයෙහිහෝ පසුව හෝ නුසුදුසුකල්හි කියන්නාවූ; අනපදෙසං, සූත්‍රප්‍රදෙශ විරහිතවූ; අපරියන්තවතිං, පරිච්ඡේද ප්‍රමාණරහිතවූ; අනත්ථසංහිතං, අනර්ථයෙන් යුක්තවූ; අනිධානවතිං, හෘදවස්තු නැමැති මඤ්ජූෂායෙහි නිධානයක්මෙන් බහානබන්ට නුසුදුසුවූ; වාචං භාසිතා, වචනයන් කියන සුළුය; ගහපතයො, පින්වත් ගෘහපතීනි; වාචාය, වාග්ද්වාරයෙන් සිඩවන්නාවූ; අධම්මචරියා විසමචරියා, අධර්මචය්‍යාවයයි කියනලද විසමවූ අකුශලක්‍රියාතොම; එවං ඛො, මේ ප්‍රකාරයෙන් වනාහි; චතුබ්බිධං හොති, සතර කොටසෙක් වන්නේය.

ගහපතයො, ගෘහපතීනි; මනසා, මනොද්වාරයෙන් සිඩවන්නාවූ; අධම්මචරියා විසමචරියා, අධර්මචරියාවයයිකියනලද විසමක්‍රියාව; කථංච තිවිධං හොති, කෙසේ ත්‍රිවිධ කොට්ඨාශයෙක් වීද? ගහපතයො—පෙ— ඉධ, මේ ලොකයෙහි; එකච්චො, සමහර අඥාන පුද්ගලයෙක් තෙම; පරස්ස, මෙරමා සන්තකවූ හෙවත් අනුන් සතුවූ; පරවිත්තූපකරණං, අන්‍යයාගේම තුෂ්ටිජනනයකරන්නාවූ; යං, හිරණ්‍යසුවර්ණාදි යම් වස්තුවෙක් ඇද්ද; තං ඒ වස්තුව; අභිජ්ඣාලු හොති, විසම ලොභය බහුල කොට නිරීක්ෂණය කරන්නේ වේද; පරස්ස, මෙරමාගේ, යං, යම් වස්තුවෙක්ඇද්ද; තං, ඒ වස්තුව; මම අස්ස, මට වූයේ වීනම්; අහො වතාති, ඉතා යෙහෙකැයි කියා; අභිජ්ඣිතා හොති, විසම ලොභයෙන් චින්තනය කරන්නේය. ව්‍යාපන්නචිත්තො ඛො පන හොති, ව්‍යාපන්න

සිත් ඇත්තේ වනාහි; පදුට්ඨ මන සංකප්පො, ක්‍රොධයෙන් ප්‍රදුෂිත චිත්තසඞ්කල්පනාවෙන් යුක්තවූයේ; ඉමෙ සත්තා, මේ සත්වයෝ; හඤ්ඤන්තු වා, ඝාතනයවෙත්වයි කියා හෝ; වජ්ඣන්තු වා, වධයට පැමිණෙත්වයි කියා හෝ; උච්ඡිජ්ජන්තු වා, නසිත්වයි කියා හෝ; විනස්සන්තුවා, විනාසභාවයට පැමිණෙත්වයි කියා හෝ; මාවා අහෙසුං ඉතිවාති, මොවුන්ට කිසිවක් නොවෙත්වයි කියා හෝ සිතන්නේය. මිච්ඡාදිට්ඨි ඛො පන හොති, මිථ්‍යාදෘෂ්ටියෙන් යුක්තවූයේ වනාහි; විපරීත දස්සනො, වරදවා දක්නාලද්දේ; නත්ථි දින්නං, දෙනලද දානයාගේ ඵල විපාක නැත්තේයයි සිතන්නේය; නත්ථි යිට්ඨං, කරණ ලද පූජාවෙහි; ඵල විපාක නැත්තේයයි සිතන්නේය; නත්ථි හුතං, වෙහෙරට ගමන්කරවා කරණලද සත්කාරයෙහි ඵලවිපාක නැත්තේයයි සිතන්නේය; නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො, සුකෘත දුෂ්කෘතයයි කියන ලද කුශලාකුශල කර්මයන්ගේ ඵලවිපාකය නැත්තේයයි සිතන්නේය; නත්ථි අයංලොකො, පරලොව සිටියාහට මෙලොව නැත්තේයයි සිතන්නේය; නත්ථි පරෙ ලොකො, මෙලොව සිටියාහට පරලොව නැත්තේයයි සිතන්නේය; නත්ථි මාතා, මාතෘන් විෂයෙහි පවත්වනලද සුචරිත දුශ්චරිත ක්‍රියාවෙහි ඵල විපාක නැත්තේයයි කියන්නේය; නත්ථිපිතා පිතෘන් විෂයෙහි පවත්වනලද සුචරිත දුශ්චරිත ක්‍රියායෙහි ඵලවිපාක නැත්තේයයි කියන්නේය; නත්ථි සත්තා ඔපපාතිකා, චුතිචිත්තයෙන් මත්තෙහි ඔපපාතිකව උපදනා සත්වකෙනෙක් නැත්තේයයි කියන්නේය; ලොකෙ, මේ සත්වලොකයෙහි; සම්මග්ගතා, සම්‍යක් මාර්ගයට පිළිපන්නාවූ; සම්මාපටිපන්නා, සම්‍යක් ප්‍රතිපත්තියෙන් යුක්තවූ; ඉමංච ලොකං, මෙලොවද; පරංච ලොකං, පරලොවද; සයං අභිඤ්ඤාය, පරොපදෙශ රහිතව තමන් විසින්ම විශිෂ්ටඥානයෙන් දැන; සච්ඡිකත්වා, සාක්ෂාත් කොට; පවෙදෙන්ති, ලොකයාහට ප්‍රකාශ කොට දක්වන්නාවූ; යෙ සමණබ්‍රාහ්මණා, යම් ශ්‍රමණබ්‍රාහ්මණ කෙනෙක් ඇද්ද එබඳු ශ්‍රමණබ්‍රාහ්මණ කෙනෙක්; නත්ථීති, නැත්තේයයි කියන්නේය.

ගහපතයො, ගෘහපතීනි; මනසා, මනොද්වාරයෙන් සිදුවන්නාවූ; අධම්මචරියා විසමචරියා, අධර්මචර්‍ය්‍යාවයයි කියනලද විසම්වූ අකුශල ක්‍රියා තොමෝ; එවං ඛො, මේ ප්‍රකාරයෙන් වනාහි; තිවිධං හොති, තුන් කොටසක් වන්නේය.

ගහපතයො, ගෘහපතීනි; අධම්මචරියා විසමචරියා හෙතු ඛො, අධර්මචර්‍ය්‍යාවයයි කියන ලද විසමක්‍රියාව හේතුකොටගෙන; එවං, මෙසේ; ඉධ, මේ ලොකයෙහි; එකච්චෙ සත්තා, සමහර සත්වකෙනෙක්; කායස්ස භෙදා, ස්කන්ධ කායයාගේ භෙදයෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; අපායං—පෙ—උපපජ්ජන්තීති.

යම්සේ මාර්ගදෙශක පුරුෂයෙක් ජීවිත හරණ විසමවෘක්ෂ නාපොලොන් දුරපිඹුරු සිංහ ව්‍යාඝ්‍ර චෞරාදීන්ගෙන් උපද්‍රව සහිත නොයායුතු මාර්ගය දක්වා නැවත ප්‍රසන්න ශීතල මධුරෝදක සම්පූර්ණ පුෂ්කරණී ඵල වෘක්ෂ ඡායාවෘක්ෂයෙන් උපශෝභිතවූ යායුතු මාර්ගය දක්වාද එමෙන් සර්වඥගාමී මාර්ගය දෙසන ත්‍රිලෝගුරු බුද්ධරාජාණන්වහන්සේත් පළමු කොට සර්වදුඃඛදායක නොයායුතු දුශ්චරිත කර්මමාර්ගය දක්වා නැවත යායුතු සර්වසම්පත්තිඵලප්‍රදායක ඍජු අකුටිල සුචරිත මාර්ගය ප්‍රකාශ කොට දක්වන සේක් “ තිවිධං ඛො ගහපතයො කායෙන ධම්මචරියා හොති ” යනාදී පාඨපඞ්ක්තිය වදාළසේක.

ගහපතයො—පෙ—කායෙන, කායද්වාරයෙන් සිද්ධවන්නාවූ; ධම්මචරියා සමචරියා, ධර්මචරියාවයයි කියනලද සමවූ කුශලක්‍රියා තොමෝ; තිවිධං හොති, ත්‍රිවිධ වන්නේය; වාචාය, වාග්ද්වාරයෙන් සිද්ධවන්නාවූ; ධම්මචරියා සමරියා, ධර්මචර්‍යාවයයි කියනලද කුශලක්‍රියා තොමෝ; චතුබ්බිධං හොති, සතරවැදෑරුම් වේ හෙවත් සතර කොටසෙක් වේ; මනසා, මනොද්වාරයෙන් සිද්ධවන්නාවූ; ධම්මචරියා සමචරියා—පෙ—ගහපතයො—පෙ—කායෙන, කායද්වාරයෙන් සිද්ධවන්නාවූ; ධම්මචරියා සමචරියා, ධර්මචර්‍යාවයයි කියනලද සමවූ කුසලක්‍රියාතොම; කථංච තිවිධං හොති, කෙසේ ත්‍රිවිධ කොට්ඨාශයෙක් වන්නේද; ගහපතයො, ගෘහපතීනි; ඉධ, මේලොකයෙහි; එකච්චො, සමහර සත්වකෙනෙක්; පාණාතිපාතංපහාය, පාණාතිපාතය හැර; පාණාතිපාතා, ප්‍රාණඝාතයෙන්; පටිවිරතො හොති, විශෙෂයෙන් වැළැක්කේ වේද; නිහිත දණ්ඩො, පරහිංසා පිණිස නොගන්නාලද දණ්ඩමුද්ගරාදීන් ඇතිහෙයින් බහාතබනලද දණ්ඩමුද්ගරාදීන් ඇත්තේය; නිහිත සත්ථො, පරූපඝාතය පිණිස ඛඩ්ගකුන්තාදී ශස්ත්‍රයන් ගෙණ නොපවත්නා හෙයින් බහාතබනලද ශස්ත්‍රයන් ඇත්තේය; ලජ්ජී, පාපයෙහි ජිගුප්ෂාකාරයෙන් පවත්නාහෙයින් ලජ්ජීය; දයාපන්නො, කරුණාවට පැමිණි සිත් ඇත්තේ; සබ්බපාණභූත හිතානුකම්පී විහරති, සකල ප්‍රාණීන් විෂයෙහි හිතචිත්තයෙන් අනුකම්පා කෙරෙමින් වාශයකරන්නේය. මේ කයින් සිද්ධවන පළමුවන සුචරිත කොට්ඨාසය නම් වන්නේය.

අදින්නාදානං පහාය; අදත්තාදානය හැර; අදින්නාදානා, අදත්තාදානයෙන්; පටිවිරතො හොති, විශෙෂයෙන් වැළැක්කේය; පරස්ස, මෙරමාගේ; යං, හිරණ්‍යසුවර්ණාදී යම් කිසි වස්තුවෙක් ඇද්ද; ගාමගතං වා, ග්‍රාමස්ථවූ හෝ, හෙවත් ඇතුළුගම්හි තබනලද්දාවූ හෝ; අරඤ්ඤගතං, අරණ්‍යස්ථවූ හෝ හෙවත් වෘක්ෂපර්වතාදීන් ආශ්‍රය කොට තබනලද්දාවූ හෝ; පරවිත්තූපකරණං, අන්‍යයාගේම තුෂ්ටිජනනය කරන්නාවූ; අදින්නං, කයින් වචසින් නොදෙනලද; තං, ඒ වස්තුව; ථෙය්‍ය සං

ඛානං, ථෙය්‍යයයි කියනලද සොරසිත් කොඨාශය පහළකොට ගෙනි; නාආදාතා හොති, ග්‍රහණය නොකරන්නේය. මේ කායවාරයෙන් සිඛවන් නාවූ දෙවෙනි සුචරිත කොඨාශය නාම් වන්නේය.

කාමෙසුමිච්ඡාචාරං පහාය, කාමමිථ්‍යාචාරය හැර; කාමෙසුමිච්ඡාචාරා කාමමිථ්‍යාචාරයෙන්; පටිවිරතො හොති, විශෙෂයෙන් වැලක්කේ වේද; යානා, යම්සත්‍රියක් තොමෝ; මාතු රක්ඛිතා, (ජනකවූ පියාණන් පරලොව ගියකල්හි අසනාවශනප්‍රදානය කරමින්) මෑණියන් විසින් රක්‍ෂාකරණලද් දීද–පෙ–චාරිත්තං, මෛථුන සෙවනයට; න ආපජ්ජිතා හොති, නොපැමිනෙන්නේය. මේ කායවාරයෙන් සිඛවන තුන්වැනිවූ සුචරිත කොඨාශයනාම් වන්නේය.

ගහපතයො, කායෙන ධම්මචරියා සමචරියා, එවං ඛො තිවිධං හොති –පෙ–ත්‍රිවිධ කොඨාසයෙන් වන්නේය.

ගහපතයො, ගෘහපතීනි; වාචාය ධම්මචරියා සමචරියා කථං චතුබ්බිධං හොති, කෙසේ චතුර්විධ වේද? ගහපතයො, ගෘහපතීනි; ඉධ, මේ ලොකයෙහි; එකච්ච සත්තා, සමහරසත්ත්වකෙනෙක්; මුසාවාදං පහාය, මෘෂාවාදය හැර; මුසාවාදා, මෘෂාවාදයෙන්; පටිවිරතො හොති; විශෙෂයෙන් වැලැක්කේ වේද; සභාගතො වා–පෙ–නසම්පජාන මුසාභාසිතා හොති, දූනාදූන බොරු නොකියන්නේය. මේ වාක්වාරයෙන් සිඛවන් නාවූ පළමුවැනි සුචරිත කොඨාශයනාම් වන්නේය.

පිසුනාවාචම්පහාය, ප්‍රසිශූන්‍ය වචනය හැර; පිසුනාවාචා, ප්‍රසිශූන්‍ය වචනයෙන්; පටිවිරතො හොති, විශෙෂයෙන් වැලැක්කේ වේද; ඉතො සුත්වා, මෙතනින් යමක් අසා; ඉමෙසමෙභදාය, මොවුන්ගේ භෙදය පිණිස; න අමුත්‍ර අක්ඛාතා, එතැන්හී ගොස් නොකියන සුළුය; අමුත්‍ර වා සුත්වා, එතනින් යමක්අසා; අමූසමෙභදාය, ඔවුන්ගේ භෙදය පිණිස; ඉමෙසං න අක්ඛාතා, මොවුන්ට නොකියන සුළුය; ඉති, මෙසේ; භින්නානං වා, භෙදයට පැමිණියවුන් සම්බන්ධව හෝ; සන්ධාතා, ගලපනසුළුය සහිතානං වා, එක්වූවන් සම්බන්ධව හෝ; අනුප්පදාතා, අනුබලප්‍රදාණය කිරීම ස්වභාව කොට ඇත්තේය; සමග්ගාරාමො, සමගිවූවාහු යම්තැනෙක්හි වාසය කෙරේද්ද එතැන්හි ඇලුම් කෙරේද එබඳු වචනයන් කියන සුළුය. මෙ වාග්වාරයෙන් සිඛවන දෙවැනි සුචරිත කොඨාශය නාම් වන්නේය.

ඵරුසාවාචම්පහාය, ඵරුෂ වචනය හැර; ඵරුසාවාචා, ඵරුෂවචනයෙන්; පටිවිරතො හොති, විශෙෂයෙන් වැලැක්කේ වේද; යාසාවාචා, යම් ඒ වචනයක් තොමෝ; නෙලා, නිර්දෙෂද; කණ්ණසුඛා, ව්‍යඤ්ජනමධුරත්වයෙන් කර්ණ රසායනද; පෙමණීයා, අර්ථමධුරත්වයෙන් සකල ශරීරයෙහි කොපනූපදවා ප්‍රෙමඋපදවන හෙයින් ප්‍රෙමකටයුතුද; හදයංගමා,

අශබලීනව සැපයේ සිතට වදනා හෙයින් සිත්කළුවූ; පොරී, පුරවැසියන්ගේ වචන මෙන් මොළොකුද; බහුජන කන්තා, බොහෝ ජනයාට ප්‍රිය වඩන්නීද; බහුජන මනාපා, බොහෝ ජනයාගේ සිතට අභිවෘද්ධිකරන්නීද; තථා රූපිං වාචම්භාසිතා හොති, එබඳු වචනයක් කියනසුලුය. මේ වාග්වාරයෙන් සිඹවන තුන්වැනි සුචරිත කොට්ඨාශයනම් වන්නේය. සම්ඵප්පලාපං පහාය, සම්ඵප්‍රලාප වචනය හැර; සම්ඵප්පලාපා, සම්ඵප්‍රලාපයෙන්; පටිවිරතො හොති, විශෙෂයෙන් වැලැක්කේ වේද; කාලවාදී, කියයුතු කල්සලකා කියන්නේය; භූතවාදී, සත්‍ය වචන කියන්නේය; අත්ථවාදී, දෘෂ්ට ධාර්මික සාම්පරායික අර්ථනිශ්‍රිතවම කියන්නේය; ධම්මවාදී, නවලොකොත්තර සබ්‍ය නිශ්‍රිතවම කියන්නේය; විනයවාදී, සංවර විනය නිශ්‍රිතවම කියන්නේය; කාලෙන, යුක්තප්‍රාප්ත කාලයෙහි සාපදෙසං, උපමාකාරණ සහිතවූ; පරියන්තවතිං, පරිච්ඡෙද වත්වූ; අත්ථ සංහිතං, අර්ථයෙන් යුක්තවූ; නිධානවතිං වාචම්භාසිතා, හෘදයවස්තු නැමැති මඤ්ජූසායෙහි බහාතිබියයුතු වචනයන් කියනසුලුය; මේ වාග් වාරයෙන් සිඹවන සතරවන සුචරිත කොට්ඨාශය නම් වන්නේය. ගහපතයො—පෙ—වාචාය ධම්මචරියා සමචරියා එවං ඛො චතුබ්බිධං හොති.

ගහපතයො මනසා ධම්මචරියා සමචරියා කතිංච තිවිධං හොති, කෙසේ ත්‍රිවිධ කොට්ඨාශයෙක් වේද; ගහපතයො, ගෘහපතීනි; ඉධ මේ ලොකයෙහි; එකච්චො, සමහරසත්ත්වයෙක් තෙම; පරස්ස, මෙරමා සන්තකවූ; පරවිත්තූපකරණං, අනුන්ගේ තුෂ්ටි ජනනය කරන්නාවූ; යං, හිරණ්‍ය සුවර්ණාදි යම් වස්තුවෙක් ඇද්ද; තං, ඒ වස්තුව; අනභිජ්ඣාලු හොති විසම ලොභයෙන් චින්තනය නොකරන්නේය; පරස්ස, මෙරමාගේ; යං, යම්වස්තුවෙක් ඇද්ද; තං, ඒවස්තුව; මම අස්ස, මට වූයේ විනම්; අහොව තාහි, ඉතා යෙහෙකැයි; නාභිජ්ඣිතා හොති, විසම ලොභයෙන් චින්තනය නොකරන්නේය. මේ මනොවාරයෙන් සිඹවන පළමුවැනි සුචරිත කොට්ඨාශයෙක් නම් වන්නේය.

අව්‍යාපන්නචිත්තො ඛො පන හොති, ප්‍රදුෂ්ට නොවූ චිත්තය ඇත්තේ වනාහි; අප්පදුට්ඨමන සංකප්පො, ප්‍රදුෂ්ට නොවූ චිත්තසංකල්පනා ඇත්තේ; ඉමෙ සත්තා, මේ සත්වයෝ; අවෙරා, වෛරී නොවෙත්වයි කියා හෝ; අව්‍යාපජ්ඣා, නොනසිත්වයි කියා හෝ; අනීඝා, නිදුක්වෙත්වයි කියා හෝ සුඛී, සුවපත්වෙත්වයි කියා හෝ; අත්තානං, ආත්මභාවය; පරිහරන්තුති, රක්ෂාකෙරෙත්වයි කියා හෝ; සිතන්නේය. මේ මනොවාරයෙන් සිඹවන දෙවෙනි සුචරිත කොට්ඨාශය නම් වන්නේය.

සම්මාදිට්ඨි ඛො පන හොති, සම්‍යක්දෘෂ්ටියෙන් යුක්තවූයේ වනාහි; අවිපරීත දස්සනො, නොවරදවා හැසිරෙණලද්දේ; අත්ථිදින්නං, දෙනලද්ද

දානයෙහි ඵලවිපාක ඇත්තේය; අත්ථි යිට්ඨං, කරණලද පූජාවෙහි ඵලවිපාක ඇත්තේය; අත්ථි හුතං, වෙහෙරට ගමන්කරණලද පූජාවෙහි ඵලවිපාක ඇත්තේය; අත්ථි සුකතදුක්කටානං කම්මානං ඵලං විපාකො, සුකෘතදුෂ්කෘතවශයෙන් කරණලද කුශලාකුශලකර්මයන්ගේ ඵලවිපාකඇත්තේය; අත්ථි අයං ලොකො, පරලොව සිටියහට මෙලොව ඇත්තේය; අත්ථිපරලොකො, මෙලොව සිටියහට පරලොවඇත්තේය; අත්ථිමාතා, මෑණියන් කෙරෙහි පවත්වනලද සුචරිතක්‍රියාවෙහි ඵලවිපාකඇත්තේය; අත්ථිපිතා පියාණන්කෙරෙහි පවත්වනලද සුචරිතක්‍රියායෙහි ඵලවිපාක ඇත්තේය; අත්ථි සත්තා ඔපපාතිකා, චුතිචිත්තයෙන්මත්තෙහි ඔපපාතිකවඋපදනා සත්වකෙනෙක් ඇත්තේය; ලොකෙ, මේ ලොකයෙහි; සම්මග්ගතා, සම්‍යක්මාර්ගයට පිළිපන්නාවූ; සම්මාපටිපන්නා, සම්‍යක් ප්‍රතිපත්තියෙන් යුක්තවූ; ඉමංචලොකං, මේලොවද; පරංචලොකං, පරලොවද; සයං අභිඤ්ඤාය, තෙමේ ප්‍රත්‍යක්ෂඥානයෙන් දැන; සච්ඡිකත්වා, සාක්ෂාත් කොට; පවෙදෙන්ති, ලොකයාහට ප්‍රකාශකොට දක්වන්නාවූ; යෙසමණබ්‍රාහ්මණා, සමිතපාප බාහිතපාප යම් ශ්‍රමණබ්‍රාහ්මණකෙනෙක් ඇද්ද; එබඳු ශ්‍රමණබ්‍රාහ්මණයෝ; අත්ථි, ඇත්තාහුයයි කියන්නේය; මේ මනොවාරයෙන් සිඬවන තුන්වැනි සුචරිත කොට්ඨාශයනම් වන්නේය;

ගහපතයො, ගෘහපතීනි, මනසා, මනොවාරයෙන් සිඬ වන්නාවූ; ධම්මචරියාසමචරියා, ධර්මචර්‍යාවයයි කියනලද සමක්‍රියාතොම; එවං ඛො, මේප්‍රකාරයෙන්; තිවිධංහොති, ත්‍රිවිධ කොට්ඨාශයෙක් වන්නේය; ගහපතයො, ගෘහපතීනි; එවං, මෙසේ; ධම්මචරියා සමචරියා හෙතුඛො, ධර්මචර්‍යාවයයි කියනලද සමක්‍රියාව හෙතුකොටගෙන; එවං, මේප්‍රකාරයෙන්; ඉධ, මේලොකයෙහි; එකච්චෙ සත්තා, සමහර සත්වකෙනෙක්; කායස්ස භෙදා, කරජකායයාගේ භෙදයෙන්; පරම්මරණා, චුතිචිත්තයෙන් මත්තෙහි; සුගතිං, ශොභනගතිඇතිහෙයින් සුගතිනම්වූ; සග්ගං, පඤ්චකාමසම්පත්තීන් සුෂ්ඨුඅග්‍රහෙයින්ස්වර්ගනම්වූ; ලොකං, දිව්‍යලොකයෙහි; උපපජ්ජන්ති, උපදනාහුයයි වදාළසේක. යම්සේදශවිධ රත්නයෙන් සම්පූර්ණවූ අක්ෂය නිධානයක් හිතේසී පුරුෂයෙක් ලොකයාහට දක්වා නැවත ඒ ධනය ගතහොත් ක්ෂත්‍රිය බ්‍රාහ්මණ ගෘහපති මහාසාර සම්පත්තියටද ප්‍රදෙශරාජ්‍ය චක්‍රවර්තිරාජ්‍ය සම්පත්තියටද පැමිණියහැක්කේයයි කියාද එමෙන් සනරාමර ලොකයාහට හිතේසීවූ ත්‍රිලෝගුරු බුදුරජාණන්වහන්සේ අනුගාමික නිධි සඞ්ඛ්‍යාත දශවිධ සුචරිතක්‍රියාවන් ලෝකයාහට ප්‍රකාශ කොට දක්වා ඒ අනුගාමිකනිධි සඞ්ඛ්‍යාත දශවිධ සුචරිත ක්‍රියායෙන් ලැබියහැකි දිව්‍ය මනුෂ්‍ය සම්පත් හා නිවන්සම්පත් ප්‍රකාශ කොට දක්වනසේක්, "ආකඞ්ඛෙය්‍ය චෙ ගහපතයො ධම්මචාරී සමචාරී" යනාදි පාඨපඞ්ක්තිය වදාළසේකි.

ගහපතයො, ගෘහපතීනි; ධම්මචාරී සමචාරී, ධර්මචර්‍යාවයයි කියනලද සමක්‍රියාවෙන් යුක්තවූ පුද්ගල තෙම; අහං, මම; කායස්ස භෙදා, කරජ කායයාගේ භෙදයෙන්; පරම්මරණා, චුතිචිත්තයෙන් මත්තෙහි; ඛත්තිය මහාසාලානං වා, ක්ෂත්‍රිය මහාසාර කුලයන් සම්බන්ධව හෝ; සහව්‍යතං, එකීභාවයට පැමින; උපපජ්ජෙය්‍යං, උපන්නෙම්වීනම්; අහොවතාති, ඉතා යෙහෙකැයි; ආකඞ්ඛෙය්‍ය චෙ, ඉදින් කැමතිවීමය යන; ඨානං, යමක් ඇද්ද; එතං ඨානං ඛො පන, මේ කාරණය වනාහි; විජ්ජති, විද්‍යමාන වන්නේය; සො, ඒ පුද්ගලතෙම; කායස්ස භෙදා, කරජකායයාගේ භෙදයෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; ඛත්තිය මහාසාලානං වා, ක්ෂත්‍රිය මහාසාරකුලයන් සම්බන්ධව හෝ; සහව්‍යතං, එකීභාවයටපැමින; උපපජ්ජෙය්‍ය, උපදනේය; තං කිස්ස හෙතු, ඊට හෙතු කවරේද; තථාහි සො ධම්මචාරී සමචාරී, ඒ ධර්මචාරීයයි කියනලද සමක්‍රියාවෙන් යුක්තවූ පුද්ගලතෙම පොහොසත්වන්නේය. ගහපතයො–පෙ–බ්‍රාහ්මණ මහාසාලානං වා, බ්‍රාහ්මණ මහාසාරකුලයන් සම්බන්ධව හෝ; ගහපති මහාසාලානං වා, ගෘහපති මහාසාරකුලයන් සම්බන්ධවහෝ–පෙ–ගහපතයො, –පෙ–චාතුම්මහාරාජිකානං දෙවානං, චාතුර්මහාරාජික දිව්‍යලොකයෙහි දෙවියන් සම්බන්ධව හෝ; සහව්‍යතං, එකීභාවයටපැමින; උපපජ්ජෙය්‍යං; උපදනෙම්වීනම්; අහොවතාති, ඉතා යෙහෙකැයි ආකඞ්ඛෙය්‍ය චෙ, ඉදින්කැමතිවීමය යන; ඨානං, යමක්ඇද්ද; එතං ඨානං ඛො පන, මේ කාරණය වනාහි; විජ්ජති, විද්‍යමාන වන්නේය; සො, ඒ පුද්ගල තෙම; කායස්ස භෙදා, කරජ කායයාගේ භෙදයෙන්; පරම්මරණා, චුතිචිත්තයෙන් මත්තෙහි; චාතුම්මහාරාජිකානං දෙවානං, චාතුර්මහාරාජික දිව්‍යලොකයෙහි දෙවියන්හා; සහව්‍යතං, එකීභාවයටපැමින; උපපජ්ජෙය්‍ය, උපදනේය; තං කිස්ස හෙතු, ඊට හෙතු කවරේද; තථාහි සො ධම්මචාරී සමචාරී; ඒ ධර්මචාරීයයි කියනලද සම ක්‍රියාවෙන් යුක්තවූ පුද්ගල තෙම සමර්ථවන්නේය. ගහපතයො–පෙ–තාවතිංසානං දෙවානං, තව්තිසා වැසිදෙවියන්හා–පෙ–යාමානං දෙවානං, යාම නම් දිව්‍යලොකයෙහි දෙවියන්හා–පෙ–නිම්මානරතීනං දෙවානං, නිර්මානරතී දෙවියන් සම්බන්ධ–පෙ–පරනිම්මිත වසවත්තීනං දෙවානං, පරනිර්මිතවසවර්ති දෙවියන්හා –පෙ–බ්‍රහ්මකායිකානං දෙවානං, බ්‍රහ්මකායික දෙවියන් හා, සහව්‍යතං, එකීභාවයටපැමින, උපපජ්ජෙය්‍ය උපදනේය; තං කිස්ස හෙතු, ඊට හෙතු කවරේද; තථාහි සො ධම්මචාරීසමචාරී, ගහපතයො–පෙ–පරිත්තාභානං දෙවානං, පරිත්තාභ නම් බඹලොව දෙවියන් හා; සහව්‍යතං, එකීභාවයටපැමින; උපපජ්ජෙය්‍ය, උපදනේය; ගහපතයො–පෙ–අප්පමාණාභානංදෙවානං, අප්‍රමාණාභානම් දෙවියන් සම්බන්ධව; ආභස්සරානං දෙවානං, ආභස්සරනම් බ්‍රහ්මලොකයෙහි බ්‍රහ්මයන් සම්බන්ධව–පෙ–පරිත්ත

සුභානං දෙවානං, පරිත්තසුභනම් දෙවියන් සම්බන්ධව; සුභකිණ්හකානං දෙවානං, සුභකිණ්හකනම් දෙවියන් සම්බන්ධව; වෙහප්ඵලානං දෙවානං, වෙහප්ඵලනම් දෙවියන් සම්බන්ධව; අවිහානං දෙවානං අවිහනම් බ්‍රහ්මලොකයෙහි දෙවියන් සම්බන්ධව; අතප්පානං, අතප්පනම් බ්‍රහ්මලොකයෙහි දෙවියන් සම්බන්ධව; සුදස්සානං දෙවානං, සුදස්සනම් දෙවියන් සම්බන්ධව; සුදස්සීනං දෙවානං, සුදර්ශීනම් බ්‍රහ්මලොකයෙහි දෙවියන් සම්බන්ධව, අකනිට්ඨකානං දෙවානං, අකනිට්ඨකනම් බ්‍රහ්මලොකයෙහි දෙවියන් සම්බන්ධව; ආකාසානඤ්චායතනූපගානං දෙවානං, ආකාසානඤ්චායතනනම් අරූපාවචර බ්‍රහ්මයන් සම්බන්ධව; විඤ්ඤාණඤ්චායතනූපගානං දෙවානං, විඤ්ඤාණඤ්චායතනනම් අරූපාවචර බ්‍රහ්මයන් සම්බන්ධව; ආකිඤ්චඤ්ඤායතනූපගානං දෙවානං, ආකිඤ්චඤ්ඤායතන දෙවියන් සම්බන්ධව; නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපගානං දෙවානං, නෙවසඤ්ඤානාසඤ්ඤායතනනම් දෙවින් සම්බන්ධව; සහව්‍යතං, එකීභාවයට පැමින; උපපජ්ජෙය්‍යං, උපදනෙම් වීනම්; අහො වතාති, ඉතා යෙහෙකැයි; ආකඞ්ඛෙය්‍යචෙ, ඉදින් කැමතිවීමය යන; යං, යමක් ඇද්ද; එතං ඨානං ඛො පන, මේ කාරණයවනාහි; විජ්ජති, විද්‍යමානවන්නේය; සො, ඒ පුද්ගලතෙම; කායස්ස භෙදා, කරජකායයාගේ භෙදයෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපගානං දෙවානං, නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් සම්බන්ධව; සහව්‍යතං, එකීභාවයට පැමින; උපපජ්ජෙය්‍ය, උපදනේය; තං කිස්සහෙතු, ඊට හේතු කවරේද? තථාහි සො ධම්මචාරී සමචාරී, ඒ ධර්මචර්‍ය්‍යාවයයි කියනලදසමක්‍රියා ඇති පුද්ගලතෙම පොහොසත් වන්නේය.

ගහපතයො, ගෘහපතීනි; ධම්මචාරිසමචාරී, ධර්මචර්‍ය්‍යාවයයි කියනලද සමක්‍රියාවෙන් යුක්තවූ පුද්ගලතෙම; අහං, මම; ආසවානං ඛයා, කාමාශ්‍රවාදී චතුරාශ්‍රවයන්ගේ ක්ෂයවීමෙන්; අනාසවං, ආශ්‍රවනැතිහෙයින්අනාශ්‍රවවූ; චෙතොවිමුත්තිං, චෙතොවිමුක්තිඥනයයිකියනලද; පඤ්ඤාවිමුත්තිං, අර්හත්ඥනය; දිට්ඨෙවධම්මෙ, ඉහාත්මභාවයෙහි, සයං අභිඤ්ඤාය; පරොපදෙසරහිතව ස්වයම්භූඥනයෙන්දැන; සච්ඡිකත්වා, සාක්ෂාත් සාක්ෂාත්කොට; උපසම්පජ්ජ, පැමින; විහරෙය්‍යං, වාසයකෙලෙම්වීනම්; අහොවතාහි, ඉතායෙහෙකැයි; ආකංඛෙය්‍ය චෙ, ඉදින් කැමතිවීමය යන; යං, යමක් ඇද; එතංඨානංඛොපන, මෙකාරණයවනාහි; විජ්ජති, විද්‍යමානවන්නේය; සො, ඒපුද්ගලතෙම; ආසවානං ඛයා, ආශ්‍රවයන්ගේ ක්ෂයවීමෙන්; අනාසවං, අනාශ්‍රවවූ; චෙතොවිමුත්තිං, චෙතොවිමුක්තිඥනයයි කියනලද; පඤ්ඤාවිමුත්තිං, අර්හත්ඵලඥනය; දිට්ඨෙවධම්මෙ, ඉහාත්මභාවයෙහි; සයං අභිඤ්ඤාය, තමාවිසින්දැන; සච්ඡිකත්වා, සාක්ෂාත් සාක්ෂාත්කොට, උපසම්පජ්ජ, පැමින; විහරෙය්‍ය, වාසයකරන්නේය; තං කිස්සහෙතු, ඊටහෙතු

සචරේද; තථාහි සොධම්මචාරි සමචාරී, ඒධර්මචය්‍ර්‍යාවයයිකීයනලද සම ක්‍රියාවෙන්යුක්තවූ පුද්ගලතෙම; පොනොසත් වන්නේයයිකියා, අනිත් එලඤනයෙන් කුළුගන්වා දෙශනාව නිමාවට පමුනුවාවදාළසේක.

එවංවුත්තෙ, (සකල සත්වහිතවිධායකවූ භාග්‍යවතුන්වහන්සේ විසින් ඔවුන්ගේ මනොරථ පූරණය කෙරෙමින් මේසූත්‍රයමෙසේ වදාළකල්හි; වෙරඤ්ජකා බ්‍රාහ්මණ ගහපතිකා, වෙරඤ්ජා නම් ග්‍රාමයෙහි වාශය කරන්නාවූ බමුණන්හා ගොවීහු; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේට; එතදවොචුං, මෙ සෙත්‍රවචනයෙන් මෙසේ දන්වූවාහුය. භො ගොතම, භවත් ගෞතම ගොත්‍ර ඇති සර්වඥයන්වහන්ස; අභික්කන්තං, තුබවහන්සේගේ ධර්මදෙශනාව ඉතා යහපතැයි කියා ප්‍රසංශා කළාහුය. භොගොතම, භවත්ගෞතම ගොත්‍රඇති සර්වඥයන්වහන්ස; අභික්කන්තං, තුඹවහන්සේගේ ධර්මදෙශනාව යහපතැයිකියා අනුගිකළාහුයි; භොගොතම, භවත්ගෞතම ගොත්‍රඇති සර්වඥයන්වහන්ස; නිකුජ්ජිතංවා, යම්කිසිවක්හුවිසින් අධොමුඛකොට තබනලද භාජනයක් සෙය්‍යථාපි උක්කුජ්ජෙය්‍ය, උඩුකුරුකොට තබන්නේ යම්සේද පටිච්ඡන්නංවා, තෘණපර්ණාදීන් ප්‍රතිච්ඡන්නවූ වස්තුවක්; සෙය්‍යථාපි විවරෙය්‍ය විවෘතකොට දක්වන්නේයම්සේද; මූළ්හස්ස, සමසක් මංමුලාවූ පුරුෂයක්හට; සෙය්‍යථාපි මග්ගංආචික්ඛෙය්‍යවා; හස්තග්‍රහණය කොට මේ මාර්ගය මෙසේයවයිකියා, මගකියන්නෙක් යම්සේද; අන්ධකාරෙකෘෂ්ණ පක්ෂ චාතුර්දසී මධ්‍යම රාත්‍රි ඝණවන සඝමෙඝපටලාකුලාය සංඛ්‍යාත චතුරඞ්ගයෙන් යුක්තවූ ඝනාන්ධකාරයෙහි; චක්ඛුමන්තො, අවිනෂ්ටචක්ෂු ප්‍රසාදඇති යම්කිසිපුරුෂයෙක් රූපානි නීලපීතාදී රූපයන්; දක්ඛින්තීති දකිත්වයි, තෙලපජ්ජොතං, ප්‍රසන්න තිලතෛල ප්‍රජ්වලිත මහා ප්‍රදීපයක්; සෙය්‍යථාපි ධාරෙය්‍ය, ධරන්නෙක් යම්සේද එවමෙවං, එපරිද්දෙන්ම; භොගොතමෙන, භවත්ගෞතමගොත්‍රඇති සර්වඥයන්වහන්සේ විසින්; අනෙකපරියායෙන, අනෙකප්‍රකාරයෙන්; ධම්මො පකාසිතො, ධර්මය ප්‍රකාශකරනලද්දෙය; එතෙ මයං, ඒඅපි; භගවන්තං භොගොතමං, භගවත් ගෞතමගොත්‍ර ඇති සර්වඥයන්වහන්සේද; ධම්මඤ්ච, සපය්‍ර්‍යාප්තිනවලොකොත්තරසද්ධර්මයද; භික්ඛුසඞ්ඝඤ්ච, අෂ්ටාර්‍යපුද්ගල භික්ෂු සංඝයාද; සරණංගච්ඡාම, සරණපරායන හිතා හිත ප්‍රාප්තිකාරණයයන අභිප්‍රායෙන් සෙවනයකරමුහ; භවං ගොතමො, භවත් ගෞතමයාණන්වහන්ස; නො, අප; අජ්ජතග්ගෙ, අදපටන්කොට; පාණුපෙතං, ජීවිතාන්තයදක්වා; සරණංගතෙ, සරණගතවූ; උපාසකෙ, උපාසකවරහුයයි කීයා; ධාරෙතූති, සිත්හිලා ධරවදාරණයේක්වයිකියා, සැලකළාහුය.

සිහිරසතු

# සන්න සහිත විසාඛූපොසථ සූත්‍රය

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

එවමෙමසුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති පුබ්බාරාමෙ මිගාරමාතු පාසාදෙ

එවමෙමසුතං, මෙ; (ආයුෂ්මත්වූ මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්ස විශුද්ධ බුද්ධීන් ප්‍රසිද්ධ සකල ශ්‍රොතෘජනමනඃ ප්‍රසාද ජනකවූ මේ උපෝසථ සූත්‍රාන්ත ධර්මදේශනාව) මා විසින්; එවං සුතං, මේ ආකාරයෙන් අසනලද මෙසේ අසනලද මෙසේම අසනලදී; එකං සමයං, එක් සමයෙක්හි; නොහොත් ගර්භාවක්‍රාන්ති සමය ජාතිසමය සංවේග සමය අභිනිෂ්ක්‍රමන සමය දුෂ්කරක්‍රියා සමය මාරවිජයකාල සමය සම්‍යක් සම්බොධි සමධිගමකාලසමය දෘෂ්ටධර්මසුඛ විහාරසමය අත්තහිත පටිපත්තිසමය පරහිත පටිපත්ති සමය දෙශනා සමය පරිනිර්වාණ සමය යනාදී දිව්‍යමනුෂ්‍යයන් කෙරෙහි ප්‍රකාශිත සමයන් අතුරෙන් කරුණා කෘත්‍යසමය සංඛ්‍යාත එක් ධර්මදේශනා සමයෙක්හි; භගවා, භගවත් අභිත් සම්‍යක් සම්බුද්ධ සර්වඥ රාජොත්තමයානන් වහන්සේ; සාවත්ථියං, සවත්ථිනාම් සෘෂිගට නිවාසස්ථානවූ හෙයින් ශ්‍රාවස්තිනාම් පුරප්‍රවර සන්නයෙහිවූ; පුබ්බාරාමෙ, පූර්වාරාමනාම්වූ; මිගාරමාතු පාසාදෙ, මිගාර සිටුහු විසින් මව්තනතුරෙහි තබනලද හෙයින් මිගාරමාතෘනාම්වූ ඔහු සෙහෙළිවන විශාඛා මහා උපාසිකාව විසින් සත්විසි කෙළක් ධන වියදම් කොට කරවා පිළිගන්වනලද රත්න ප්‍රාසාදයෙහි; විහරති, ස්ථානගමනාය යනාදී චතුර්විධ ඊර්යාපථ බ්‍රහ්ම විහරණයෙන් යුක්තව වැඩවාසයකර වදාරණසේක

අථඛො විසාඛා මිගාරමාතා තදහුපොසථෙ යෙනභගවා තෙනුපසංකමි උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි එකමන්තං නිසින්නං ඛො විසාඛං මිගාරමාතරං භගවා එතදවොච

අථඛො, ඉක්බිත්තෙන් නොහොත් එකල්හි; මිගාරමාතා, මිගාරමාතෘවූ; විසාඛා, විශාඛා (මහා උපාශිකා) තොමො; තදහුපොසථෙ, එදවස් (පැමිණි) පෞර්ණමී පොහොදිනයෙහි;

භගවා, ශතපුණ්‍යලක්ෂණ ධරත්වාදි ගුණයෙන් යුක්තවූ සම්‍යක් සම්බුද්ධ සර්‍වඥ රජෝත්තමයානන් වහන්සේ; යෙන, යම් තැනෙක්හිද; තෙන, එතන්හි; උපසංකමි, (පෙහෙවස් සමාදන්ව සුගන්ධ මාලාදීන්ගත් අත්ඇතිව) එළඹියාය; උපසංකමිත්වා, ධර්‍මශ්‍රවණාදි කෘත්‍යයට යෝග්‍යවූ ආසන්නතර (ස්ථානයට) පැමිණ; භගවන්තං, (ඓශ්චර්‍ය්‍යපූර්‍ණ්‍යයසශ්‍රීසංකල්ප සිද්ධිප්‍රයත්නය යන සාධිගුණ්‍යතායෙන් සම්පූර්ණවූ) සර්‍වඥයන් වහන්සේට; අභිවාදෙත්වා, පසඟපිහිටුවා වැඳ; එකමන්තං නිසීදි, (අෂ්ටවිධ නිෂද්‍ය දෝෂයන් දුරුකොට) එකත්පස්ව හුන්නාය; එකමන්තං නිසින්නාඛො, (නැමද) එකත්පස්ව හුන්නාමවූ; මිගාරමාතරං, මිගාරමාතෘවූ; විසාඛං, විශාඛා (උපාසිකා) වන්ට; භගවා, භාග්‍යවතුන් වහන්සේ; එතදවොච, (මේ මතු කියන වචනයෙන්) මෙසේ වදාළසේක.

හන්ද කුතො නු ත්වං විසාඛෙ ආගච්ඡසි දිවා දිවස්සාති; උපොසථාහං භන්තෙ අජ්ජ උපවසාමීති.

විසාඛෙ, විශාඛාව; හන්ද, කිමෙක්ද; ත්වං, තෝ; දිවාදිවස්ස, දිනයාගේ මධ්‍යාහ්ණ වේලෙහි හෙවත් මේ දෙවෙනි දවල්; කුතොනු ආගච්ඡසීති, කොසිසිට එන්නෙහිද (කුමක් කෙරෙමින් ඇවිදිනෙහිදැයි) යන; එතං, මේ වචනය; අවොච, වදාළසේක; භන්තෙ, ස්වාමීන් වහන්ස; අහං, මම; අජ්ජ, අද (දවස්හි) උපොසථං උපවසාමීති, පෙහෙවස් සමාදන්ව වෙසෙමියි දැන්වූවාය.

තයො ඛො මෙ විසාඛෙ උපොසථා කතමෙ තයො ගොපාලකූපොසථො නිගණ්ඨූපොසථො අරියූපොසථො.

විසාඛෙ, විශාඛාව; ඉමෙ උපොසථා, මේ උපෝසථයෝ; තයො ඛො, තුන්දෙනෙක්ම (වන්නාහු)ය; කතමෙ තයො, ඔහු තුන්දෙන කවරහුද; ගොපාලකූපොසථො, ගොපල්ලන්හා (උපචිත හෙවත්) උපමිශ්‍ර උපෝසථය; නිගණ්ඨූපොසථො, නිගණ්ඨ උපෝසථය; අරියූපොසථොති, ආර්‍ය්‍ය උපෝසථය (යනමොහු තුන්දෙනායි;)

කථඤ්ච විසාඛෙ ගොපාලකූපොසථො හොති සෙය්‍යථාපි විසාඛෙ ගොපාලකො සායණ්හසමයං සාමිකානං ගාවො නීයාදෙත්වා ඉතිපටිසංචික්ඛති අජ්ජඛො ගාවො අමුකස්මිංච අමුකස්මිංච පදෙසෙ චරිංසු අමුකස්මිංච අමුකස්මිංච පදෙසෙ පානියානි අපංසු ස්වෙදානි ගාවො අමුකස්මිංච අමුකස්මිංච පදෙසෙ චරිස්සන්ති අමුකස්මිංච අමුකස්මිංච පදෙසෙ පානියානි පිවිස්සන්තීති එවමෙවඛො විසා

ධෙ ඉධෙකච්චො උපොසථිකො ඉතිපටිසංචික්ඛති අහංඛ්වජ්ජ ඉදඤ්චිදඤ්ච ඛාදනීයං ඛාදිං ඉදඤ්චිදඤ්ච භොජනීයං භුඤ්ජිං ස්වාහං ඉදඤ්චිදඤ්ච ඛාදනීයං ඛාදිස්සාමි ඉදඤ්චිදඤ්ච භොජනීයං භුඤ්ජිස්සාමි ති සො තෙන ලොභෙන අභිජ්ඣා සහගතෙන චෙතසා දිවසං අතිනාමෙති එවංඛො විසාඛෙ ගොපාලකුපොසථො හොති එවං උපවුත්ථො ඛො විසාඛෙ ගොපාලකුපොසථො න මහප්ඵලො හොති න මහානිසංසො න මහාජුතිකො න මහාවිප්ඵාරො

විසාඛෙ, විශාඛාව; කථඤ්ච ගොපාලකුපොසථො හොති, (ඔවුන් අතුරෙන්) ගොපාලක උපෝසථය කෙසේවේද; විසාඛෙ, විශාඛාව; සෙය්‍යථාපි, යම්සේ; ගොපාලකො, ගවපාලතෙම; සායණ්හසමයං, සවස්වේලෙහි; සාමිකානං, හිමියන්ට; ගාවො නීය්‍යාදෙත්වා, (මොහු තොප තොපගේ ගවයෝයයි) ගෙරින් පාවාදී; ඉතිපටිසංචික්ඛති, මෙසේ ප්‍රත්‍යවේක්‍ෂා කරන්නේය; අජ්ජඛො, අදවනාහි; ගාවො, ගෙරිහු; අමුකම්හි අමුකම්හි පදෙසෙ, අසවල් අසවල් ප්‍රදෙශයෙහි; චරිංසු, ගෝචර ග්‍රහනය කළාහුය; අමුකම්හි අමුකම්හි පදෙසෙ, අසවල් අසවල් ප්‍රදෙශයෙහි; පානීයානි අපංසු, පැන්පූවාහුය; ස්වේදානි, සෙට්වනාහි; ගාවො, ගෙරිහු; අමුකම්හි අමුකම්හිපදෙසෙ, අසවල් අසවල්ප්‍රදෙශයෙහි; චරිස්සන්ති, ගෝචර ග්‍රහනයකෙරෙති; අමුකම්හි අමුකම්හිපදෙසෙ, අසවල් අසවල් ප්‍රදෙශයෙහි; පානීයානි පිවිස්සන්තීති, පැන් බොන්නාහුයයි; ඉතිපටිසංචික්ඛති, (තමාගෙට ගොන් යමක් අනුභවකොට ඇදපත්තේ වැදහොත්තේ) මෙසේ ප්‍රත්‍යවෙක්‍ෂා කරන්නේය; විසාඛෙ, විශාඛාව; එවමෙවඛො, එපරිද්දෙන්ම; ඉධ, මේ ලොකයෙහි; උපොසථිකො, පෙහෙවස් සමාදන්වූ; එකච්චො, සමහර පුද්ගලයෙක්තෙම; ඉතිපටිසංචික්ඛති, මෙසේ ප්‍රත්‍යවෙක්‍ෂා කරන්නේය—

අහංඛො, මම වනාහි; අජ්ජ, අද; ඉදඤ්චිදඤ්ච ඛාදනීයං ඛාදිං (පූපාදී) මෙබඳු මෙබඳු ඛාද්‍ය විකෘතියක් කෑයෙමි; ඉදඤ්චිදඤ්ච භොජනීයං භුඤ්ජිං, (ඔදනාදී) මෙබඳු මෙබඳු භෝජනයක් අනුභව කෙලෙමි; අහං, මම; ස්වේදානි, සෙටවනාහි; ඉදඤ්චිදඤ්ච ඛාදනීයං ඛාදිස්සාමි, මෙබඳු මෙබඳු ඛාද්‍ය විකෘතියක් කම්යි; ඉදඤ්චිදඤ්ච භොජනීයං භුඤ්ජිස්සාමීති, මෙබඳු මෙබඳු භෝජනයක් අනුභවකෙරෙම්යි; ඉතිපටිසංචික්ඛති, මෙසේප්‍රත්‍යවෙක්‍ෂා කරන්නේය; සො, ඒ පුද්ගලතෙම; අභිජ්ඣාසහගතෙන චෙතසා, තෘෂ්ණාවෙන් සම්ප්‍රයුක්තවූ චිත්තයෙන්(සමුපලක්‍ෂිතවූ;)තෙන ලොභෙන, ඒලොභයෙන්; දිවසං අතිනාමෙති, දිනය ඉක්මවන්

නේය; විසාඛෙ, විශාඛාව; එවං ඛො ගොපාලකූපොසථො හොති, මෙසේ ගොපල්ලන් හාසම්ග උපචිත උපෝසථය වන්නේය; විසාඛෙ, විශාඛාව; එවං උපවුත්‍ථො ඛො, මෙසේ සමාදන්ව රක්‍ෂා කරණලද්දාවූ; ගොපාලකූ පොසථො, ගවපාල උපෝසථයතෙම; න මහප්ඵලොහොති,(විපාකඵලයෙන්)මහත්නොවන්නේය; න මහානිසංසො, (විපාකානිසංසයෙන්) මහානිසංස නොවන්නේය; න මහාජුතිකො, (විපාකොභාසයෙන්) මහත් ඕභාස නොවන්නේය; න මහා විප්ඵාරෙ, (විපාක විස්ඵාරය නොමහත් බැවින්) මහත් පැතිරීම් නැත්තේය.

කථංච විසාඛෙ නිගණ්ඨූපොසථො හොති අත්‍ථිවිසාඛෙ නිගණ්ඨානාම සමණජාති තෙ සාවකං එවං සමාදපෙන්ති එහිත්වං අම්භො පුරිස යෙ පුරත්‍ථිමාය දිසාය පාණා පරං යොජනසතං තෙසු දණ්ඩං නික්ඛිපාහි යෙ පච්ඡිමාය දිසාය පාණා පරං යොජනසතං තෙසු දණ්ඩං නික්ඛි පාහි යෙ උත්තරාය දිසාය පාණා පරං යොජනසතං තෙසු දණ්ඩං නික්ඛිපාහි යෙ දක්ඛිණාය දිසාය පාණා පරං යොජනසතං තෙසු දණ්ඩං නික්ඛිපාහීති ඉති එකච්චානං පාණානං අනුද්දයාය අනුකම්පාය සමාදපෙන්ති එකච්චානං පාණානං නානුද්දයාය නානුකම්පාය සමාදපෙන්ති තෙ තදහු පොසථෙ සාවකං එවං සමාදපෙන්ති එහිත්වං අම්භො පුරිස සබ්බචෙලානි නික්ඛිපිත්වා එවං වදෙහි නාහං ක්වචිනි කස්සචි නකිඤ්චනතස්මිං නච මම ක්වචිනි කස්සචි කිඤ්චනං නත්‍ථීති, ජනන්ති ඛො පනස්ස මාතාපිතරො අයං අම්හාකං පුත්තොති සොපි ජනාති ඉමෙ මය්හං මාතාපිතරොති ජනාති ඛොපනස්ස පුත්තදාරො අයං මය්හං භත්තාති සොපි ජනාති අයං මය්හං පුත්තදාරොති ජනන්ති ඛො පනස්ස දාසකම්ම කරපොරිසා අයං අම්හාකං අය්‍යොති සොපි ජනාති ඉමෙ මය්හං දාසකම්මකරපොරිසාති ඉති ඉමස්මිං සමයෙ සබ්බ සමාදපෙතබ්බො මුසාවාදෙ තස්මිං සමයෙ සමාදපෙන්ති ඉදමස්ස මුසාවාදස්මිං වදාමි සොතස්සා රත්තියා අච්චයෙන තෙ භොගෙ අදින්නංයෙව පරිභුඤ්ජති ඉදමස්ස අදින්නාදානස්මිං වදාමි එවං ඛො විසාඛෙ නිගණ්ඨූ පොසොථො හොති එවං උපවුත්‍ථො ඛො විසාඛෙ නිගණ්ඨූ පොසථො න මහප්ඵලො හොති න මහානි සංසො න මහාජුතිකො න මහාවිප්ඵාරො.

විසාඛෙ, විශාඛාව; කථංච නිගණ්ඨූපොසථො හොති, කෙසේ නිගණ්ඨ උපොසථයවේද; විසාඛෙ, විශාඛාව; නිගණ්ඨානාම, සසර ගැටලන කෙලෙස්ගැට අපට නැතැයි කියන හෙයින් නිගණ්ඨනම්වූ; සමණජාති අත්‍ථි, ශ්‍රමණ ජාතියෙක් ඇත; තෙ,

ඒ නිගණ්ඨ ශ්‍රමණයෝ; සාවකං, (තමන්ගේ) ශ්‍රාවකයා; එවං
සමාදපෙන්ති, මෙසේ සමාදන් කරවති; අම්භොපුරිස, එම්බල
පුරුෂය; ත්වං, තෝ; එහි, (මෙසේ) එව; පුරත්ථිමාය දිසාය, පූර්වදි
ශාවෙහි; පරං යොජනසතං, සියක් යොත්නක් ඉක්ම (එසින්
මත්තෙහි වාශයකරන්නාවූ); යෙ පාණා, යම් සත්ව කෙනෙක්
ඇද්ද; තෙසූ, (සියක් යොත්නෙන් මත්තෙහි රැස්වසිටි) ඒසත්
වයන් විෂයෙහි; දණ්ඩං නික්ඛිපාහි, දණ්ඩනික්ෂෙපනය කරව
(හෙවත් බහාතබනලද දණ්ඩමුද්ගරාදීන් ඇතිවව); පච්ඡිමාය
දිසාය, පශ්චිම දිශාවෙහි; පරංයොජන සතං, සියක් යොත්නක්
ඉක්ම (එසින් මත්තෙහි වාසයකරන්නාවූ); යෙ පාණා, යම්සත්
ව කෙනෙක් ඇද්ද; තෙසූ, ඒ (සියක්යොත්නෙන් මත්තෙහිසිටි)
සත්වයන් විෂයෙහි; දණ්ඩං නික්ඛිපාහි, දණ්ඩනික්ෂෙපනය
කර හෙවත් බහාතබනලද දණ්ඩමුද්ගරාදීන් ඇතිවව; උත්ත
රායදිසාය, උතුරුදිශාවෙහි; පරං යොජනසතං, සියක්යොත්
නක් ඉක්ම (එසින් මත්තෙහි වාශය කරන්නාවූ); යෙපාණා,
යම් සත්වකෙනෙක් ඇද්ද; තෙසූ, ඒ (සියක්යොත්නෙන් මත්
තෙහි සිටි) සත්වයන් විෂයෙහි; දණ්ඩං නික්ඛිපාහි, දණ්ඩ
නික්ෂෙපනය කරව· හෙවත් සත්වහිංසා පිණිස නොගණ්ණා
ලද දණ්ඩ මුද්ගරාදීන් ඇතිවව; දක්ඛිණාය දිසාය, දක්ෂිණදිශා
වෙහි; පරං යොජනසතං, සියක්යොත්නක් ඉක්ම (එසින්මත්
තෙහි වාශයකරන්නාවූ); යෙ පාණා, යම්සත්ව කෙනෙක් ඇද්ද;
තෙසූ, ඒ (සියක් යොත්නෙන්මත්තෙහි සිටි) සත්වයන් විෂයෙහි;
දණ්ඩං නික්ඛිපාහිති, දණ්ඩනික්ෂෙපනය කරවයි. හෙවත්
සත්වහිංසා පිණිස නොගන්නාලද දණ්ඩ මුද්ගරාදීන් ඇතිව
වයි; එවං සමාදපෙන්ති, මෙසේ සමාදන්කරවති; ඉති, මෙසේ;
එකච්චානං පාණානං, සමහර සත්වකෙනෙකුන්ට; අනුද්දයාය,
කරුණා පිණිස; අනුකම්පාය, අනුකම්පා පිණිස; සමාදපෙන්ති,
සමාදන්කරවති; එකච්චානං පාණානං, සමහර සත්වකෙනෙ
කුන්ට; නානුද්දයාය, නිෂ්කරුණා පිණිස; නානුකම්පාය, අකා
රුණික භාවය පිණිස; සමාදපෙන්ති, සමාදන්කරවති; තෙ,
ඒ නිගණ්ඨ ශ්‍රමණයෝ; තදහුපොසථෙ, එදවස පැමිණි (පස
ළොස්වක්) පොහෝදිනයෙහි; සාවකං, (තමන්ගේ) ශ්‍රාවකයා;
එවං සමාදපෙන්ති, මෙසේ සමාදන්කරවති; අම්භොපුරිස, එම්
බාපුරුෂය; ත්වං, තෝ; එහි, (මෙසේ) එව; සබ්බචෙලානි, (හන්
පෙරවි) සියලුවස්ත්‍රයන්; නික්ඛිපිත්වා, නික්ෂෙපනයකොට (හෙ
වත් බහා); එවං වදෙහි, මෙසේ කියව; අහං, මම; ක්වචිනි, කිසි
තැනෙක්හි; කස්සචි, අන්කිසිවෙකුහට; නකිඤ්චනතස්මිං, පළි

රොධ නොවෙමි; මම, මා සම්බන්ධව (හෙවත් මාගේ); ක්වචනි,
(බාහ්‍යාභ්‍යන්තරයෙහිවූ;) කිසි පරිෂ්කාරයකත්; තස්සච, කිසිවක්
හට; කිඤ්චනං නත්‍ථි, පලිරෙබධයෙක් නැතැයි (හෙවත් සුන්ප
ලිබෝධ ඇත්තෙමියි); එවංවදෙහිති, මෙසේ කියවසිකියා; එවං
සමාදපෙනාති, මෙසේ සමාදන්කරවති; අස්සපන, ඒ නිගණ්ඨ
ශ්‍රාවකයාගේ වනාහි; මාතාපිතරො, මාතෘ පිතෘ දෙදෙනා; අයං,
මේතෙම; අම්හාකං පුත්තොති, අපගේ පුත්‍රයයිකියා; ජානන්ති
ඛො, දැනගන්නාහුමය; සොපි, ඒ පුත්‍ර තෙමේද; ඉමෙ, මොහු;
මය්හං මාතාපිතරොති, මාගේ මාතෘපිතෘ දෙදෙනායයිකියා; ජා
නාති, දන්නේය; අස්සපන, (ඒනිගණ්ඨ) ශ්‍රාවකයාගේ වනාහි;
පුත්තදාරො, පුත්‍රදාරවො; අයං, මේතෙම; මය්හං භත්තාති,
මගේ ස්වාමිහුයයි කියා; ජානාතිඛො, දැනගන්නාහුමය; සොපි,
ඒ ස්වාමිපුරුෂද; අයං, මේතෙම; මය්හං පුත්තදාරොති, මාගේ
පුත්‍රදාරවෝයයි කියා; ජානාති, දැනගන්නේය; අස්සපන, ඒ
(නිගණ්ඨ) ශ්‍රාවකයාගේ වනාහි; දාසකම්මකරපොරිසා, දාසි
දස්කම්කරු පුරුෂයෝ; අයං, මේතෙම; අම්හාකං අය්‍යොති, අප
ගේ ආය්‍යීයන් වහන්සේයයි කියා; ජානාතිඛො, දැනා
ගන්නාහුමය; සොපි, ඒ (ස්වාමිපුරුෂද; ඉමෙ, මොහු; මය්හංදාස
කම්මකර පොරිසාති, මාගේ දාසිදස්කම්කරු පුරුෂයෝයයි කියා;
ජානාති, දැනගන්නේය; ඉති, මෙසේ; ඉමස්මිං සමයෙ, මේකාල
යෙහි; සමාදපෙතබ්බො, සමාදන්කරවිය යුතුවූ; යෙ, යෙ සත්ව
කෙනෙක් ඇද්ද; තෙ සබ්බෙ, එසියල්ලවුන්; තස්මිං සමයෙ, ඒ
කල්හි; මුසාවාදෙ සමාදපෙනාති, මෘෂාවාදයෙහි සමාදන්කරවති;
ඉදං, මේතෙම; අස්ස, ඒ නිගණ්ඨ ශ්‍රාවකයාගේ; මුසාවාදස්මිං
වදමි, මෘෂාවාදයයි කියමි; සො, ඒ නිගණ්ඨශ්‍රාවකතෙම; තස්සා
රත්තියා අච්චයෙන, ඒ රාත්‍රියගේ ඇවෑමෙන් හෙවත් රෑ පාන්ව
ගියකල්හි; අදින්නංඑව, (කිසිවක්හු විසින්) නුදුන්නාමවූ; තෙ
භොගෙ, (භුජ්ජිතව්‍යවීයෙන් භොගනාම්වූ) ඒ මවපියයාගුහකතා
දීන්; පරිභුඤ්ජති, දෙවෙනි දවස්හි ගෙණ අනුභව කරන්නේය;
ඉදං, මේතෙම; අස්ස, ඒනිගණ්ඨ ශ්‍රාවකයාගේ; අදින්නාදා
නස්මිං වදමි, අදත්තාදානයයි කියමි; විසාඛෙ, විශාඛාව; එවංඛො
නිගණ්ඨු පොසථොහොති, මෙසේ නිගණ්ඨ උපොසථය වන්
නේය; විසාඛෙ, විශාඛාව; එවං උපවුත්තොඛො, මෙසේ සමාදන්ව
විසූ; නිගණ්ඨුපොසථො, නිගණ්ඨුපොසථයතෙම; න මහප්ඵලො
හොති, (විපාකඵල හෙයින්) නිෂ්ඵලවන්නේය; න මහානි
සංසො, (විපාකානිසංස වශයෙන්) අනුසස් නැත්තේය; න මහ
ජුතිකො, (විපාකාලොකයෙන්) නිරාලොක වන්නේය; න මහා
විප්ඵාරො, (විපාකස්ඵරණයෙන්) පැතිරීම් නැත්තේය ——

කථඤ්ච විසාඛෙ අරියූපොසථො හොති උපක්කිලිට්ඨස්ස විසාඛෙ චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති ඉධවිසාඛෙ අරියසාවකො තථාගතං අනුස්සරති ඉතිපිසො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථාදෙවමනුස්සානං බුද්ධො භගවාති, තස්ස තථාගතං අනුස්සරතො චිත්තං පසීදති පාමොජ්ජං උප්පජ්ජති යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති—

විසාඛෙ, විශාඛාව; අරියූපොසථො, ආර්‍ය්‍ය උපෝසථයතෙම; කථඤ්චහොති, කෙසේවේද; විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස චිත්තස්ස, (කාමච්ඡන්දනීවරනාදී පඤ්චොපක්ලේශයන් විසින්) උපක්ලිෂ්ටවූ චිත්තයාගේ; උපක්කමෙන, (වෙනවෙනම පැවැති පුරුෂ)වික්‍රමයෙන් නොහොත් උපායෙන්; පරියොදපනා හොති, පිරිසිදුකිර්ම වන්නේය; විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස චිත්තස්ස, (කාමච්ඡන්දනීවාරණාදී පඤ්චොපක්ලේශයන් විසින්) උපක්ලිෂ්ටවූ චිත්තයාගේ; උපක්කමෙන, (වෙනවෙන පැවති පුරුෂ) වික්‍රමයෙන් නොහොත් උපායෙන්; කථඤ්ච පරියොදපනා හොති, කෙසේ පිරිසිදුබව වන්නේද; විසාඛෙ, විශාඛාව; ඉධ, මේ ලොකයෙහි; අරියසාවකො, ආර්‍ය්‍යශ්‍රාවකතෙම; තථාගතං අනුස්සරති, 'ඉතිපිසොභගවා—පෙ—බුද්ධොභගවා' යි කියා; තථාගතයන්වහන්සේගේ (නවාකාරයකින් සීලසමාධ්‍යාදී සියළු ලෞකිකලෝකෝත්තර) බුදුගුණසිහිකරන්නේය; (කෙසේද) සො භගවා, ඒ භාග්‍යවතුන් වහන්සේ; ඉතිපි අරහං, සර්වක්ලේශයන් කෙරෙන් දුරුවූ බැවින්ද රාගාදී කෙලෙස් නැමති ශත්‍රූන් මාර්ගඥානයෙන් සමූලඝාතව නැසූහෙයින්ද බෝධිමූලයෙහි වීර්‍ය්‍ය නැමති පාදයෙන් සිල්නැමති පෘථිවියෙහි සිට අනවද්‍ය ධර්මදානශාඛක ශ්‍රද්ධානැමති හස්තයෙන් කායකර්මාදී සකලකර්මක්ෂයකර ඥානයෙන් සමාධිශිලෙහි මුවහත්තබනලද මාර්ගඥානනැමති පරශුවගෙණ අවිද්‍යාමය නාභි ඇති ජරාමරණනැමති නිම්වලලුඇති අවිඥාත පූර්වකෝටිඇති සංසාර චක්‍රයාගේ සංස්කාර විඥාණ නාමරූප ෂඩායතන ස්පර්ශ වෙදනා තෘෂ්ණා උපාදාන භව ජාති නැමති අරයන් විගත විධ්වංසන කරණයෙන්ද බ්‍රහ්මාමර නර නාග ගරුඩ ගන්ධර්ව සිද්ධ විද්‍යාධර යක්ෂ රාක්ෂාදීන් විසින් කරණු ලබන උදාරතර ප්‍රත්‍යය ප්‍රතිපත්ති පූජාවට යෝග්‍ය හෙයින්ද ලොභ ද්වෙෂාදී පාපහේතූන් සුප්‍රහීණ බැවින්ද රහසක් පවුනොකරණ හෙයින්ද යන මෙතෙක්කාර

ණයෙන් අභිත්නම් වනසේක; සො භගවා, ඒ භාග්‍යවතුන්
වහන්සේ; ඉතිපි සම්මාසම්බුද්ධො, අවිපරීතකොට පරප්‍රත්‍යය
නොවී ස්වලක්‍ෂණ සාමාන්‍ය ලක්‍ෂණ වශයෙන් විශිෂ්ටඥාන
යෙන් දතයුතු චතුස්සත්‍ය ධර්මයන් පූර්වභාගයෙහි විදර්ශනාඥාන
යෙන්ද අධිගම ක්‍ෂණයෙහි මාර්ගඥානයෙන්ද අපරභාගයෙහි
සර්වඥතාඥානයෙන්ද අවබොධ කෙළේයයන මෙතෙක් කාර
ණයෙන් සම්‍යක්සම්බුද්ධ නම්වනසේක; සොභගවා, සංසාරචක්‍රය
මථනය කළාවූ ඒ භාග්‍යවතුන් වහන්සේ; ඉතිපි විජ්ජාචරණ
සම්පන්නො, ස්වවිශය විදිත කරණාර්ථයෙන් විද්‍යානම්වූ විදර්ශ
නාඥාන මනොමය ඍද්ධි ඍද්ධිවිධ දිව්‍යශ්‍රොත්‍ර පරචිත්ත විජ
ණන පූර්වේනිවාසානුස්මෘති දිව්‍යචක්‍ෂුරභිඥාණාදී අෂ්ටවිද්‍යා
වෙන් හා ඉන්ද්‍රියයෙහි ගුප්තද්වාරතාය භොජනයෙහි මාත්‍රඥ
බවය ජාගරියානුයෝගය ශ්‍රද්ධා හ්‍රී අනපත්‍රපා බාහුශ්‍රැත්‍ය වීර්‍ය්‍ය
ස්මෘති ප්‍රඥාය යන මේ එකොළොස්හා රූපාවචර ධ්‍යානසතරය
යන පසළොස් චරණ ධර්මයෙන් යුක්තහෙයින් විජ්ජාචරණ සම්
පන්නනාම් වනසේක; සොභගවා, මාරරැප්පු මර්දනය කළාවූ ඒ
භාග්‍යවතුන් වහන්සේ; ඉතිපි සුගතො, සෝභණගති සංඛ්‍යාත
විශුද්ධාර්‍ය්‍ය මාර්ගගතියෙන් නිර්වාණයට ක්‍ෂිප්‍රාභිඥ වශයෙන් ගිය
හෙයින්ද නොහොත් දීපඞ්කර පාදමූලයෙහි පටන් බෝධිමූලය
දක්වා සමත්‍රිංශත් පාරමී ධර්මයන් පූරන්නාවූ අවිපරීත ප්‍රති
පත්තියෙන් සියලු සත්ත්වයන්ට හිත සැපඑලවමින් ශාශ්ව
තෝච්ඡේද කාමසුඛ ආත්ම කලමථය යන චතුරන්තරයට නො
ගොස් ආර්‍ය්‍යමාර්ගගතියෙන් මනාකොට ගියහෙයින්ද සකලසංස්
කාර ප්‍රවෘත්තීන්ගේ අභාවයෙන් ඒ ශාන්ත සුන්දරවූ අමෘත
මහා නිර්වාණයට ගියහෙයින්ද තත්තත් මාර්ගයෙන් ප්‍රහීණ කෙලෙ
ශයන් අපුනරාවෘත්තිකරණ වශයෙන්මනාකොට ගියහෙයින්ද
යුක්ත වචණයන් නිශ්පාද්‍යකල්හි සත්‍යාර්ථ ප්‍රියවචණයෙන්
කථණයකලහෙයින්ද ද්වාත්‍රිංශත්වර මහාපුරුෂලක්‍ෂණ අසීත්‍යා
නු ව්‍යඤ්ජන ධ්‍යාම ප්‍රභාකේතු මාලානු රඤ්ජිත නිජදෙහධර රූප
කාය සම්පත්තියක් ඇතිහෙයින්ද ද්‍රුතවිලම්භිත ස්ඛලිතාණු කඤ්
නිස්පිඩනෝත් කුටිතා කුලතාදී දෝසරහිතව අපහශිත රාජහං
ශ වෘෂභ වරවාරණ මෘගරාජගමණ විලාශඇති සෝභනවූ කා
යගමණින්හා විපුල විමල කරුණාස්මෘති වීර්‍ය්‍යාදිගුණ විශෙෂ
සහිත ඥාණගමණින් යුක්ත හෙයින්ද යන මෙතෙක් කාරණ
යෙන් සුගතනාම් වනසේක; සොභගවා, ඒ භාග්‍යවතුන් වහන්
සේ; ඉතිපි ලොකවිදූ——

"එකොලොකො සබ්බෙසත්තා ආහාරට්ඨිතිකා වෙලොකානා )

චරූපඤ්ච තයොලොකා තිස්සොවෙදනා චත්තාරොලොකා චත්තාරොආහාරා පඤ්චලොකා පඤ්චුපාදානක්ඛන්ධා ඡලොකා ඡ අජ්ඣත්තිකානි ආයතනානි සත්තලොකා සත්තවිඤ්ඤාණට්ඨිතියො අට්ඨලොකා අට්ඨලොකධම්මා නවලොකා නවසත්තාවාසා දසලොකා දසආයතනානි ද්වාදසලොකා ද්වාදසායතනානි අට්ඨාරසලොකා අට්ඨාරස ධාතුයො''

යනාදීන් දක්වනලද ඉන්ද්‍රිය නිරින්ද්‍රිය ප්‍රතිබද්ධ ස්කන්ධයන්ගේ සමූහ සංඛ්‍යාත සංස්කාර ලෝකයද

''සබ්බසම්පිසත්තානං ආසයං ජානාති අනුසයං ජානාති චරිතං ජානාති අධිමුත්තිං ජානාති අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ භබ්බා භබ්බෙ''.

යනාදීන් දක්වනලද ඉන්ද්‍රිය ප්‍රතිබද්ධ ස්කන්ධයන්ගේ සමූහ සංඛ්‍යාත සත්වලෝකයද

''යාවතාචන්දිම සූරියා පරිහරන්ති දිසාභන්ති විරෙචනා''

යනාදීන් දක්වනලද අයමින් විතරින් දෙලොස්ලක්ෂ තුන්දහස් සාරසිය පණස් යොදුන් පමණ ඇති වටින් සතිස්ලක්ෂ දසදහස් තුන්සිය පණස් යොදුන් පමණ ඇති චක්‍රවාටය දෙලක්ෂ සතලිස් දහසක් යොදුන් පමණ බොලඇති මහාපස් පොළවය. ඒපොලවදූරු සාරලක්ෂ අසූදහසක් යොදුන් පමණ බොල ඇති ජලපොළවය ඒජලපොවදූරු නවලක්ෂ සැටදහසක් යොදුන් පමණ බොලඇති වාපොළවය, මෙසේසිටි මේ පොළව සුවාසූදහසක් යොදුන් සාගරයෙහි ගැලිසිටි සුවාසූදහසක්යොදුන් පමණ නැගීසිටි මහාමේරු පර්වතය, ඒ මහාමේරු පර්වතයට අඩාඩ ප්‍රමාණයෙන් සමුද්‍රයෙහි ගැලි නැගීසිටි දේවයක්ෂාවාස නානාවිධ රත්නයෙන් විචිත්‍රවූ යුගන්ධරෙශධර කරවීක සුදර්ශණ හෙම්න්ධර විනතකාදී සප්තකුල පර්වතයෝය. පන්සියයක්පමණ යොදුන් උසැති අයමින් විතරින් තුන්දහසක් යොදුන් පමණ ඇති සුදර්ශණ චිත්‍රකූට කෛලාශකූට යනාදී සුවාසූදහසක් කූටයෙන් ප්‍රතිමණ්ඩිතවූ හිමාල පර්වතය, මෙම දඹදිවට සලකුණුවූ මුලසිටවෙළප පණස්යොත්නක් පමණඇති එසේම පණස්යොදුන් පමණවූ පචමහා ශාඛාවන්ඇති සියක්යොදුන් පමණ විස්තාරෙන්සදඇති සිසාර තුන්සියක් යොදුන් පමණඇති මහා ජම්බුවෘක්ෂය දෙසාසූ දහසක් යොදුන් පමණ සාගරයෙහි ගැලීසිටි දෙසාසූ දහසක් පමණ නැගීසිටි සක්වළගලය, අයමින් විතරින් උසින් එකුන් පණස් යොදුන් සඳමඩලය, එසේම සමපණස්



ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

යොදුන් හිරුමඩලය, දසදහසක් යොදුන් පමණැති සක් දෙව්රජහට නිවාසවූ තව්තිසා භවනය, එසේම දසදහසක් යොදුන් පමණ අසුරභවනය, හා අවීචිමහානරකයහා ජම්බුවීපය, සත්දහසක් යොදුන් පමණැති අපරගොයානය හා පූර්වවිදේහය, අටදහසක් යොදුන් පමණ ඇති උතුරුකුරු දිවයිනය යන ක්‍ෂුද්‍රද්වීප පන්සියයක් පන්සියයක් පිරිවරකොට ඇති සතර මහා ද්වීපය, යනාදීන් දක්වනලද අනන්තා පරියන්ත ලෝකධාතුයයි කියනලද අනින්ද්‍රිය ප්‍රතිබද්ධරූපයන්ගේ සමූහසංඛ්‍යාත අවකාශ ලෝකයද යනමේ ත්‍රිවිධලෝකය සර්වප්‍රකාරයෙන් අවබෝධකළේය යන මෙතෙක් කාරණයෙන් ලොකවිදූනම් වනසේක; සොභගවා, ඒ භාග්‍යවතුන් වහන්සේ; ඉතිපි අනුත්තරෝ පුරිසදම්මසාරථී, (ඉමස්මිං ලොකෙපරස්මිං වාපන බුද්ධෙන සෙට්ඨො සදිසො නාවිජ්ජති) යනාදීන් සීලසමාධි ප්‍රඥාවිමුක්ති විමුක්තිඥානදර්ශනාදිගුණ විශෙෂයෙන් ආත්මසදෘශාධික පුද්ගලාන්තරයක්හු නැතිහෙයින් දම්‍යගයි කියනලද අපලාල නාගරාජවූලෝදර මහෝදර අග්නිසිඛ ධූමසිඛ ධනපාලාදිවූතිරශ්චීන පුරුෂයන්ද සච්චකනිගණ්ඨිපුත්‍ර අම්බට්ඨමානවක පුෂ්කරශාති සෝනදණ්ඩ කූටදන්ත ඝෝටමුඛ උපාලිගෘහපතිආදිවූ මනුෂ්‍යපුරුෂයන්ද ආලවක සූචිලෝම ඛරලෝම යක්ෂ ශක්‍ර දේවරාජ බක බ්‍රහ්මාදිවූ අමනුෂ්‍ය පුරුෂයන්ද, යන කායවාක් සංයමාදීයෙහි යෙදියයුතු පුරුෂයන් සුදුසු සුදුසු පරිද්දෙන් තදඞ්ග විනයාදියෙහි පිහිටුවන හෙයින්ද යන මෙතෙක් කාරණයෙන් අනුත්තර පුරිසදම්ම සාරථීනම් වනසේක; සොභගවා, ඒ භාග්‍යවතුන්වහන්සේ; ඉතිපි සත්ථා දෙවමනුස්සානං, උත්කෘෂ්ට භව්‍ය සත්වපුද්ගලපරිච්ඡෙද වශයෙන් දිව්‍යමනුෂ්‍යයන්ටහා උපනිශ්‍රය සම්පත්ති ප්‍රදානයෙන් තිර්‍යග්ගතයන්ටද යථායෝග්‍යයෙන් ඓහලෞකිකපාරලෞකික පරමපුරුෂාර්ථය යනමෙයින් අනුශාසනාකරණහෙයින්ද චොරකාන්තාරාදියෙන් සත්වයන් අතික්‍රමණය කොටනිරුපද්‍රව ස්ථානයට පමුණුවන්නාවූ සාර්ථවාහයක්හු සෙයින් ජාතිකාන්තාරාදියෙන් සත්වයන් තරණයකොට නිර්වාණ ක්ෂේමභූමියට පමුණුවන්නේය යන මෙතෙක් කාරණයෙන් ශාස්තෘනම් වනසේක; සොභගවා, ඒ භාග්‍යවතුන් වහන්සේ; ඉතිපිබුද්ධො, භූතභව්‍යත් වර්තමාන ස්ථාවරජඞ්ගම නිත්‍යාදිසකලඥෙයමණ්ඩලය කරතලාමලක ක්‍රමයෙන් අවබෝධකළ හෙයින්ද නොහොත් සම්මාසම්බුද්ධ පදයෙන් ප්‍රතිවෙධ ඥානානුභාවය ප්‍රකාශිත බැවින්ද නානානය නිපුණ අනෙකාධ්‍යාස සමුත්ථානාර්ථ ව්‍යඤ්ජන සම්පන්න විවිධ ප්‍රාතිහාර්‍යයෙන් යුක්ත සද්ධර්ම

දෙශනාඥනානුභාව සමායෝගයෙන්ද යන මෙතෙක් කාරණයෙන් බුඩනම් වනාසේක; සොභගවා, ඒ භාග්‍යවතුන්වහන්සේ; ඉතිපිභගවා, ලෞකිකලොකෝත්තරහිත සුඛාභි නිර්‍වෘත්තදාන සීලාදී පාරප්‍රාප්ත භාග්‍යයෙන්යුක්තබැවින්ද ලෝභද්වෙෂමොහ විපරීත මනස්කාරාදී ක්ලෙශ සතසහශ්‍රයන් හා සංක්ෂෙපයෙන් ක්ලෙශ ස්කන්ධාභිසංස්කාර මෘත්‍යුදේව පුත්‍රයන පඤ්චමාරයන්භග්නකළහෙයින්ද ඓශ්වර්‍ය්‍ය පූර්‍ණ්‍යයශශ්‍රී සංකල්පසිද්ධිප්‍රයත්නාය යන ෂාඩ්ගුණ්‍යයෙන් පරිපූර්ණහෙයින්ද කුශලාදී ධර්‍මයන් පඤ්චස්කන්ධ ද්වාදශායතනාෂ්ටාදස ධාතු චතුස්සත්‍ය ද්වාවිසතීන්ද්‍රිය ද්වාදසාඞ්ගප්‍රතීත්‍ය සමුත්පාදචතුස්මෘති ප්‍රස්ථානසම්‍යක්ප්‍රධානාදී වශයෙන් විභාගකළහෙයින්ද දිව්‍යබ්‍රහ්මවිහාරකාය චිත්තොපධි විවේක ශූන්‍යතා ප්‍රණිහිත නිමිත්ත විමොක්ෂ පඤ්චාභිඥාදීවූ ලෞකික ලොකොත්තර උත්තරිමනුෂ්‍යධර්‍මයන් භජනයකළ හෙයින්ද කාමරූපාරූප සංඛ්‍යාත භවත්‍රයෙහි තෘෂ්ණාගමනාය අභියත් මාර්ගඥාන මුඛයෙන් වාන්තහෙයින්ද යන මෙතෙක් කාරණයෙන් භගවත්නම් වනාසේක; ඒවං තථාගතංඅනුස්සරතො; මෙසේ ලොව්ලොව්තුරු බුදුගුණ සිහිකරන්නාවූ; තස්ස, ඒ ආර්‍ය්‍ය ශ්‍රාවකයාගේ; චිත්තංපසීදති, සිතප්‍රසන්නතර වන්නේය; පාමොජ්ජං උප්පජ්ජති, ප්‍රමෝද්‍යය උපදවන්නේය; හෙවත් තරුණ ප්‍රීතිය හටගන්නේය; චිත්තස්ස; චිත්තයාගේ; යෙ උපක්කිලෙසා, (නීවරණ සංඛ්‍යාත) යම්උපක්ලෙශ කෙනෙක් ඇද්ද; තෙපහීයන්ති, ඔහු ප්‍රහීණවෙති.

“සෙය්‍යථාපි විසාඛෙ උපක්කිලිට්ඨස්ස සීසස්ස උපක්කමෙන පරියොදපනා හොති කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස සීසස්ස උපක්කමෙන පරියොදපනා හොති කක්කඤ්ච පටිච්ච මත්තිකඤ්ච පටිච්ච උදකඤ්ච පටිච්ච පුරිසස්සච තජ්ජං වායාමං පටිච්ච එවං ඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස සීසස්ස උපක්කමෙන පරියොදපනා හොති එවමෙව ඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති”

විසාඛෙ, විශාඛාව; සෙය්‍යථාපි, යම්සේ; උපක්කිලිට්ඨස්ස සීසස්ස, රජො ජල්ලිකාදීන් උපකිලිෂ්ට ශීර්‍ෂයාගේ; උපක්කමෙන, පුරුෂාකාරයෙන් හෙවත් උපායෙන්; පරියොදපනාහොති, නිර්‍මල බව කිරීමවේද; විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස සීසස්ස, උපක්ලිෂ්ටවූ ශීර්‍ෂයාගේ; උපක්කමෙන, උත්සාහයෙන්; කථඤ්ච පරියොදපනා හොති, කෙසේ නිර්‍මලබව කිරීමවේද; විසාඛෙ, විශාඛාව; කක්කඤ්ච පටිච්ච, නොල්ලිකල්කය නිසාද; මත්තිකඤ්ච

පටිච්ච, මැටිනිසාද; උදකඤ්ච පටිච්ච, දියනිසාද; පුරිසස්ස, පුරුෂයාගේ; තජ්ජං වායාමං පටිච්ච, මනාකොට ඝර්ෂණාදී ඊට සුදුසු ව්‍යායාමයනිසාද; උපක්කිලිට්ඨස්ස සීසස්ස, උපක්ලිෂ්ටවූ ශීර්ෂයාගේ; උපක්කමෙන, උපායෙන්; ඒවංඛො පරියොදපනා හොති, මෙසේ නිර්මලබව කිරීමවන්නේය; විසාඛෙ, විශාඛාව; එවමෙව ඛො, එපරිද්දෙන්ම; උපක්කිලිට්ඨස්ස චිත්තස්ස, නීවරණයන් විසින් උපක්ලිෂ්ටවූ චිත්තයාගේ; උපක්කමෙන, උත්සාහයෙන්; පරියොදපනා හොති, නිර්මලබව කිරීමවන්නේය.

"කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති ඉධ විසාඛෙ අරියසාවකො තථාගතං අනුස්සරති ඉතිපිසො භගවා —පෙ— සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති තස්ස තථාගතං අනුස්සරතො චිත්තං පසීදති පාමොජ්ජං උප්පජ්ජති යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහියන්ති අයං වුච්චති විසාඛෙ අරියසාවකො බ්‍රහ්මූපොසථං උපවසති බ්‍රහ්මුනා සද්ධිං සංවසති බ්‍රහ්මංචස්ස ආරබ්භ චිත්තං පසීදති පාමොජ්ජං උප්පජ්ජති යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහියන්ති එවං ඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති".

විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස චිත්තස්ස; උපක්ලිෂ්ටවූ චිත්තයාගේ; උපක්කමෙන, උත්සාහයෙන්; කථඤ්ච පරියොදපනා හොති, කෙසේ නිර්මලබව වන්නේද; විසාඛෙ, විශාඛාව; ඉධ, මේලෝකයෙහි; අරියසාවකො, ආර්‍ය්‍යශ්‍රාවකතෙම; තථාගතං අනුස්සරති, ඉතිපිසො භගවා අරහං—පෙ—බුද්ධො භගවාති අටකාරණයකින් සීලසමාධ්‍යාදී සියලු ලෞකික ලොකොත්තර බුද්ධගුණානුස්මරණය කරන්නේය; තථාගතං අනුස්සරතො, (මෙසේ ලෞකික ලෝකෝත්තර) බුද්ධගුණානුස්මරණය කරන්නාවූ; තස්ස, ඒ ආර්‍ය්‍යශ්‍රාවකයාගේ; චිත්තං පසීදති, සිත ප්‍රසන්නවන්නේය; පාමුජ්ජං උප්පජ්ජති, ප්‍රමොද්‍යය උපදනේය; චිත්තස්ස, චිත්තයාගේ; යෙ උපක්කිලෙසා, (නීවරණාදිය) යම් උපක්ලෙශ කෙනෙක්ඇද්ද; තෙපහියන්ති, ඔහු ප්‍රහීණවෙති; විසාඛෙ, විශාඛාව; අයං අරියසාවකො, මේ ආර්‍ය්‍යශ්‍රාවකතෙම; බ්‍රහ්මූපොසථං (ශ්‍රෙෂ්ඨාර්ථයෙන් බ්‍රහ්මයයි කියනලද බුද්ධ ගුණානුස්මරණ වශයෙන්) බ්‍රහ්ම උපොසථනම්වූ උපෝෂථය; උපවසති, වෙසෙසි (කියාද); බ්‍රහ්මුණාසද්ධිං (උත්තමාර්ථයෙන් බ්‍රහ්මනම්වූ) බුදුරජාණන් වහන්සේ හාසමග; සංවසතීති, වාසයකරන්නේයයි (කියාද); වුච්චති, කියනුලැබේ; බ්‍රහ්මං ආරබ්භ,

සම්‍යක්සම්බුද්ධ සර්වඥරාජෝත්තමයාණන්වහන්සේ අර්හයා; අස්ස චිත්තං, ඒ ආර්‍ය්‍යශ්‍රාවකයාගේ චිත්තය; පසීදති, පහදනේය; පාමොජ්ජං උප්පජ්ජති, ප්‍රමොද්‍යය උපදනේය; චිත්තස්ස, චිත්තයාගේ; යෙ උපක්කිලෙසා, (නීවරණාදී) යම් උපක්ලේශ කෙනෙක් ඇද්ද; තෙ පහීයන්ති, ඔහු ප්‍රහීණවෙති; විසාඛෙ විශාඛාව; උපක්කිලිට්ඨස්ස චිත්තස්ස, උපක්ලිෂ්ටවූ චිත්තයාගේ; උපක්කමෙන, වීර්‍ය්‍යයෙන්; එවංපරියොදපනා හොති, මෙසේ පිරිසිදුබව වන්නේය.

"උපක්කිලිට්ඨස්ස විසාඛෙ චිත්තස්ස උපක්කමෙනපරියොදපනා හොති කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති ඉධ විසාඛෙ අරියසාවකො ධම්මං අනුස්සරති ස්වාක්ඛාතො භගවතා ධම්මොසන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති තස්ස ධම්මං අනුස්සරතො චිත්තං පසීදති පාමුජ්ජං උප්පජ්ජති යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති සෙය්‍යථාපි විසාඛෙ උපක්කිලිට්ඨස්ස කායස්ස උපක්කමෙන පරියොදපනා හොති කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස කායස්ස උපක්කමෙන පරියොදපනා හොති සොත්තිඤ්ච පටිච්ච චුණ්ණඤ්ච පටිච්ච උදකඤ්ච පටිච්ච පුරිසස්සච තජ්ජං වායාමං පටිච්ච එවංඛො විසාඛෙ උපක්කිලිට්ඨස්සකායස්ස උපක්කමෙන පරියොදපනා හොති එවමෙව ඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති"

විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස චිත්තස්ස, පඤ්චනීවරණයන් විසින් උපක්ලිෂ්ටවූ චිත්තයාගේ; උපක්කමෙන, වීර්‍ය්‍යයෙන්; එවං පරියොදපනා හොති, මෙසේ පිරිසිදුකිරීම වන්නේය; විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස චිත්තස්ස, උපක්ලිෂ්ටවූ චිත්තයාගේ උපක්කමෙන, පුරුෂාකාරයෙන්; කථං පරියොදපනා හොති, කෙසේ පිරිසිදුබව කිරීමවේද; විසාඛෙ, විශාඛාව; ඉධ, මේලෝකයෙහි; අරියසාවකො, ආර්‍ය්‍යශ්‍රාවකතෙම; ධම්මං අනුස්සරති, "ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහි පස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති" යි කියා; ධම්මං අනුස්සරති, සපර්‍ය්‍යාප්තික නවලෝකෝත්තර සද්ධර්මය සිහිකරන්නේය; කෙසේද? භගවතා, භාග්‍යවත් බුදුරජාණන්වහන්සේවිසින්; ධම්මො, සපර්‍ය්‍යාප්තික නවලොකොත්තර සද්ධර්මයතෙම; ස්වාක්ඛාතො, මොනවට දේශනාකරණ ලද්දේය; සන්දිට්ඨිකො, තමන්විසින් ප්‍රත්‍යක්ෂයෙන් දතයුතුය; අකාලිකො, තමාගේඉපැද්මට අනතුරුවම ඵලප්‍රදානයකරණහෙයින්

අකාලිකය; ඒහිපස්සිකො, (ස්වභාවයෙන් විද්‍යමානහෙයින් ද විශෙෂයෙන් පිරිසිදුහෙයින් ද) එරබල යනමේ විසියටසුදුසුය; ඔපනයිකො, (භාවනා වශයෙන් ස්වසන්තානයෙහි ඉපදීමටද ආලම්බනය කරණ වශයෙන් සිත) එලඹීමටද සුදුසුය; විඤ්ඤූහි, (උද්ඝටිතඥාදී සියලු) ප්‍රාඥයන් විසින්; පච්චත්තං, වෙන වෙනම (තම තමන් කෙරෙහි); වෙදිතබ්බො ති, (මාර්ගය භාවිතය ඵලය අධිගතය නිරොධය සාක්ෂාත් කටයුතුය) දතයුත්තේය කියා; ධම්මං අනුස්සරති, ධර්මය සිහිකරන්නේය; ධම්මං අනුස්සරතො, ධර්මය සිහිරන්නාවූ; තස්ස, ඒ ආර්‍ය්‍යශ්‍රාවකයාගේ; චිත්තං පසීදති, සිතපහදනේය; පාමොජ්ජං උප්පජ්ජති, ප්‍රමොද්‍යය උපදනේය; චිත්තස්ස, චිත්තයාගේ; යෙ උපක්කිලෙසා, යම් උපක්ලෙශ නොනොක් ඇද්ද; තෙපහීයන්ති, ඔහු ප්‍රහීණවෙති; විසාඛෙ, විශාඛාව; සෙය්‍යථාපි, යම්සේ; උපක්කිලිට්ඨස්ස කායස්ස, උපක්ලිෂ්ටවූ ශරීරයාගේ; උපක්කමෙන, උත්සාහයෙන්; පරියොදපනා හොති, නිර්මලබවවේද; විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස කායස්ස, (ස්වේදජල්ලිකාදීන්) උපක්ලිෂ්ටවූ ශරීරයාගේ; උපක්කමෙන, උපායෙන්; කථං. පරියොදපනා හොති, කෙසේ නිර්මලබවවේද; විසාඛෙ, විශාඛාව; සොත්තිඤ්ච පටිච්ච, කුරුඳුවැලිනිසාද; උදකඤ්ච පටිච්ච, ජලයනිසාද; පුරිසස්ස, පුරුෂයාගේ; තජ්ජං වායාමං පටිච්ච, ඝර්ෂණාදී රට සුදුසු ව්‍යායාමයනිසාද; උපක්කිලිට්ඨස්ස කායස්ස, උපක්ලිෂ්ටවූ ශරීරයාගේ; උපක්කමෙන, වීර්‍ය්‍යයෙන්; එවං පරියොදපනා හොති, මෙසේ නිර්මලබව වන්නේය; විසාඛෙ, විශාඛාව; එවමෙව ඛො, එපරිද්දෙන්ම; උපක්කිලිට්ඨස්ස චිත්තස්ස, රාගාදීන් කෙලෙසුනාවූ චිත්තයාගේ; උපක්කමෙන, උපායෙන්; පරියොදපනා හොති, නිර්මලකිරීම වන්නේය;

"කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති ඉධ විසාඛෙ අරියසාවකො ධම්මං අනුස්සරති ස්වාක්ඛාතො—පෙ—විඤ්ඤූහීති තස්සධම්මං අනුස්සරතො චිත්තං පසීදති පාමොජ්ජං උප්පජ්ජති යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති අයං වුච්චති විසාඛෙ අරිය සාවකො ධම්මුපොසථං උපවසති ධම්මෙන සද්ධිං සංවසති ධම්මඤ්චස්ස ආරබ්භ චිත්තං පසීදති පාමොජ්ජං උප්පජ්ජති යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති එවංඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති"

විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස චිත්තස්ස, උපක්ලිෂ්ටවූ චිත්තයාගේ; උපක්කමෙන, උපක්‍රමයෙන්; කථං පරියොදපනා හොති, කෙසේ නිර්මලබව කිරීමවේද; විසාඛෙ, විශාඛාව; ඉධ,

මෙලොකයෙහි; අරියසාවකො, ආර්‍යශ්‍රාවකතෙම; ධම්මං අනුස්ස
රති, "ස්වාක්ඛාතො—පෙ—විඤ්ඤූහීති"යි කියා ධර්‍මයසිහිකරන්
නේය; ධම්මං අනුස්සරතො, ධර්‍මය සිහිකරන්නාවූ; තස්ස, ඒ
ආර්‍යශ්‍රාවකයාගේ; චිත්තං පසීදති, සිතපහදනේය; පාමොජ්ජං
උප්පජ්ජති, ප්‍රමොද්‍යය උපදනේය; චිත්තස්ස, චිත්තයා සම්බන්
ධවූ; යෙ උපක්කිලෙසා, (නීවරණාදීහු) යම් උපක්ලෙශ කෙනෙක්
ඇද්ද; තෙපහීයන්ති, ඔහු ප්‍රහීණවෙති; විසාඛෙ, විශාඛාව;
අයං අරියසාවකො, මේ ආර්‍යශ්‍රාවකතෙම; ධම්මූපොසථං උපව
සති, ධම්මූපොසථනම්වූ උපොසථය වෙසෙසිකියාද; ධම්මෙන
සද්ධිංසංවසති, ධර්‍මයහා සමග වෙසෙයි කියාද; වුච්චති, කිය
නුලැබෙයි; ධම්මං ආරබ්භ, සධර්‍මය අරභයා; අස්සචිත්තං, ඒ
ආර්‍යශ්‍රාවකයාගේ චිත්තය; පසීදති, පහදනේය; පාමුජ්ජං
උප්පජ්ජති, ප්‍රමොද්‍යය උපදනේය; චිත්තස්ස, චිත්තයා සම්බන්
ධිවූ; යෙ උපක්කිලෙසා, යම් උපක්ලෙශ කෙනෙක් ඇද්ද; තෙ
පහීයන්ති, ඔහු ප්‍රහීණවෙති; විසාඛෙ, විශාඛාව; උපක්කි
ලිට්ඨස්ස චිත්තස්ස, උපක්ලිෂ්ටවූ චිත්තයාගේ; උපක්කමෙන,
වීර්‍යයෙන්; එවං පරියොදපනා හොති, මෙසේ නිර්‍මලබව කිර්ම
වන්නේය.

"කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරි
යොදපනා හොති ඉධ විසාඛෙ අරියසාවකො සංඝං අනුස්සරති
සුපටිපන්නො භගවතො සාවකසංඝො උජුපටිපන්නො භග
වතො සාවකසංඝො ඤායපටිපන්නො භගවතො සාවකසංඝො
සාමීචිපටිපන්නො භගවතො සාවකසංඝො යදිදං චත්තාරි පුරිස
යුගානි අට්ඨපුරිසපුග්ගලා එසභගවතො සාවකසංඝො ආහුණෙ
ය්‍යො පාහුණෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්ත
රං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති තස්ස සංඝං අනුස්සරතො
චිත්තං පසීදති පාමුජ්ජං උප්පජ්ජති යෙ චිත්තස්ස උපක්කිලෙසා
තෙ පහීයන්ති"

විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස චිත්තස්ස, (පඤ්චනීවරණ
යන් විසින්) උපක්ලිෂ්ටවූ චිත්තයාගේ; උපක්කමෙන, වීර්‍යයෙන්;
කථං පරියොදපනා හොති, කෙසේ නිර්‍මලබව කිරීමවේද; විසා
ඛෙ, විශාඛාව; ඉධ මේ ලොකයෙහි; අරියසාවකො, ආර්‍යශ්‍රාව
කතෙම; සංඝං අනුස්සරති, සංඝයාගේ ගුණසිහි කරන්නේය;
කෙසේද? භගවතො, භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ;
සාවකසංඝො, (ආමන්ත්‍රය මුඛයෙන් දෙශනාකරණලද ධර්‍මශ්‍රව
ණාන්තයෙහි ජාතවූහෙයින් ශ්‍රාවකනම්වූ) අෂ්ටාර්‍යපුද්ගල සංඝ

තෙම; සුපටිපන්නො, මනාව පිළිපන්නේය; භගවතො, භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ; සාවකසංඝො, ශ්‍රාවක සංඝතෙම; උජුපටිපන්නො, (ශාඛගලවඞ්ක අබ්බිද්ධවඞ්ක ගෝමුත්‍රවඞ්කාදීන් විරහිතව) ඍජුව මධ්‍යම ප්‍රතිපත්තියෙන් පිළිපන්නේය; භගවතො, බුදුන්ගේ; සාවකසංඝො, ශ්‍රාවක සංඝතෙම; ඤායපටිපන්නො, නිවන් පිණිස පිළිපන්නේය; භගවතො, බුදුන්ගේ; සාවකසංඝො, ශ්‍රාවක සංඝතෙම; සාමීචිපටිපන්නො, නෛර්වාණානුකූල ප්‍රතිපත්තියට පිළිපන්නේය; ඔහු කවරහයත් යදිදං චත්තාරි පුරිසයුගානි. (යානිඉමානි චත්තාරි පුරිසයුගානි) සෝවාන් මාර්ගස්ථවූද සෝවාන් ඵලස්ථවූද එක්යුගලයක යනාදීන් දක්වනලද යම් මෙසතර පුරුෂයුග්ම කෙනෙක් ඇද්ද; යදිදං අට්ඨපුරිස පුග්ගලා (ශ්‍රොතආපත්ති මාර්ගයෙහි පිහිටි එකෙක ශ්‍රොතආපත්ති ඵලයෙහිපිහිටි එකෙක යනාදීන්දක්වනලද යම් මේ) අෂ්ටපුද්ගල කෙනෙක් ඇද්ද; භගවතො, බුදුන්ගේ; එසො සාවකසංඝො, මේ ශ්‍රාවක සංඝතෙම; ආහුණෙය්‍යො, දුරිනුදු ගෙනගැරලිය යුතුවූ සිව්පසදනයට සුදුසුය; පාහුණෙය්‍යො, අමුත්තුපඬුරු පිළිගන්ට සුදුසුය ගෙවත් කම්ඵල අදහා සකස්කොට සරහාදෙන අමුත්තු මහදන් පිළිගන්ට සුදුසුය; දක්ඛිණෙය්‍යො, පරලොව අදහා දියයුතුදන ප්‍රතිග්‍රහණයට සුදුසුය; අඤ්ජලිකරණීයො, (සියලු ලෝවැස්සන් විසින් දෙහොත් මුදුනෙහිතබා කරණ) නමස්කාරයට සුදුසුය; ලොකස්ස, සමස්තලෝක වාසීන්ගේ; අනුත්තරං, නිරුත්තරවූ ගෙවත් උතුම්වූ; පුඤ්ඤක්ඛෙත්තන්ති, පුණ්‍යක්ෂේත්‍රයකැයි ගෙවත්කුසල් බිජුහටගන්නා කෙතකැයි කියා; සංඝං අනුස්සරති, අෂ්ටාර්‍ය්‍ය පුද්ගල මහාසංඝයාගේ ගුණ සිහිකරන්නේය; සංඝං අනුස්සරතො, (මෙසේ අෂ්ටාර්‍ය්‍යපුද්ගල) සංඝයාගේ ගුණ සිහිකරන්නාවූ; තස්ස ඒ ආර්‍ය්‍යශ්‍රාවකයාගේ; චිත්තංපසීදති, සිත පහදන්නේය; පාමුජ්ජං උප්පජ්ජති, ප්‍රමොද්‍යය උපදන්නේය; චිත්තස්ස, චිත්තයාසම්බන්ධිවූ; යෙ උපක්කිලෙසා, යම් උපක්ලේශ කෙනෙක් ඇද්ද; තෙපහීයන්ති, ඔහු ප්‍රහීණවෙති.——

“සෙය්‍යථාපි විසාඛෙ උපක්කිලිට්ඨස්ස වත්ථස්ස උපක්කමෙන පරියොදපනා හොති කථච විසාඛෙ උපක්කිලිට්ඨස්ස වත්ථස්ස උපක්කමෙන පරියොදපනා හොති උසුමච පටිච්ච ඛාරච පටිච්ච ගොමයච පටිච්ච උදකච පටිච්ච පුරිසස්සච තජ්ජං වායාමං පටිච්ච එවංඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස වත්ථස්ස උපක්කමෙන පරියොදපනා හොති එවමෙවඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති”——

විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස වත්ථස්ස, කෙලසුනු වස්ත්‍රයාගේ; උපක්කමෙන, පුරුෂාකාරයෙන්; සෙය්‍යථාපි පරියොදපනා හොති, යම්සේ නිසකලඞ්ක කිරීමවේද විසාඛෙ විශාඛාව; උපක්කිලිට්ඨස්ස වත්ථස්ස, කෙලසුනු වස්ත්‍රයාගේ; උපක්කමෙන, වීර්‍ය්‍යයෙන්; කථං පරියොදපනා හොති කෙසේනිසකලඞ්ක කිරීමවේද? විසාඛෙ, විශාඛාව; උසුමඤ්ච පටිච්ච, (දෙතුන්වරෙක ග්‍රහණයකරණලද) ඌෂ්ණයනිසාද; ඛාරඤ්ච පටිච්ච, අලුනිසාද; ගොමයඤ්ච පටිච්ච, ගොමනිසාද නොහොත් ගෝමූත්‍ර හා එලුබෙටිනිසාද; උදකඤ්ච පටිච්ච, දියනිසාද; පුරිසස්ස ච, පුරුෂයාගේ; තජ්ජං වායාමං පටිච්ච, ඊටසුදුසු ව්‍යායාමය නිසාද; උපක්කිලිට්ඨස්ස වත්ථස්ස, කෙලසුනු වස්ත්‍රයාගේ; උපක්කමෙන; උත්සාහයෙන්; එවංඛො පරියොදපනා හොති, මෙසේ පිරිසිදුකිරීමවේ; විසාඛෙ, විශාඛාව; එවමෙවඛො, එපරිද්දෙන්ම; උපක්කිලිට්ඨස්සචිත්තස්ස උපක්ලිෂ්ටවූ චිත්තයාගේ; උපක්කමෙන, උත්සාහයෙන්; පරියොදපනා හොති, පිරිසිදුකිරීම වන්නේය.

"කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති ඉධ විසාඛෙ අරියසාවකො සඞ්ඝං අනුස්සරති සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො උජුපටිපන්නො—පෙ— අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති තස්ස සඞ්ඝං අනුස්සරතො චිත්තං පසීදති පාමොජ්ජං උප්පජ්ජති යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති අයංවුච්චති විසාඛෙ අරියසාවකො සඞ්ඝූපොසථං උපවසති සඞ්ඝෙන සද්ධිංසංවසති සඞ්ඝංචස්ස ආරබ්භචිත්තං පසීදති පාමොජ්ජං උප්පජ්ජති යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති එවංඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති".

විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස චිත්තස්ස, උපක්ලිෂ්ටවූ චිත්තයාගේ; උපක්කමෙන, උපායෙන්; කථංපරියොදපනාහොති, කෙසේනිර්මලකිරීමවේද? විසාඛෙ, විශාඛාව; ඉධ මේලෝකයෙහි; අරියසාවකො, ආර්‍ය්‍යශ්‍රාවකතෙම; සඞ්ඝං අනුස්සරති, "සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො" යනාදීන් අෂ්ටාර්‍ය්‍යපුද්ගල මහා සංඝරත්නයාගේ ගුණ සිහිකරන්නේය; සඞ්ඝං අනුස්සරතො, සංඝයාගේ ගුණ සිහිකරන්නාවූ; තස්ස, ඒ ආර්‍ය්‍යශ්‍රාවකයාගේ; චිත්තංපසීදති, සිත ප්‍රසන්නවන්නේය; පාමොජ්ජං උප්පජ්ජති, ප්‍රමොදය උපදනේය; චිත්තස්ස, චිත්තසම්බන්ධවූ; යෙ උපක්කිලෙසා, යම් උපක්ලේශ කෙනෙක් ඇද්ද; තෙපහීයන්ති, ඔහු ප්‍රහීණවෙති; විසාඛෙ, විශාඛාව; අයංඅරියසාවකො,

මේ ආර්‍ය්‍යශ්‍රාවකතෙම; සංඝූපොසථං උපවසති,(අෂ්ටාර්‍ය්‍යපුද්ගල සංඝයාගේගුණ අපෙක්‍ෂාකොට විසූහෙයින්) සංඝ උපොසථය වෙසෙයි කියාද; සංඝෙනසද්ධිං සංවසති, එහෙයින්ට සංඝයා සමග වෙසෙයිකියාද; වුච්චති, කියනුලැබෙයි; සංඝං ආරබ්භ, සංඝයාගේගුණ අරභයා; අස්සචිත්තං, ඔහුගේ චිත්තය; පසීදති, පහදනේය; පාමොජ්ජං උප්පජ්ජති, ප්‍රමොදයඋපදනේය; චිත්තස්ස, චිත්තයාසම්බන්ධිවූ; යෙ උපක්කිලෙසා, යම් උපක්ලෙශකෙනෙක් ඇද්ද; තෙ පහියන්ති, ඔහු ප්‍රහීණවෙති; විසාඛෙ, විශාඛාව; එවංඛො, මෙසේවනාහි; උපක්කිලිට්ඨස්ස චිත්තස්ස, උපක්ලිෂ්ටවූ චිත්තයාගේ; උපක්කමෙන, උපායෙන්; පරියොදපනා හොති, නිස්කලංකබව වන්නේය.

“උපක්කිලිට්ඨස්ස විසාඛෙ චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති කථංච විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති ඉධ විසාඛෙ අරියසාවකො අත්තනොසීලානි අනුස්සරති අඛණ්ඩානි අච්ඡිද්දානි අසබලානි අකම්මාසානි භුජිස්සානි විඤ්ඤුප්පසත්ථානි අපරාමට්ඨානි සමාධිසංවත්තනිකානිතස්සසීලානි අනුස්සරතො චිත්තංපසීදති පාමුජ්ජං උප්පජ්ජති යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහියන්ති සෙය්‍යථාපි විසාඛෙ උපක්කිලිට්ඨස්ස ආදාසස්ස උපක්කමෙන පරියොදපනා හොති කථංච විසාඛෙ උපක්කිලිට්ඨස්ස ආදාසස්ස උපක්කමෙන පරියොදපනා හොති තෙලඤ්ච පටිච්ච ඡාරිකඤ්ච පටිච්ච වාලණ්ඩුකඤ්ච පටිච්ච පුරිසස්සච තජ්ජංවායාමං පටිච්ච එවංඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස ආදාසස්ස උපක්කමෙන පරියොදපනා හොති එවමෙවඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති කථංච විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති? ඉධ විසාඛෙ අරියසාවකො අත්තනොසීලානි අනුස්සරති අඛණ්ඩානි අච්ඡිද්දානි අසබලානි අකම්මාසානි භුජිස්සානි විඤ්ඤුප්පසත්ථානි අපරාමට්ඨානි සමාධිසංවත්තනිකානි තස්ස සීලං අනුස්සරතො චිත්තංපසීදති පාමුජ්ජං උප්පජ්ජති යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහියන්ති අයං වුච්චති විසාඛෙ අරියසාවකො සීලූපොසථං උපවසති සීලෙන සද්ධිංසංවසති සීලංචස්ස ආරබ්භ චිත්තං පසීදති පාමුජ්ජං උප්පජ්ජති යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහියන්ති එවංඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති”

විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස චිත්තස්ස, පඤ්චනීවරණයන් විසින් උපක්ලිෂ්ටවූ චිත්තයාගේ; උපක්කමෙන, උපක්‍රම

යෙන් හෙවත් වීර්‍ය්‍යයෙන්; පරියොදපනා හොති, නිර්මලකිරීම වන්නේය; විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස චිත්තස්ස, උපක්ලිෂ්ටවූ චිත්තයාගේ; උපක්කමෙන, උපායෙන්; කථඤ්ච පරියොදපනා හොති, කෙසේ පිරිසිදු කිරීමවේද? විසාඛෙ, විශාඛාව; ඉධ මේ ලොකයෙහි; අරියසාවකො, ආර්‍ය්‍යශ්‍රාවකතෙම; අත්තනො, තමාගේ; සීලානි අනුස්සරති, සීලානුස්මරණය කරන්නේය; කෙසේද? අඛණ්ඩානි, නොකඩවූ; අච්ඡිද්දානි, නොසිදුරුවූ; අසබලානි, නොසබලවූ හෙවත් නොකබරවූ; අකම්මාසානි, කල්මාසනොවූ හෙවත් නොතිත්වූ; භුජිස්සානි, භුජිස්‍යවූ හෙවත් නිදහස්වූ; විඤ්ඤුප්පසත්ථානි, විඤ්ඤුප්පසත්වූ හෙවත් නුවණැත්තන් විසින් ප්‍රශංසාකරණ ලද්දාවූ; අපරාමට්ඨානි, තෘෂ්ණාදෘෂ්ටි දෙදෙනා විසින් පරාමර්ශනය නොකරණලද්දාවූ; සමාධිසංවත්තනිකානි, උපචාර සමාධියහෝ අර්පණාසමාධිය එලවනහෙයින් සමාධියපිණිස පවත්නාවූ; සීලානි අනුස්සරති, ශීලානුස්මරණය කරන්නේය; සීලං අනුස්සරතො, ශීලානුස්මරණය කරන්නාවූ හෙවත් සිල්සිහිකරන්නාවූ; තස්ස, ඒ ආර්‍ය්‍යශ්‍රාවකයාගේ; චිත්තං පසීදති, සිත පහදනේය; පාමුජ්ජං උප්පජ්ජති, ප්‍රීති ප්‍රමොදය උපදනේය; චිත්තස්ස, චිත්තයාසම්බන්ධිවූ; යෙ උපක්කිලෙසා, යම් උපක්ලෙශකෙනෙක් අද්ද; තෙ පහීයන්ති, ඔහු ප්‍රහීණවෙති; විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස ආදාසස්ස, මලදූසිතවූ දර්පණයාගේ; උපක්කමෙන, උපක්‍රමයෙන්; සෙය්‍යථාපි පරියොදපනා හොති, යම්සේ නිර්මලකිරීමවේද; විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස ආදාසස්ස, මලදූසිතවූ ආදර්ශයාගේ; උපක්කමෙන, පරාක්‍රමයෙන්; කථං පරියොදපනා හොති, කෙසේ නිර්මල කිරීමවේද? විසාඛෙ, විශාඛාව; තෙලඤ්ච පටිච්ච, තෙල්නිසාද; ඡාරිකඤ්ච පටිච්ච, අලුනිසාද; වාලණ්ඩුකඤ්ච පටිච්ච, අස්වලින්හෝ නියදආදීන් කරණ වාලණ්ඩුකයයිකියනලද කොස්සනිසාද; පුරිසස්ස ච, පුරුෂයාගේ; තජ්ජං වායාමං පටිච්ච, ම්‍රක්ෂණ ඝර්ෂණාදී ඊට සුදුසු ව්‍යායාමයනිසාද; උපක්කිලිට්ඨස්ස ආදාසස්ස, උපක්ලිෂ්ටවූ ආදර්ශයාගේ; උපක්කමෙන, උපායෙන්; එවං ඛො පරියොදපනා හොති, මෙසේ නිර්මලබව කිරීමවේද; විසාඛෙ, විශාඛාව; එවමෙව ඛො, එපරිද්දෙන්ම උපක්කිලිට්ඨස්ස චිත්තස්ස, උපක්ලිෂ්ටවූ චිත්තයාගේ; උපක්කමෙන, උපායෙන්; පරියොදපනා හොති, නිර්මල කිරීමවන්නේය; විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස චිත්තස්ස, උපක්ලිෂ්ටවූ චිත්තයාගේ; උපක්කමෙන, වික්‍රමයෙන් හෙවත් උපායෙන්; කථං පරියොදපනා හොති, කෙසේ නිස්ක

ලංකා කිරීමවේද? විසාඛෙ, විශාඛාව; ඉධ, මේලෝකයෙහි; අරියසාවකො, ආයසිශ්‍රාවකතෙම; අත්තනො, තමාගේ; සීලානි අනුස්සරති, ශීලානුස්මරණය කරන්නේය, අඛණ්ඩානි, නොක ඩවූ;–පෙ–සමාධිසංවත්තනිකානි, උපචාරඅර්පණා සමාධීන්වලට හෙතුවෙසින් සමාධිසංවත්තනිකවූ; සීලානි අනුස්සරති, සිල්සිහිකා රන්නේය; සීලානි අනුස්සරතො, (ලෙයෙ) සිල්සිහිකරන්නාවූ; තස්ස, ඔහුගේ; චිත්තංපසීදති, සිතපහදන්නේය; පාමුජ්ජං උප්පජ්ජති, ප්‍රමොදය උපදන්නේය; චිත්තස්ස, චිත්තයාසම්බන්ධවූ; යෙ උපක්කිලෙසා, යම් උපක්ලෙශ කෙනෙක්ඇද්ද; තෙ පහී යන්ති, ඔහු ප්‍රහීණවෙති; විසාඛෙ, විශාඛාව; අයං අරියසාව කො, මේ ආයසිශ්‍රාවකතෙම; සීලුපොසථං උපවසති, තමාගේ ශීලානුස්මරණ වශයෙන් වසනහෙයින් සීලුපොසථය වෙසෙසි කියාද; සීලෙන සංවාසංවසති, තමාගේ පව, අට, දස, ශීලයෙන් සමග වෙසෙසිකියාද; ඩුඹවති, කියනුලැබෙසි; සීලංආරබ්භ, තමා රක්නා පව, අට, දස, ශීලයන් අරභයා; අස්සචිත්තං, ඔහුගේ සිත; පසීදති, පහදන්නේය; පාමුජ්ජං උප්පජ්ජති, ප්‍රීති ප්‍රමොදය උපදන්නේය; චිත්තස්ස, චිත්තයාසම්බන්ධවූ; යෙඋපක්ක ලෙසා, යම්උපක්ලෙශ කෙනෙක්ඇද්ද; තෙපහීයන්ති, ඔහු ප්‍රහී ණවෙති; විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස චිත්තස්ස, උපක්ලිෂ්ටවූ චිත්තයාගේ; උපක්කමෙන, උපායෙන්; එවං පරි යොදපනා හොති, මෙසේ නිර්මල කිරීමවන්නේය.

" උපක්කිලිට්ඨස්ස විසාඛෙ චිත්තස්ස උපක්කමෙන පරියොද පනා හොති කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්ක මෙන පරියොදපනා හොති? ඉධ විසාඛෙ අරියසාවකො දෙවතා නුස්සරති සන්ති දෙවා චාතුම්මහාරාජිකා සන්ති දෙවා තාවතිං සා සන්තිදෙවායාමා සන්තිදෙවා තුසිතා සන්තිදෙවා නිම්මාණරති නො සන්තිදෙවාපරනිම්මිත වසවත්තිනො සන්තිදෙවා බ්‍රහ්ම කායිකා සන්ති දෙවා තදුත්තරිං යථාරූපාය සද්ධාය සමන්නාගතා දෙවතා ඉතොචුතා තත්ථ උප්පන්නා මය්හම්පි තථාරූපා සද්ධා සං විජ්ජති යථාරූපෙන සීලෙන සමන්නාගතා තා දෙවතා ඉතො චුතා තත්ථ උප්පන්නා මය්හම්පි තථාරූපං සීලංසංවිජ්ජති යථා රූපෙන සුතෙන සමන්නාගතා තා දෙවතා ඉතොචුතා තත්ථ උප්පන්නා මය්හම්පි තථාරූපං සුතංසංවිජ්ජති යථාරූපෙන චාගෙන සමන්නාගතා තා දෙවතා ඉතොචුතා තත්ථ උප්පන්නා මය්හම්පි තථාරූපො චාගො සංවිජ්ජති යථාරූපාය පඤ්ඤාය සමන්නාගතා තා දෙවතා ඉතොචුතා තත්ථ උප්පන්නා

මය්හම්පි තථාරූපා පඤ්ඤා සංවිජ්ජති තස්ස අත්තනොච තාසංච
දෙවතානං සද්ධඤ්ච සීලඤ්ච සුතඤ්ච චාගඤ්ච පඤ්ඤඤ්ච අනුස්සරතො
චිත්තං පසීදති පාමුජ්ජං උප්පජ්ජති යෙ චිත්තස්ස උපක්කිලෙසා
තෙ පහීයන්ති''—

විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස චිත්තස්ස, කාමච්ඡන්දාදී
පඤ්චනීවරණයන් විසින් උපකිලිෂ්ටවූ චිත්තයාගේ; උපක්ක
මෙන, උපායෙන් හෙවත් වීර්‍යයෙන්; පරියොදපනා හොති,
නිර්මල කිරීමවන්නේය; විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස
චිත්තස්ස, උපකිලිෂ්ටවූ චිත්තයාගේ; උපක්කමෙන, උද්‍යොග
යෙන්, කථං පරියොදපනා හොති, කෙසේ නිර්මල කිරීමවේද?
විසාඛෙ, විශාඛාව; ඉධ, මේ ලෝකයෙහි; අරියසාවකො, ආර්‍ය්‍ය
ශ්‍රාවකතෙම; දෙවතානුස්සරති, දෙවියන්සාක්ෂිකොට තමාගේ
ශ්‍රද්ධාදිගුණ සිහිකරන්නේය; කෙසේද? චාතුම්මහාරාජිකා
දෙවා, චාතුර්මහාරාජිකනම්වූ දෙවිකෙනෙක්; සන්ති, ඇත්තාහ;
තාවතිංසාදෙවා, තාවතිංසනම්වූ දෙවිකෙනෙක්; සන්ති, ඇත්
තාහ; යාමාදෙවා, යාමනම්වූ දෙවිකෙනෙක්; සන්ති, ඇත්තාහ;
තුසිතාදෙවා, තුසිතනම්වූ දෙවිකෙනෙක්; සන්ති, ඇත්තාහ;
නිම්මාණරතිනො, නිර්මාණරතිනම්වූ; දෙවා දෙවිකෙනෙක්;
සන්ති, ඇත්තාහ; පරනිම්මිත වසවත්තිනො, පරනිර්මිත වස
වර්තිනම්වූ; දෙවා, දෙවිකෙනෙක්; සන්ති, ඇත්තාහ; බ්‍රහ්ම
කායිකා, බ්‍රහ්මකායිකනම්වූ; දෙවා, දෙවිකෙනෙක්; සන්ති;
ඇත්තාහ; තදුත්තරිං, එයින්මත්තෙහි; දෙවා, දෙවියො; සන්ති,
ඇත්තාහ; ඉතොචුතා, මේ මනුෂ්‍යාත්මභාවයෙන් චුතව; තත්‍ර
උපපන්නා, ඒ චාතුර්මහාරාජිකාදි දෙවලෝකවල උපන්නාවූ;
තා දෙවතා, ඒ දෙවියෝ; යථාරූපාය සද්ධාය සමන්නාගතා, යම්
බඳුවූ ශ්‍රද්ධාවකින් යුක්තවූවාහුද; මය්හම්පි, මටද; තථාරූපා
සද්ධා, එබඳු ශ්‍රද්ධාතොමෝ; සංවිජ්ජති, ඇත්තීය; ඉතොචුතා,
මෙයින්චුතව; තත්‍රඋපපන්නා; එහි උපන්නාවූ; තා දෙවතා,
ඒ දෙවියො; යථාරූපෙන සීලෙන සමන්නාගතා, යම්බඳුවූ සීලය
කින්යුක්තයොද; මය්හම්පි, මටද; තථාරූපං සීලං, එබඳුවූ
සීලය; සංවිජ්ජති, ඇත්තේය; ඉතොචුතා, මෙයින්චුතව; තත්‍ර
උපපන්නා, එහිඋපන්නාවූ; තාදෙවතා, ඒ දෙවියො; යථාරූ
පෙන සුතෙන සමන්නාගතා, යම්බඳුවූ ශ්‍රුතයකින් යුක්ත
යෝද; මය්හම්පි, මටද; තථාරූපං සුතං, එබඳුවූ ශ්‍රුතය; සං
විජ්ජති, ඇත්තේය; ඉතොචුතා, මෙයින්චුතව; තත්‍රඋපපන්නා,
එහිඋපන්නාවූ; තා දෙවතා, ඒදෙවියො; යථාරූපෙන චාගෙන
සමන්නාගතා,යම්බඳුවූ ත්‍යාගයකින්යුක්තයෝද;මය්හම්පි,මටද;

තථාරූපොචාගො, එබඳුවූ ත්‍යාගය; සංවිජ්ජති, ඇත්තේය; ඉතොචුතා, මෙසින්චුතව; තත්‍ථඋප්පන්නා, එහි උපන්නාවූ; තා දෙවතා, ඒ දෙවියො; යථාරූපාය පඤ්ඤාය සමන්නාගතා, යම් බඳුවූ ප්‍රඥාවකින් යුක්තයෝද; මය්හම්පි, මටද; තථාරූපා පඤ්ඤා, එබඳුවූ ප්‍රඥාතොමෙ; සංවිජ්ජතීති, අත්තීයයි; දෙවතානුස්සරති, දෙවියන්සාක්‍ෂි ස්ථානයෙහිතබා තමාගේ ශ්‍රද්ධාදිගුණ සිහිකරන්නේය; අත්තනොච, තමාගේද; තාසංදෙවතානාඤ්ච, ඒ දෙවියන්ගේද; සද්ධඤ්ච, ශ්‍රද්ධාවද; ශීලඤ්ච, සීලයද; සුතඤ්ච, ශ්‍රැතයද; චාගඤ්ච, ත්‍යාගයද; පඤ්ඤඤ්ච, ප්‍රඥාවද; අනුස්සරතො; සිහිකරන්නාවූ; තස්ස, ඔහුගේ; චිත්තං පසීදති, සිතපහදනේය; පාමුජ්ජං උප්පජ්ජති, ප්‍රමොදය උපදනේය; චිත්තස්ස, චිත්තයා සම්බන්ධවූ; යෙ උපක්කිලෙසා, යම් උපක්ලෙශ කෙනෙක්ඇද්ද; තෙ පහීයන්ති, ඔහු ප්‍රහීණවෙති—

"සෙය්‍යථාපි විසාඛෙ උපක්කිලිට්ඨස්ස ජාතරූපස්ස උපක්කමෙන පරියොදපනා හොති කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස ජාතරූපස්ස උපක්කමෙන පරියොදපනා හොති? උක්කඤ්ච පටිච්ච ලොණඤ්චපටිච්ච ගෙරුකඤ්ච පටිච්ච නාළිසණ්ඩාසඤ්ච පටිච්ච පුරිසස්සච තජ්ජං වායාමංපටිච්ච එවංඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස ජාතරූපස්ස උපක්කමෙන පරියොදපනා හොති එවමෙවඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති? ඉධ විසාඛෙ අරියසාවකො දෙවතානුස්සරති සන්තිදෙවා චාතුම්මහාරාජිකා—පෙ—සන්ති දෙවා බ්‍රහ්මකායිකා සන්ති දෙවා තදුත්තරිං යථාරූපාය සද්ධාය සමන්නාගතා තා දෙවතා ඉතොචුතා තත්‍ථ උප්පන්නා මය්හම්පි තථාරූපා සද්ධා සංවිජ්ජති යථාරූපෙන සීලෙන සමන්නාගතා තා දෙවතා තත්‍ථ උප්පන්නා මය්හම්පි තථාරූපං සීලං සංවිජ්ජති යථාරූපෙන සුතෙන සමන්නාගතා තා දෙවතා ඉතොචුතා තත්‍ථ උප්පන්නා මය්හම්පි තථාරූපං සුතං සංවිජ්ජති යථාරූපෙනචාගෙන සමන්නාගතා තා දෙවතා ඉතොචුතා තත්‍ථ උප්පන්නා මය්හම්පි තථාරූපොචාගො සංවිජ්ජති යථාරූපාය පඤ්ඤාය සමන්නාගතා තා දෙවතා ඉතොචුතා තත්‍ථ උප්පන්නා මය්හම්පි තථාරූපා පඤ්ඤා සංවිජ්ජතීති තස්සඅත්තනොච තා සඤ්ච දෙවතානං සද්ධඤ්ච සීලඤ්චසුතඤ්චචාගඤ්ච පඤ්ඤඤ්ච අනුස්සරතො චිත්තංපසීදති පාමුජ්ජං උප්පජ්ජති යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති අයංවුච්චති විසාඛෙ අරියසාවකො දෙවතූපොසථං උපවසති දෙවතාහි සද්ධිංසංවසති දෙවතා චස්ස ආරබ්භ චිත්තං පසීදති

පාමුජ්ජං උප්පජ්ජති යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙපහීයන්ති එවංඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති "—

විසාඛෙ, විශාඛාව; සෙය්‍යථාපි, යම්සේ; උපක්කිලිට්ඨස්ස ජාතරූපස්ස, උපක්ලිෂ්ටවූ ස්වර්ණයාගේ; උපක්කමෙන, උත්සාහයෙන්; පරියොදපනා හොති, නිර්මල කිරීම වන්නේද; විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස ජාතරූපස්ස, උපක්ලිෂ්ටවූ ස්වර්ණයාගේ; උපක්කමෙන. උත්සාහයෙන්; කථංපරියොදපනා හොති, කෙසේ නිර්මල කිරීමවේද? විසාඛෙ, විශාඛාව; උක්කඤ්ච පටිච්ච, උදුනනිසාද; ලොණඤ්ච පටිච්ච, ලුණු(මැටි)නිසාද; ගෙරුකඤ්ච පටිච්ච, ගෛරිකනිසාද හෙවත් ගුරුසුණුනිසාද; නාළිසණ්ඩාසඤ්ච පටිච්ච. පිඹින නලහා ඔබමොබ පෙරලනඅඬුව නිසාද; පුරිසස්සච, පුරුෂයාගේ; තජ්ජංවායාමං පටිච්ච. උදුනෙහි බැහිම්පිඹීම් පෙරලීම්ආදිවූ ඊට සුදුසුවූ ව්‍යායාමයනිසාද; උපක්කිලිට්ඨස්ස ජාතරූපස්ස, උපක්ලිෂ්ටවූ ස්වර්ණයාගේ; උපක්කමෙන, පුරුෂාකාරයෙන්; එවං පරියොදපනා හොති, මෙසෙ පිරිසිදු කිරීමවන්නේය; විසාඛෙ, විශාඛාව; එවමෙවඛො, එපරිද්දෙන්ම; උපක්කිලිට්ඨස්ස චිත්තස්ස, පඤ්චනීවරණයන්විසින් උපක්ලිෂ්ටවූචිත්තයාගේ; උපක්කමෙන, උපක්‍රමයෙන්හෙවත් වීර්‍ය්‍යයෙන්; පරියොදපනා හොති, නිර්මල කිරීම වන්නේය; විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස චිත්තස්ස, උපක්ලිෂ්ටවූ චිත්තයාගේ; උපක්කමෙන, වීර්‍ය්‍යයෙන්; කථංපරියොදපනා හොති, කෙසේ නිර්මල කිරීමවේද? විසාඛෙ, විශාඛාව; ඉධ, මේලෝකයෙහි; අරියසාවකො, ආර්‍ය්‍යශ්‍රාවකතෙම; දෙවතානුස්සරති, දෙවියන් සාක්ෂිස්ථානයෙහිතබා තමාගේ ශ්‍රද්ධාදිගුණ සිහිකරන්නේය; සේකෙසේද? චාතුම්මහාරාජිකාදෙවා, චාතුර්මහාරාජිකනම් දෙවියොනොත්; සන්ති, ඇත්තාහ;—පෙ—තදුත්තරිං, එයින්මත්තෙහි; දෙවා, දෙවියො; සන්ති, ඇත්තාහ; ඉතොචුතා, මෙයින්චූතව; තත්‍ථඋප්පන්නා, එහි උපන්නාවූ; තාදෙවතා, ඒ දෙවියො; යථාරූපාය සද්ධාය සමන්නාගතා, යම්බඳුවූශ්‍රද්ධාවකින් යුක්තයෝද; මය්හම්පි, මටද; තථාරූපාසද්ධා; එබඳුවූශ්‍රද්ධාතොමො; සංවිජ්ජති, ඇත්තීය; ඉතොචුතා, මෙයින්චූතව; තත්‍ථඋප්පන්නා, ඒ චාතුර්මහාරාජිකාදියෙහි උපන්නාවූ; තාදෙවතා, ඒදෙවියෝ; යථාරූපෙන සීලෙන සුතෙන චාගෙන පඤ්ඤාය සමන්නාගතා, යම්බඳුවූ ශීලයකින් ශ්‍රැතියකින් ත්‍යාගයකින් ප්‍රඥාවකින් යුක්තයොද; මය්හම්පි, මටද; තථාරූපං සීලංසුතං

චාගො පඤ්ඤා සංවිජ්ජන්ති, එබඳුවූසීල ශ්‍රැත ත්‍යාග ප්‍රඥා ඇත්
තේයයිකියාද; දෙවතානුස්සරති, දෙවියන් සාක්ෂිස්ථානයෙහි
තබා තමාගේ ශ්‍රද්ධාදිගුණ සිහිකරන්නේය; අත්තනොච, තමා
ගේද; තාසං දෙවතානංච, ඒ චාතුර්මහාරාජිකාදි දෙවියන්ගේද;
සද්ධංච, ශ්‍රද්ධාවද; සීලංච, සීලයද; සුතංච, ශ්‍රැතයද; චාගංච;
ත්‍යාගයද; පඤ්ඤඤ්ච, ප්‍රඥාවද; අනුස්සරතො, සිහිකරන්නාවූ;
තස්ස, ඒ ආර්‍ය්‍යශ්‍රාවකයාගේ; චිත්තංපසීදති, සිත පහදනේය;
පාමුජ්ජංඋප්පජ්ජති, ප්‍රමොදය උපදනේය; චිත්තස්ස, චිත්තයා
සම්බන්ධීවූ; යෙ උපක්කිලෙසා, යම් උපක්ලෙශ කෙනෙක්ඇද්ද;
තෙ පහීයන්ති, ඔහු ප්‍රහීණවෙති; විසාඛෙ, විශාඛාව; අයංඅරිය
සාවකො, මේආර්‍ය්‍යශ්‍රාවකතෙම; දෙවතුපොසථං උපවසති, (දෙවි
යන් සාක්ෂිස්ථානයෙහි තබා තමාගේගුණ සිහිකරන්නාහු
විසින් විසූබැවින් දෙවතුපොසථයවසන්නේයයිකියාද;දෙවතාහි
සද්ධිංසංවසති, ශ්‍රද්ධාදිගුණයෙන් සදෘශ බැවින් දෙවියන් සමග
වසන්නේයයි කියාද; වුච්චති, කියනුලැබෙයි; දෙවතා ආරබ්භ,
දෙවියන්ගේ ශ්‍රද්ධාදිගුණ අරභයා; අස්සචිත්තං, ඔහුගේසිත;
පසීදති, පහදනේය; පාමුජ්ජං උප්පජ්ජති, ප්‍රීතිප්‍රමොදය උපද
නේය; චිත්තස්ස, චිත්තයාසම්බන්ධීවූ; යෙ උපක්කිලෙසා, යම්
උපක්ලෙශ කෙනෙක්ඇද්ද; තෙපහීයන්ති, ඔහු ප්‍රහීණවෙති;
විසාඛෙ, විශාඛාව; උපක්කිලිට්ඨස්ස චිත්තස්ස, උපක්ලිෂ්ටවූ
චිත්තයාගේ; උපක්කමෙන, වියයීයෙන්; එවං පරියොදපනා
හොති, මෙසේ නිර්මල කිරීමවන්නේය —

,, සඛො සො විසාඛෙ අරියසාවකො ඉතිපටිසංචික්ඛති යාවජී
වං අරහන්තො පාණාතිපාතංපහාය පාණාතිපාතා පටිවිරතානි
හිතදණ්ඩා නිහිතසත්ථා ලජ්ජීදයාපන්නා සබ්බපාණභූතහි
තානුකම්පී විහරන්ති අහම්පජ්ජ ඉමඤ්චරත්තිං ඉමඤ්චදිවසං පාණා
තිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො නිහිතදණ්ඩො නි
හිතසත්ථො ලජ්ජීදයාපන්නො සබ්බපාණභූත හිතානුකම්පී
විහරාමි ඉමිනාපඞ්ගෙන අරහතං අනුකරොමි උපොසථොච මෙ
උපවුත්ථො භවිස්සති ’’ —

විසාඛෙ, විශාඛාව; සඛොසො අරියසාවකො, ඒ මේ ආර්‍ය්‍යශ්‍රාව
කතෙම; ඉතිපටිසංචික්ඛති, මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කරන්නේය;
අරහන්තො, බුද්ධ ප්‍රත්‍යෙකබුද්ධාදිරහත්හු; යාවජීවං, ජීවි
තාන්තයදක්වා; පාණාතිපාතං පහාය, ප්‍රාණඝාතයහැර; පාණා
තිපාතා, ප්‍රාණඝාතචෙතනා සංඛ්‍යාතදුශ්ශීල්‍යයෙන්;පටිවිරතා,
විශෙෂයෙන් වැළැක්කාහුය; නිහිතදණ්ඩා, (පරහිංසා පිණිස

දණ්ඩමුගුරාදීන්ගෙණ නොපවත්නා හෙයින්) බහාතබනලද
දණ්ඩමුගුරාදීන් ඇත්තාහ; නිහිතසත්ථා, (පරූපඝාතනය
පිණිස ඛඩ්ගකුන්තාදි ශස්ත්‍රයක්ගෙණ නොපවත්නාහෙයින්)
බහාතබනලද ශස්ත්‍රයන් ඇත්තාහ; ලජ්ජී, (පාපයෙහි ජිගුප්
සාකාරයෙන් පවත්නාහෙයින්) ලජ්ජීහ; දයාපන්නා, කරුණා
වට පැමිණියහ (මෙවත් මෙත්සිත් ඇතිබවට පැමිණියහ),
සබ්බපාණභූත, සකලප්‍රාණිභූතයන් කෙරෙහි; හිතානුකම්පී;
(හිතචිත්තයෙන්) අනුකම්පා කෙරෙමින්; විහරන්ති, වාසය
කරන්නාහ; අහම්පි, මමද; අජ්ජඉමංචරත්තිං ඉමංචදිවසං, අද
මේරැදවල්; පාණාතිපාතං පහාය, ප්‍රාණඝාතචෙතනා සංඛ්‍යාත
දුශ්ශීල්‍යයහැර; පාණාතිපාතා, ප්‍රාණඝාත චෙතනාවෙන්; පටිවි
රතො, විශෙෂයෙන් වැලැක්කෙමි; නිහිතදණ්ඩො පරහිංසා
පිණිස නොගන්නාලද දණ්ඩමුගුරාදීන් ඇතිහෙයින්)බහාතබ
නාලද දණ්ඩමුගුරාදීන් ඇත්තෙමි; නිහිතසත්ථො, (පරූප
ඝාතනය පිණිස නොගන්නාලද ඛඩ්ගකුන්තාදි ශස්ත්‍රයන්
ඇතිහෙයින්) බහාතබනලද ඛඩ්ගකුන්තාදීන්ඇත්තෙමි; ලජ්ජී,
පාපයෙහි ජිගුප්සාකාරයෙන් පවත්නාහෙයින් ලජ්ජීමි; දයා
පන්නො, කරුණාවට පැමිණියෙමි මෙත්සිත් ඇතිබවට පැමි
ණියෙමි; සබ්බපාණභූත හිතානුකම්පී, සකලප්‍රාණි භූතයන්
කෙරෙහි හිතයෙන් අනුකම්පා කෙරෙමින්; විහරාමි, වාසයකෙ
රෙමි; ඉමිනාපිඅඞ්ගෙන, මේගුණාඞ්ගයෙන්ද; අරහතං අනුක
රොමි, රහතුන්නලා කෙරෙමි; මෙ, මාවිසින්; උපොසථොච උප
වුත්තො භවිස්සති, පෙහෙවස් වසනලද්දේදවේ෴

"යාවජීවං අරහන්තො අදින්නාදානංපහාය අදින්නාදානාපටි
විරතාදින්නාදායී දින්නපාටිකංඛී අථෙනෙන සුචිභූතෙන අත්ත
නා විහරන්ති අහම්පජ්ජ ඉමංචරත්තිං ඉමංචදිවසං අදින්නාදානං
පහාය අදින්නාදානා පටිවිරතො දින්නාදායී දින්න පාටිකංඛී
අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරාමි ඉමිනාපි අඞ්ගෙන
අරහතං අනුකරොමි උපොසථොච මෙ උපවුත්තො භවිස්සති"෴

අරහන්තො, බුද්ධාදී ආර්‍යයන්වහන්සේලා; යාවජීවං, දිවිහිමි
යෙන්; අදින්නාදානං පහාය, අදත්තාදානයහැර; අදින්නාදානා,
අදත්තාදානයෙන්; පටිවිරතා, වැලැක්කාහුය; දින්නාදායී, දුන්
දෙයම ගන්නාසුලුය; දින්නපාටිකංඛී, දුන්දෙයම සිතිනුත් කැම
තිව ඉවසනාසුලුය; අථෙනෙන, චෞරහිතවූ; සුචිභූතෙන, එහෙ
යින් පවිත්‍රවූ; අත්තනා, ආත්මභාවයෙන් උපලක්ෂිතව; විහ
රන්ති, වාසයකරන්නාහ; අහම්පි, මමද; අජ්ජඉමංචරත්තිං ඉමංච

දිවසං, අදමේරෑදවල්; අදින්නාදානං පහාය, අදත්තාදානයගැර;
අදින්නාදානා, අදත්තාදානයෙන්; පටිවිරතො, වැලැක්කෙමි;
දින්නාදායී, දුන්දෙයම ගන්නාසුලුයෙමි; දින්නපාටිකංඛී, දුන්
දෙයම සිතින් කැමතිව ඉවසනසුලුයෙමි; අථෙනෙන; වඤ්චාරහි
තවූ; සුචිභූතෙන, එහෙයින්ම පවිත්‍රවූ; අත්තනා, ආත්මභාව
යෙන් උපලක්ෂිතව; විහරාමි, වාසයකෙරෙමි; ඉමිනාපිඅඞ්ගෙ
න, මේ ගුණාඞ්ගයෙන්ද; අරහතං අනුකරෙමි, බුඩාදි ආර්යයන්
කලාකෙරෙමි; මෙ, මාවිසින්; උපොසථොච උපවුත්ථොභවිස්සති,
පෙහෙවස් වසනලද්දේදවෙයි

"යාවජීවං අරහන්තො අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී ආර
චාරී විරතා මෙථුනාගාමධම්මා අහම්පජ්ජ ඉමඤ්චරත්තිං ඉමඤ්චදිවසං
අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී ආරචාරී විරතො මෙථුනාගාම
ධම්මා ඉමිනාපි අඞ්ගෙන අරහතං අනුකරොමි උපොසථොච
මෙ උපවුත්ථොභවිස්සති"

අරහන්තො, බුඩාදි ආර්යයෝ; යාවජීවං, දිවිහිම්යෙන්,
අබ්‍රහ්මචරියං පහාය, අබ්‍රහ්මචර්යාව දුරුකොට; බ්‍රහ්මචාරී,
ශ්‍රෙෂ්ඨචර්යාවෙහි හැසිරෙණසුලුයහ; ආරචාරී, දුරචාරියහ;
මෙථුනා, අසධර්මයෙන්; ගාමධම්මා, ග්‍රාමවාසීන්ගේ ධර්මයෙන්;
විරතා, වැලැක්කාහ; අහම්පි, මමද; අජ්ජඉමඤ්ච රත්තිං ඉමඤ්ච
දිවසං, අද මේ රෑ දවල්; අබ්‍රහ්මචරියං පහාය, අබ්‍රහ්මචරියාව
දුරුකොට; බ්‍රහ්මචාරී, ශ්‍රෙෂ්ඨචර්යායෙහි හැසිරෙණ සුලුයෙමි;
ආරචාරී, දුරචාරීමි; මෙථුනා, අසධර්මයෙන්; ගාමධම්මා, ග්‍රාම
වාසීන්ගේ ධර්මයෙන්; විරතො, වැලැක්කෙමි; ඉමිනාපි අඞ්ගෙ
න, මේ ගුණාඞ්ගයෙන්ද; අරහතං අනුකරෙමි, බුඩාදි ආර්ය
යන් කලාකෙරෙමි; මෙ, මා විසින්; උපොසථොච උපවුත්ථොභ
විස්සති, පෙහෙවස්වසන ලද්දේදවෙයි

"යාවජීවං අරහන්තො මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතා
සච්චවාදී සච්චසන්ධා ථෙතා පච්චයිකා අවිසංවාදකා ලොකස්ස
අහම්පජ්ජ ඉමඤ්චරත්තිං ඉමඤ්චදිවසං මුසාවාදංපහාය මුසාවාදා පටි
විරතො සච්චවාදී සච්චසන්ධො ථෙතො පච්චයිකො අවිසංවාද
කො ලොකස්ස ඉමිනාපි අඞ්ගෙන අරහතං අනුකරොමි උපො
සථොච මෙ උපවුත්ථො භවිස්සති"

අරහන්තො, බුඩාදීආර්යයෝ; යාවජීවං, දිවිහිම්යෙන්; මුසා
වාදම්පහාය, මෘෂාවාදයහැර; මුසාවාදා පටිවිරතා, මෘෂාවාද
යෙන් වැලක්කාහ; සච්චවාදී, සත්‍යයකියන සුලුයහ; සච්චසන්ධා,
සත්‍යයන්අතුරෙහි බොරුවක්නොකියා සත්‍යයෙන් සත්‍යය ගළ

පන්නාහ; ථෙතා, ස්ථිරව පිහිටියාවූ කථාඇත්තාහ; පච්චයිකා; ඇදහිලිකටයුතුකථා ඇත්තාහ; ලොකස්ස, ලෝකයා සම්බන්ධවූ; අවිසංවාදකා, වංචානොකරන්නාහ; අහම්පි, මමද; අජ්ජඉමඤ්ච රත්තිං ඉමඤ්චදිවසං, අද මේ රෑදවල්; මුසාවාදං පහාය, මුසාවාද යහැර; මුසාවාදා පටිවිරතො, මෘෂාවාදයෙන් වැලක්කෙමි; සච්චවාදී; සත්‍යයකියන සුලුයෙමි; සච්චසන්ධො, සත්‍යය අතුරෙහි බොරුවක් නොකියා සත්‍යයෙන් සත්‍යය ගළපන්නෙමි; ථෙතො, ස්ථිරව පිහිටියාවූ කථාඇත්තෙමි; පච්චයිකො, ඇදහිලිකටයුතු කථාඇත්තෙමි; ලොකස්ස, ලෝකයා සම්බන්ධව; අවිසංවාදකො, වංචානොකෙරෙමි; ඉමිනාපි අඞ්ගෙන, මේගුණාඞ්ගයෙන්ද; අරහතං අනුකරෙමි, රහතුන් කළාකෙරෙමි; මෙ, මා විසින්; උපොසථොච උපවුත්ථොභවිස්සති, පෙහෙවස්ද වසනලද්දේවෙයි.—

" යාවජ්ජීවං අරහන්තො සුරාමෙරය මජ්ජපමාදට්ඨානං පහාය සුරාමෙරය මජ්ජපමාදට්ඨානා පටිවිරතා අහම්පජ්ජ ඉමඤ්චරත්තිං ඉමඤ්චදිවසං සුරාමෙරය මජ්ජපමාදට්ඨානං පහාය සුරාමෙරය මජ්ජපමාදට්ඨානා පටිවිරතො ඉමිනාපි අඞ්ගෙන අරහතං අනුකරෙමි උපොසථොච මෙ උපවුත්ථො භවිස්සති "—

අරහන්තො, රහත්හු; යාවජීවං, ජීවිතාන්තයදක්වා; සුරාමෙරය මජ්ජපමාදට්ඨානං පහාය, මදප්‍රමාදයටකාරණවූ රහමෙරින් දුරුව; සුරාමෙරය මජ්ජපමාදට්ඨාණා පටිවිරතා, මදප්‍රමාදයටකාරණවූ රහමෙරින් වැලැක්කාහ; අහම්පි, මමද; අජ්ජ ඉමඤ්චරත්තිං ඉමඤ්චදිවසං, අදමේ රෑදවල්; සුරාමෙරය මජ්ජපමාදට්ඨානම්පහාය, මදප්‍රමාදයට කාරණවූ රහමෙරින්දුරුව; සුරාමෙරය මජ්ජපමාදට්ඨානා පටිවිරතො, මදප්‍රමාදයටකාරණවූ රහමෙරින් වැලැක්කෙමි; ඉමිනාපිඅඞ්ගෙන, මේ ගුණාඞ්ගයෙන්ද; අරහතං අනුකරෙමි, රහතුන්කළාකෙරෙමි; මෙ, මාවිසින්; උපොසථොච උපවුත්ථො භවිස්සති, පෙහෙවස්ද වසනලද්දේවෙයි.—

" යාවජීවං අරහන්තො ඒකභත්තිකා රත්තූපරතාවිරතා විකාලභොජනා අහම්පජ්ජ ඉමඤ්චරත්තිං ඉමඤ්චදිවසං ඒකභත්තිකො රත්තූපරතො විරතො විකාලභොජනා ඉමිනාපි අඞ්ගෙන අරහතං අනුකරෙමි උපොසථොච උපවුත්ථො භවිස්සති "—

අරහන්තො, රහත්හු; යාවජීවං, පරිච්ඡින්න ආයුෂයදක්වා; ඒකභත්තිකා, පෙරවරු එක්වේලෙ වළදනබත් ඇත්තාහ; රත්තූපරතා, රාත්‍රිභොජනයෙන් වැලක්කාහ; විකාලභොජනා. විකල් බොජුනෙන්; විරතා, වැලක්කාහ; අහම්පි, මමද; අජ්ජ ඉමඤ්

රත්තිං ඉමඤ්චදිවසං, අදමේ රෑදවල්; ඒකභත්තිකො, පෙරවරු එක්වේලෙහි වළඳනබත් ඇත්තෙම්; රත්ති උපරතො, රාත්‍රිභොජනයෙන් වැලක්කෙම්; විකාලභොජනා, විකාලභොජනයෙන්; පටිවිරතො, වෙසෙසින් වැලක්කෙමි; ඉමිනාපි අඞ්ගෙන, මේ ගුණාඞ්ගයෙන්ද; අරහතං අනුකරෙමි, රහතුන් කලානෙරෙමි; මෙ, මාවිසින්; උපොසථො ච උපවුත්ථො භවිස්සති, පෙහෙවස්ද වසනලද්දෙවෙයි.

“ යාවජීවං අරහන්තො නච්චගීතවාදිත විසූකදස්සනමාලාගන්ධවිලෙපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා පටිවිරතා අහම්පජ්ජ ඉමඤ්චරත්තිං ඉමඤ්චදිවසං නච්චගීතවාදිත විසූකදස්සන මාලාගන්ධවිලෙපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා පටිවිරතො ඉමිනාපි අඞ්ගෙන අරහතං අනුකරෙමි උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සති ”

අරහන්තො, රහත්හු; යාවජීවං, පරිච්ඡින්නායුෂයදක්වා; නච්ච, නමානැටීමය; ගීත, ගීතිමය; වාදිත, බෙරආදියවැයීමය; විසූකදස්සන, මෙසේ නැටීම් ගීතිම් බෙරවැයිම් ආදිය බැලීමයයි කියනලද විපරීත දශීනය; මාලා, සිනිද්ද බොලිද්ද දෑසමන් ආදී යම්කිසි පුෂ්පයක; ගන්ධ, සාදුජබාදු ආදි යම්කිසි සුගන්ධජාතියෙක, විලෙපන, සඳුන්කසාගොරද කොකුම් ආදි යම්කිසි ඡවිරාගකරණයෙක යන මේ සියල්ල; ධාරණ, පැළඳීමෙන් දැරීමය; මණ්ඩන, ඌනතැන් පිරීමෙන් මණ්ඩනය; විභූසන, සුගන්ධවශයෙන්හා ඡවිරාගවශයෙන් ඉවසා සැරසීමය යන; ඨානා, කාරණයෙන්; පටිවිරතා, වැලක්කාහු; අහම්පි, මමද; අජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්චදිවසං, අදමේරෑදවල්; නච්ච, නැටීමය; ගීත, ගීතිමය; වාදිත, බෙරආදිය වැයීමය; විසූකදස්සන, මෙසේ නැටීම් ගීතිම් බෙරවැයීම් ආදිය බැලීමයයි කියනලද විපරීතදශීනය; මාලා, සිනිද්ද බොලිද්ද දෑසමන් ආදී යම්කිසි පුෂ්පයෙක; ගන්ධ, සාදුජබාදු ආදී යම්කිසි සුගන්ධයෙක; විලෙපන, සඳුන්කසාගොරද කොකුම්ආදියම්කිසි ඡවිරාගකරණයෙක යනමේ සියල්ල; ධාරණ, පැළඳීමෙන්දැරීමය; මණ්ඩන, ඌනතැන්පිරීමෙන් මණ්ඩනය, විභූසන, සුගන්ධවශයෙන්හා ඡවිරාගවශයෙන් ඉවසාසැරසීමය යන; ඨානා, කාරණයෙන්; පටිවිරතො, වැලැක්කෙමි; ඉමිනාපි අඞ්ගෙන, මේ ගුණාඞ්ගයෙන්ද; අරහතං අනුකරෙම්, රහතන් කලානෙරෙමි; මෙ, මාවිසින්; උපොසථො ච උපවුත්ථො භවිස්සති, පෙහෙවස්ද විසනලද්දේවෙයි.

“ යාවජීවං අරහන්තො උච්චාසයන මහාසයනා පටිවිරතා නීචසෙය්‍යංකප්පෙන්ති මඤ්චකෙවා තිණසන්ථාරකෙවා අහම්පජ්ජ ඉමඤ්චරත්තිං ඉමඤ්චදිවසං උච්චාසයන මහාසයනම්පහාය උච්චාසය න මහාසයනා පටිවිරතො නීචසෙය්‍යං කප්පෙමි මඤ්චකෙවා ති ණසන්ථාරකෙවා ඉමිනාපි අඞ්ගෙන අරහතං අනුකරොමි උපො සථොච මෙ උපවුත්ථො භවිස්සති එවංඛො විසාඛෙ අරියූපොස ථොති ”

අරහන්තො, රහතන්හු; යාවජීවං, පරිවජීවිතානාක්‍ෂය දක්වා; උච්චා සයනමහා සයනං, පහාය පමණඉකුත් දික්හගලා පුටුආදී උස ඇඳන්හා; පුප්ඵිත්තිලි සතරඟුලෙන් දික්ලොම්ඇති කොදුපලස් ආදී මහ හඳුන්හැර; උච්චාසයනමහා සයනා පටිවිරතා, උසඇඳුන් මහ ඇඳෙන් වැලැක්කාහු; මඤ්චකෙවා, මුෂ්ටි හස්ත ප්‍රමාණ පාඇති කප්පිය මඤ්චකයෙහිහෝ හෙවත් කුරුඇඳෙහිහෝ, තිණ සන්ථාරකෙවා, තෘණපණ්ණ පලාලාදීන් අතුට කලසංස්ථරණ යෙහිහෝ; නීචසෙය්‍යංකප්පෙන්ති, මිටි ඇඳෙහි හොවිති; අහම්පි, මමද; අජ්ජ ඉමඤ්චරත්තිං ඉමඤ්ච දිවසං, අදමේ රෑදවල්; උච්චාසයන මහාසයනං පහාය; පමන ඉකුත්දික් හගලා පුටු ආදී උසඇඳුන්හා පුප්ඵිත්තිලි හතරඟුලෙන් දික්ලොම්ඇති කොදු පලස්ආදි මහ හඳුන්හැර; උච්චාසයන මහාසයනා පටිවිරතො, උසඇඳුන් මහඇඳෙන් වැලැක්කෙමි; මඤ්චකෙවා, මුෂ්ටි හස්ත ප්‍රමාණ පාඇති කප්පිය මඤ්චකයෙහිහෝ; තිණසන්ථාරකෙවා, තණ ඇතිරියෙහිහෝ; නීචසෙය්‍යං කප්පෙමි, මිටි ඇඳෙහි සය නය කෙරෙමි; ඉමිනාපි අඞ්ගෙන, මේ ගුණාඞ්ගයෙන්ද; අරහ තං අනුකරොමි, රහතුන්ට අනුව ක්‍රියාකෙරෙමි; මෙ, මාවිසින්; උපොසථොච උපවුත්ථො භවිස්සති, පෙහෙවස්ද වසන ලද්දේ වෙයි; විසාඛෙ, විශාඛාව; එවංඛො අරියූපොසථොහොති, මෙසේ ආර්‍ය්‍ය උපොසථය වන්නේය

“ එවංඛො විසාඛෙ අරියූපොසථො හොති එවං උපවුත්ථොඛො විසාඛෙ අරියූපොසථො මහප්ඵලො හොති මහානිසංසො මහා ජුතිකො මහාවිප්ඵාරො කීව මහප්ඵලො හොති කීව මහානි සංසො කීව මහාජුතිකො කීව මහාවිප්ඵාරො සෙය්‍යථාපි විසාඛෙ යො ඉමෙසං සොළසන්නං මහාජනපදානං පහූත සත්තරතනා නං ඉස්සරාධිපච්චං රජ්ජං කාරෙය්‍ය සෙය්‍යථීදං අඞ්ගානං මග ධානං කාසීනං කොසලානං වජ්ජීනං මල්ලානං චෙතීනං වඞ්ගා නං කුරූනං පඤ්චාලානං මච්ඡානං සූරසෙනානං අස්සකානං

අවන්තීනං ගන්ධාරානං කම්බොජානං අට්ඨඞ්ග සමන්නාගතස්ස උපොසථස්ස එකංකලංනාග්ඝන්ති සොළසිං (තංකිස්සහෙතු) කපණං විසාඛෙ මානුසකං රජ්ජං දිබ්බං සුඛං උපනිධාය ”—

විසාඛෙ, විශාඛාව; එවං උපවුත්ථොඛො, මෙසේ වසනලද්දාවූ; අට්ඨඞ්ගුපොසථො, අෂ්ටාංග උපොසථයතෙම; මහප්ඵලො හොති, විපාකඵලයෙන් මහත්ඵල වන්නේය; මහානිසංසො, විපාකා නිසංසයෙන් මහානිසංස වන්නේය; මහාජුතිකො, විපාකාලොකයෙන් මහත් ආලොක ඇති වන්නේය; මහාවිප්ඵාරො, විපාක විප්ඵාර මහත්බැවින් මහාවිප්ඵාර වන්නේය; කීව මහප්ඵලො හොති, කොපමණ මහත්ඵලවේද; කීව මහානිසංසො, කොපමණ මහානිසංසවේද; කීව මහාජුතිකො, කොපමණ මහත්දීප්තිවේද; කීව මහාවිප්ඵාරො, කොපමණ මහත් පැතිරීම්වේද; විසාඛෙ, විශාඛාව; සෙය්‍යථාපි, යම්සේ (යමෙක්) හෙරිතලයක්සෙයින් සමවූ; පහූතසත්තරතනානං, බොහෝවූ ස්වර්ණ රජත මුක්තා මාණික්‍යාදී සප්තවිධ රත්නයෙන් යුක්තවූ හෙවත් හිණපමණ සත්රුවනින් සම්පූර්ණවූ; ඉමෙසං සොළසන්නං මහාජනපදානං, මේ සොලොස් මහජනපදයෙන් අලංකෘතවූ දඹදිව්තෙලෙහි; ඉස්සරාධිපච්චංරජ්ජංකාරෙය්‍ය, ඓශ්වර්‍ය්‍යාධිපත්‍යයෙන් යුක්තවූ හෙවත් චක්‍රවර්ත්ති රාජ්‍යයකෙරේද; සෙය්‍යථිදං තංකතමං, ඒ සොලොස්මහා ජනපද කවරේද; අඞ්ගානං, අඟුරටය; මගධානං, මගධරටය; කාසීනං, කසීරටය; කොසලානං, කොසොල්රටය; වජ්ජීනං, වැදූරටය; මල්ලානං, මල්ලරටය; චෙතීනං, සෑරටය; වංසානං, වංශරටය; කුරූනං, කුරුරටය; පඤ්චාලානං, පඤ්චාලදේශය; මච්ඡානං, මත්ස්‍යරටය; සූරසෙනානං, සූරසෙනරටය; අස්සකානං, අස්සකරටය; අවන්තීනං, අවන්තිරටය; ගන්ධාරානං, ගන්ධාරදේශය; කම්බොජානං, කම්බොජදේශය යනසොලසය, ඔහුගේ එබඳුවූ ඒ ඓශ්වර්‍ය්‍යය; අට්ඨඞ්ගසමන්නාගතස්ස, අෂ්ටාංගයෙන් යුක්තවූ; උපොසථස්ස, අහෝරාත්‍රියෙහි විසූ පෙහෙවස්හුගේ පිංකම්; සොළසිං, සොලොස් කොටසක් කොට බෙදූකල; එකංකලං නාග්ඝන්ති, එයින් එක්භාගයක් අගනේනොවෙයි; තංකිස්සහෙතු, ඊට හේතුකවරෙද? විසාඛෙ; විශාඛාව; මානුසකංරජ්ජං, මානුසිකවූ චක්‍රවර්ත්තිරාජ්‍යය, දිබ්බංසුඛං උපනිධාය, දිව්‍යසැප පිණිස; කපණං, සඬල්පවන්නේය—

“ යානිවිසාඛෙ මානුසිකානි පඤ්ඤාස වස්සානි චාතුම්මහාරාජිකානං දෙවානං එසො එකොරත්තිංදිවො තායරත්තියාතිං

සරත්තියො මාසො තෙනමාසෙන ද්වාදසමාසියො සංවච්ඡරො තෙන සංවච්ඡරෙන පඤ්චවස්සසතානි චාතුම්මහාරාජිකානං දෙවානං ආයුප්පමාණං ඨානංඛො පනෙතං විසාඛෙ විජ්ජති යංඉධෙකච්චො ඉත්ථී වා පුරිසො වා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසිත්වා කායස්සභෙදා පරම්මරණා චාතුම්මහාරාජිකානං දෙවානං සහව්‍යතං උප්පජ්ජෙය්‍ය ඉදංඛො පනෙතං විසාඛෙ සන්ධායභාසිතං කපණං මානුසකං රජ්ජං දිබ්බං සුඛං උපනිධාය ”

විසාඛෙ, විශාඛාව; මානුසිකානි, මානුසිකවූ; යානිපඤ්චවස්සසතානි යම් පනස් හවුරුද්දෙක් ඇද්ද ඔහු; චාතුම්මහාරාජිකානං දෙවානං, චාතුර්මහාරාජික දෙවලොකයෙහි දෙවියන්ට; එකොරත්තින්දිවො, එක්රාත්‍රි දිනයෙක් වන්නේය; තායරත්තියා, ඒ රාත්‍රියෙන් හෙවත් ඒ රාත්‍රිදිනයෙන්; තිංසරත්තියො, තිස් රාත්‍රියෙක්; මාසො, මසෙක් වන්නේය; තෙනමාසෙන, ඒ මසින්; ද්වාදසමාසියො, දොළොස් මසෙක්, සංවච්ඡරෙ, හවුරුද්දෙක් වන්නේය; තෙනසංවච්ඡරෙන, ඒ හවුරුද්දෙන්; පඤ්චවස්සසතානි, දිව්‍යවූවර්ෂ පන්සියයෙක්; චාතුම්මහාරාජිකානං දෙවානං, චාතුර්මහාරාජික දෙවලොකයෙහි දෙවියන්ට; ආයුප්පමාණං, ආයුප්‍රමාණවන්නේය; විසාඛෙ, විශාඛාව; ඉධ, මේලෝකයෙහි; එකච්චොඉත්ථීවා, සමහර ස්ත්‍රියක්හෝ; එකච්චොපුරිසොවා, සමහර පුරුෂයෙක්හෝ; අට්ඨඞ්ගසමන්නාගතං, අෂ්ටාඞ්ගයෙන් යුක්තවූ; උපොසථං උපවසිත්වා, පෙහෙවස් සමාදන්ව රක්ෂා කොට; කායස්සභෙදා, ශරීරස්ථිතියට කාරණවූ ජීවිතෙන්ද්‍රියොපච්ඡෙදයෙන්; පරම්මරණා, ච්‍යුතිචිත්තයෙන් මත්තෙහි හෙවත් භවාන්තරෙත්පාදනයයි කියනලද ච්‍යුතියට අනතුරුව සන්ධිග්‍රහණයෙහි; චාතුම්මහාරාජිකානං දෙවානං, චාතුර්මහාරාජික දෙවියන්හා; සහව්‍යතං, එක්වීමට; උප්පජ්ජෙය්‍ය, පැමිණෙන්නේයයන; යං, යම්කාරණයක් ඇද්ද; එතංඨානංපන, මේ කාරණයවනාහි; විජ්ජතිඛො, ඇත්තේමය; විසාඛෙ, විශාඛාව; මානුසකං රජ්ජං, මානුසිකවූ චක්‍රවර්තිරාජ්‍යය; දිබ්බං සුඛංඋපනිධාය, දිව්‍යසැපත් ජණීස; කපණං, ස්වල්පවන්නේය; ඉදංඛො පන, මේ වචනය වනාහි; එතංසන්ධායභාසිතං, මෙනිසා කියනලදී.

“ යංවිසාඛෙ මානුසකං වස්සසතං තාවතිංසානං දෙවානං එසො එකො රත්තින්දිවො තායරත්තියාතිංස රත්තියො මාසො තෙන මාසෙනද්වා දසමාසියො සංවච්ඡරෙතෙනසං වච්ඡරෙන දිබ්බංවස්ස සහස්සං තාවතිංසානං දෙවානං ආයුප්පමාණං ඨානං

ඛො පනෙතං විසාඛෙ විජ්ජතියං ඉධෙකච්චො ඉත්ථීවා පුරිසොවා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසිත්වා කායස්සභෙදා පරම්මරණා තාවතිංසානං දෙවානං සහව්‍යතං උප්පජ්ජෙය්‍ය ඉදංඛො පනෙතං විසාඛෙ සන්ධාය භාසිතං කපණං මානුසකං රජ්ජං දිබ්බං සුඛං උපනිධාය"෴

විසාඛෙ, විශාඛාව; මානුසකං වස්සසතං, මානුෂික වර්ෂ සිය යෙක්; තාවතිංසානං දෙවානං, තව්තිසාවැසි දෙවියන්ට; එකො රත්තින්දිවො, එක්රාත්‍රිදිනයෙක් වන්නේය; තායරත්තියා, ඒරාත්‍රියෙන්; තිංසරත්තියො, තිස්රැයෙක්; මාසො, මසෙක්වන්නේය; තෙනමාසෙන, ඒමසින්; ද්වාදසමාසියො, දොළොස් මසෙක්; සංවච්ඡරෙ, හවුරුද්දෙක් වන්නේය; තෙනසංවච්ඡරෙන, ඒ හවුරුද්දෙන්, දිබ්බංවස්ස සහස්සං, දිව්‍යවර්ෂ සහස්‍රයක්; තාවතිංසානං දෙවානං, තව්තිශාවැසි දෙවියන්ට; ආයුප්පමාණං, ආයුප්‍රමාණ වන්නේය; විසාඛෙ, විශාඛාව; ඉධ, මේලෝකයෙහි; එකච්චො ඉත්ථීවා, සමහර ස්ත්‍රියක්හෝ; එකච්චො පුරිසොවා, සමහර පුරුෂයෙක්හෝ; අට්ඨඞ්ගසමන්නාගතං, අෂ්ටාංගයෙන් යුක්තවූ; උපොසථං උපවසිත්වා, පෙහෙවස් සමාදන්ව රක්ෂාකොට; කායස්සභෙදා, ශරීරස්ථිතියට කාරණවූ ජීවිතෙන්ද්‍රියො පරිච්ඡෙද යෙන්; පරම්මරණා, චුතිචිත්තයෙන් මතෙහි; තාවතිංසානං දෙවානං, තව්තිසාවැසි දෙවියන්හා; සහව්‍යතං, එක්වීමට; උප්පජ්ජෙය්‍ය, පැමිණෙන්නේය යනු; යං, යම්කාරණයක්ඇද්ද; එතංඨානංපන, මේකාරණය වනාහි; විජ්ජතිඛො, ඇත්තේමය; විසාඛෙ, විශාඛාව; මානුසකංරජ්ජං, මානුෂික චක්‍රවර්ත්තිරාජ්‍ජය; දිබ්බංසුඛං උපනිධාය, දිව්‍යසැපය පිණිස; කපණං, ස්වල්ප වන්නේය; ඉදංඛොපන, මේවචනය වනාහි; එතංසන්ධායභාසිතං, මෙනිසා කියනලදී෴

"යානිවිසාඛෙ මානුසකානි වෙවස්සසතානි යාමාණං දෙවානං එකො රත්තින්දිවො තායරත්තියා තිංසරත්තියො මාසො තෙන මාසෙන ද්වාදසමාසියො සංවච්ඡරෙ තෙනසංවච්ඡරෙන දිබ්බානි වෙවස්ස සහස්සානි යාමානං දෙවානං ආයුප්පමාණං ඨාණංඛො පනෙතං විසාඛෙ විජ්ජතියං ඉධෙකච්චොඉත්ථීවා පුරිසොවා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසිත්වා කායස්ස භෙදා පරම්මරණා යාමාණං දෙවානං සහව්‍යතං උප්පජ්ජෙය්‍ය ඉදංඛො පනෙතං විසාඛෙ සන්ධායභාසිතං කපණං මානුසිකං රජ්ජං දිබ්බං සුඛං උපනිධාය"෴

විසාඛෙ, විශාඛාව; මානුසකානි, මානුසිකවූ; යානිචෙවස්ස සතානි, යම් ඒ මිනිස්වර්ෂ දෙසියයෙක් ඇද්ද හෙවත් මිනිස්නට දෙසියයක් හවුරුදු වෙද්ද; එසො, මෙතෙම; * යාමානං දෙවානං, යාමනම් දෙවලෝකයෙහි දෙවියන්ට එකොරත්තින්දිවො, එක්රාත්‍රින්දිනයෙක් වන්නේය; තායරත්තියා, ඒ රාත්‍රියෙන්; තිංසරත්තියො, තිස්රැයෙක්; මාසො, මසෙක් වන්නේය; තෙනමාසෙන, ඒ මසින්; ද්වාදසමාසියො, දොලොස් මසෙක්; සංවච්ඡරො, හවුරුද්දෙක් වන්නේය; තෙනසංවච්ඡරෙන, ඒ හවුරුද්දෙන්; දිබ්බානි චෙවස්ස සහස්සානි, දිව්‍යවර්ෂ දෙදහසෙක්; යාමානං දෙවානං, යාමනම් දෙවලෝකයෙහි දෙවියන්ට; ආයුප්පමාණං, ආයුප්‍රමාණ වන්නේය; විසාඛෙ, විශාඛාව; ඉධ, මෙලෝකයෙහි; එකච්චො ඉත්ථිවා, සමහර ස්ත්‍රියක් හෝ; එකච්චො පුරිසොවා, සමහර පුරුෂයෙක්හෝ; අට්ඨඞ්ගසමන්නාගතං, අෂ්ටාඞ්ගයෙන් යුක්තවූ; උපොසථං උපවසිත්වා, පෙහෙවස් සමාදන්ව රක්‍ෂාකොට; කායස්සභෙදා, ශරීරස්ථිතියට කාරණවූ ජීවිතෙන්ද්‍රියොපච්ඡෙදයෙන්; පරම්මරණා, චුතිචිත්තයෙන් මත්තෙහි; යාමානං දෙවානං, යාමනම් දෙව්ලොව දෙවියන්ගා; සහව්‍යතං, එක්වීමට; උප්පජ්ජෙය්‍ය, පැමිණෙන්නේය යනු; ඨානං, යමක්ඇද්ද; එතංඨානංපන, මේ කාරණයවනාහි; විජ්ජතිඛො, ඇත්තේමය; විසාඛෙ, විශාඛාව; මානුසකං රජ්ජං. මානුසිකවූ චක්‍රවර්තිරාජ්ජය; දිබ්බං සුඛං උපනිධාය, දිව්‍යසැප පිණිස; කපණං, ස්වල්ප වන්නේය යනු; ඉදංඛොපන, මේ වචනය වනාහි; එතංසන්ධාය භාසිතං, මෙනිසා කියනලදී.——

"යානිවිසාඛෙ මානුසකානි චත්තාරි වස්සසතානි තුසිතානං දෙවානං එසො එකොරත්තින්දිවො තාය රත්තියා තිංසරත්තියො මාසො තෙනමාසෙන ද්වාදසමාසියො සංවච්ඡරො තෙන සංවච්ඡරෙන දිබ්බානි චත්තාරි වස්ස සහස්සානි තුසිතානං දෙවානං ආයුප්පමාණං ඨානං ඛො පනෙතං විසාඛෙ විජ්ජතියං ඉධෙකච්චො ඉත්ථිවා පුරිසොවා අට්ඨඞ්ග සමන්නාගතං උපොසථං උපවසිත්වා කායස්සභෙදා පරම්මරණා තුසිතානං දෙවානං සහව්‍යතං

---

* යානිචෙව වස්සසතානි, යම්ඒ මිනිස්වර්ෂ දෙසියයක් වෙද්ද? ඔහු; තුසිතානං දෙවානං, තුසිතදෙවලෝකයෙහි දෙවියන්ට; එකොරත්තින්දිවො, එක්රාත්‍රිදිනයෙක් වන්නේය;—යනු සියලු සන්නවලදපදඇනුමෙහිද 'එසො' යන්නාගේ පදච්ඡෙදය නොපැනේ. මීට පළමුපෝර්මයේ දෙතැනක මෙය මෙසේම තිබේ. ඒ තැන්ද මෙහි දැක්වූක්‍රමයට අර්ථ දතයුතුයි.

උප්පජ්ජෙය්‍ය ඉදං ඛො පනෙතං විසාඛෙ සන්ධාය භාසිතං කපණං මානුසකං රජ්ජං දිබ්බං සුඛං උපනිධාය"—

විසාඛෙ, විශාඛාව; මානුසකානි, මානුසිකවූ; යානිචත්තාරි වස්සසතානි, යම් ඒ සාරසියයක් හවුරුදුවෙද්ද? එසො, මෙතෙම; තුසිතානං දෙවානං, තුසිත දෙවලෝකයෙහි දෙවියන්ට; එකොරත්තින්දිවො, එක්රාත්‍රි දිනයෙක් වන්නේය; තායරත්තියා, ඒ රාත්‍රිදිනයෙන්; තිංසරත්තියො, තිස්රැයෙක්; මාසො, මසෙක් වන්නේය; තෙනමාසෙන, ඒ මසින්; ද්වාදසමාසියො, දෙළොස් මසෙක්; සංවච්ඡරෙ, හවුරුද්දෙක් වන්නේය; තෙනසංවච්ඡරෙන, ඒ හවුරුද්දෙන්; දිබ්බානි චත්තාරි වස්සසහස්සානි, දිව්‍යවූ සාරදහසක් හවුරුදු; තුසිතානං දෙවානං, තුසිතදෙවියන්ට; ආයුප්පමාණං, ආයුප්‍රමාණවන්නේය; විසාඛෙ, විශාඛාව; ඉධ, මෙ ලෝකයෙහි; එකච්චොඉත්ථිවා, සමහර ස්ත්‍රියක්හෝ; එකච්චො පුරිසොවා, සමහර පුරුෂයෙක්හෝ; අට්ඨඞ්ග සමන්නාගතං, අෂ්ටාඞ්ගයෙන්යුක්තවූ; උපොසථං උපවසිත්වා, පෙහෙවස් සමාදන්ව රක්ෂාකොට; කායස්සභෙදා, ශරීරයාගේ භෙදයෙන්; පරම්මරණා, මරණින්මත්තෙහි; තුසිතානං දෙවානං, තුසිත දෙව්ලොවවැසි දෙවියන්හා; සහව්‍යතං, එක්වීමට; උප්පජ්ජෙය්‍ය, පැමිණෙන්නේය යනු; යං, යමෙක් ඇද්ද; එතංඨානංපන, මේ කාරණයවනාහි; විජ්ජති ඛො, ඇත්තේමය; විසාඛෙ, විශාඛාව; මානුසකං රජ්ජං, මානුසිකවූ චක්‍රවර්තිරාජ්‍යය; දිබ්බං සුඛං උපනිධාය, දිව්‍යසුවය පිණිස; කපණං, ස්වල්පවන්නේය; (හෙවත්) තුසිත දෙවලෝකයෙහි ඉපද විඳිනා දිව්‍යසම්පත්දුටුකල මිනිස්ලොව සක්විතිසැපත දුගියෙකුලද දුගීබතක් සෙයින් ස්වල්පවන්නේය; ඉදංඛො පන, මේ වචනය වනාහි; එතංසන්ධාය භාසිතං, මේ සඳහා කියනලදී.

"යානිවිසාඛෙ මානුසකානි අට්ඨවස්සසතානි නිම්මාණරතීනං දෙවානං එසො එකොරත්තින්දිවො තායරත්තියා තිංසරත්තියොමාසො තෙනමාසෙන ද්වාදසමාසියො සංවච්ඡරොතෙන සංවච්ඡරෙන දිබ්බානි අට්ඨවස්ස සහස්සානි නිම්මාණරතීනං දෙවානං ආයුප්පමාණං ඨානංඛොපනෙතං විසාඛෙ විජ්ජතියං ඉධෙකච්චො ඉත්ථිවා පුරිසොවා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසිත්වා කායස්සභෙදා පරම්මරණා නිම්මාණරතීනං දෙවානං සහව්‍යතං ලපපජ්ජෙය්‍ය ඉදං ඛො පනෙතං විසාඛෙ සන්ධාය භාසිතං කපණං මානුසකං රජ්ජං දිබ්බං සුඛං උපනිධාය"—

විසාඛෙ, විශාඛාව; මානුසකානි, මානුසිකවූ; යානිඅට්ඨ වස්සසතානි, යම් ඒ අටසියයක් හවුරුදුඇද්ද; එසො, මෙතෙම;

නිම්මාණරතීනං දෙවානං, නිර්මාණරතී දෙවලෝකයෙහි දෙවියන්ට; එකොරත්තිංදිවො, එක්රාත්‍රි දිනයෙක් වන්නේය; තාය රත්තියා, ඒ රාත්‍රියෙන්; තිංසරත්තියො, තිස්රැයෙක්; මාසො, මසෙක් වන්නේය; තෙනමාසෙන, ඒ මසින්; ද්වාදසමාසියො, දොළොස්මසෙක්; සංවච්ඡරො, හවුරුද්දෙක් වන්නේය; තෙනසංවච්ඡරෙන, ඒ හවුරුද්දෙන්; දිබ්බානි අට්ඨවස්ස සහස්සානි, දිව්‍යවූ අටදහසක් හවුරුදු; නිම්මාණරතීනං දෙවානං, නිර්මාණරතී දෙවියන්ට; ආයුප්පමාණං, ආයුප්‍රමාණ වන්නේය; විසාඛෙ, විශාඛාව; ඉධ, මේලෝකයෙහි; එකච්චොඉත්ථිවා, සමහර ස්ත්‍රියක් හෝ; එකච්චොපුරිසොවා, සමහර පුරුෂයෙක්හෝ, අට්ඨඞ්ගසමන්නාගතං, අෂ්ටාඞ්ගයෙන් යුක්තවූ; උපොසථං උපවසිත්වා, පෙහෙවස් සමාදන්ව රක්‍ෂාකොට; කායස්සභෙදා, ස්කන්ධභෙදයෙන්; පරම්මරණා, මරණයට අනතුරුවඋපන් ස්කන්ධ ග්‍රහණයෙහි (හෙවත්) මරණින්මතෙහි; නිම්මාණරතීනං දෙවානං, නිර්මාණරතී දෙවියන්හා; සහව්‍යතං, එක්වීමට; උප්පජ්ජෙය්‍ය, පැමිණෙන්නේය යනු; යං, යමක් ඇද්ද; එතංඨානංපන, මේ කාරණයවනාහි; විජ්ජතිඛො, ඇත්තේමය; විසාඛෙ, විශාඛාව; මානුසකං රජ්ජං, මානුසිකවූ චක්‍රවර්ති රාජ්‍යය; දිබ්බං සුඛං උපනිධාය, දිව්‍යසැප පිණිස; කපණං, ස්වල්පවන්නේය යනු; ඉදං, ඛොපන, මේ වචනයවනාහි; එතංසන්ධායභාසිතං, මේ නිසාකී යනලදී.

“යානිවිසාඛෙ මානුසකානි සොළසවස්සසතානි පරනිම්මිත වසවත්තීනං දෙවානං එසො එකො රත්තිංදිවො තායරත්තියා තිංසරත්තියො මාසො තෙනමාසෙන ද්වාදසමාසියො සංවච්ඡරො තෙන සංවච්ඡරෙන දිබ්බානි සොළසවස්සසහස්සානි පරනිම්මිත වසවත්තීනං දෙවානං ආයුප්පමාණං ඨානං ඛො පනෙතං විසාඛෙ විජ්ජති යං ඉධෙකච්චො ඉත්ථිවා පුරිසොවා අට්ඨඞ්ග සමන්නාගතං උපොසථං උපවසිත්වා කායස්සභෙදා පරම්මරණා පරනිම්මිත වසවත්තීනං දෙවානං සහව්‍යතං උප්පජ්ජෙය්‍ය ඉදං ඛො පනෙතං විසාඛෙ සන්ධායභාසිතං කපණං මානුසකං රජ්ජං දිබ්බං සුඛං උපනිධාය”

විසාඛෙ, විශාඛාව; මානුසකානි, මානුසිකවූ; යානිසොළසවස්සසතානි, යම් ඒ සොඩස වර්ෂශතකෙනෙක් ඇද්ද හෙවත් එක්දාස් හයසිය අවුරුදු කෙනෙක් ඇද්ද; එසො, මෙතෙම; පරනිම්මිත වසවත්තීනං දෙවානං, පරනිර්මිත වසවර්ති දෙවලෝකයෙහි දෙවියන්ට; එකො රත්තිං දිවො, එක් රාත්‍රිදිනයෙක් වන්නේය; තායරත්තියා ඒ රාත්‍රියෙන්; තිංසරත්තියො, තිස්රැයෙක් මා

සො, මසෙක්වන්නේය; තෙනමාසෙන, ඒ මසින්; ද්වාදසමාසියො, දොලොස් මස්කොතොක්; සංවච්ඡරෙ, හවුරුද්දෙක් වන්නේය; තෙනසංවච්ඡරෙන, ඒ හවුරුද්දෙන්; දිබ්බානිසොලසවස්ස සහස්සානි, දිව්‍යවූ සොලොස් දහස් හවුරුදු කොතොක්; පරනිම්මිත වසවත්තීනං දෙවානං, පරනිර්මිත වසවර්ති දෙවලොකයෙහි දෙවියන්ට; ආයුප්පමාණං, ආයුප්‍රමාණ වන්නේය; විසාඛෙ, විශාඛාව; ඉධ, මේ ලෝකයෙහි; එකච්චො ඉත්ථිවා, සමහර ස්ත්‍රියක්හෝ; එකච්චො පුරිසොවා, සමහර පුරුෂයෙක්හෝ; අට්ඨඞ්ග සමන්නාගතං, අෂ්ටාඞ්ගයෙන් යුක්තවූ; උපොසථං උපවසිත්වා, පෙහෙවස් සමාදන්ව රක්ෂාකොට; කායස්සභෙදා, ස්කන්ධභෙදයෙන්; පරම්මරණා, කාලූන්මරණින්මතුයෙහි; පරනිම්මිත වසවත්තීනං දෙවානං, පරනිර්මිත වසවර්ති දෙවියන්ගා; සහව්‍යතං, ඒකී භාවයට; උප්පජ්ජෙය්‍ය, පැමිණෙන්නේයයනු; යං, යම් කාරණයක් ඇද්ද; එතං ඨානංපන, මේ කාරණය වනාහි; විජ්ජතිඛො, ඇත්තේමය; විසාඛෙ, විශාඛාව; මානුසකං රජ්ජං, මානුසිකවූ චක්‍රවර්තිරාජ්‍යය; දිබ්බං සුඛං උපනිධාය, දිව්‍යසැපයපිණිස; කපණං, ස්වල්පවන්නේය යනු; ඉදංඛොපන, මේ වචනයවනාහි; එතංසන්ධාය භාසිතං, මේ නිසා කියනලද්දේයයි වදාළසේක ——*

“පාණං නහානෙ නචාදින්න මාදියෙ
මුසානභාසෙ නච මජ්ජ පොසියා
අබ්‍රහ්මචරියා විරමෙය්‍ය මෙථුනා
රත්තිං නභුඤ්ජෙය්‍ය විකාල භොජනං”

පාණංනහානෙ, (අෂ්ටාඞ්ග සමන්නාගතකොට පෙහෙවස් සමාදන්ව රක්ෂාකරන්නාවූ පුද්ගලතෙම) ප්‍රාණඝාත නොකරන්න්නේය; අදින්නං, (වස්තු ස්වාමීහු විසින් කයින්වචසින්) නුදුන් වස්තුව; නාදියෙ, නොමගන්නේය; මුසානභාසෙ, බොරු නොකියන්නේය; නච මජ්ජපොසියා, මදප්‍රමාදයට කාරණවූ සුරපානයද නොකරන්නේය; මෙථුනා අසද්ධම්මයයි කියනලද; අබ්‍රහ්මචරියා, අශ්‍රෙෂ්ඨචර්‍ය්‍යාවෙන්; විරමෙය්‍ය, වළකින්නේය; රත්තිං, රාත්‍රියෙහි; විකාලභොජනං නභුඤ්ජෙය්‍ය, විකාලභොජනය නොකරන්නේය; ——

---

* “ඉදමවොච භගවා ඉදංවත්වා” යනාදිපාඨය අපට දනිත් ලැබුනු සඟිපොත්වලද මෙම සන්නයේහා පදඇතුමෙහිද නොපනේ. නමුත් සූත්‍රසංග්‍රහ පොත්හි පමණක්තිබේ.

"මාලංනධාරයෙ නච ගන්‍ධමාචරෙ
මඤ්චෙඡමායං වසයෙථ සන්‍ථතෙ
එතංහි අට්ඨඞ්ගිකමාහු පොසථං
බුද්ධෙන දුක්ඛන්‍තගුණාපකාසිතං."

මාලංනධාරයෙ, ගෙතූනොගෙතූසීනිඳු බෝලිඳු දෑසමන් ආදිවූ සුගන්‍ධ පුෂ්පයන්ද පැලඳීම්වශයෙන් නොදරන්නේය; නචගන්‍ධමාචරෙ, (ශාන්‍ත සුවඳ කස්තුරු කපුරු ජබාදු සඳුන් පිනිදිය ආදිවූ) සුගන්‍ධ ද්‍රව්‍ය නොදරන්නේය; මඤ්චෙ, මුෂ්ටිහස්ත ප්‍රමාණපාඇති කප්පිය මඤ්චකයෙහි (හෝ); ඡමායං, සුධාදීන් පිරියම්කරණලද භූමියෙහි (හෝ); සන්‍ථතෙ, තෘණපර්ණපලාලාදීන් අතුටකරණලද සංස්තරණයෙහි (හෝ); සයෙථ, සයනයකරන්නේය; එතංහි උපොසථං, (මෙසේ ප්‍රාණඝාතාදි අකුසල් නොකකරන්නාහු විසින් සමාදන්ව රක්‍ෂාකරණ ලද්දාවූ) මේඋපොසථ සීලය; අට්ඨඞ්ගිකං, අට අඞ්ගකින් යුක්ත බැවින් අෂ්ටාඞ්ගික යයි; ආහු, කියත්, (මෙහි විපාකඵලාදිය) දුක්ඛන්‍තගුණා, වූත දුඃඛයාගේ අන්‍තයට පැමිණියාවූ; බුද්ධෙන, සියල්ලදත් භාග්‍යවතුන් වහන්සේ විසින්; පකාසිතං, ප්‍රකාශකරණලද්දැහ.

"චන්‍දො ච සූරියො ච උභොසුදස්සනා
ඔභාසයං අනුපරියන්‍ති යාවතා
තමොනුදාතෙ පනඅන්‍තලික්ඛගා
නභෙපභාසන්‍ති දිසා විරොචනා"

සුදස්සනා, යහපත්වූ දැකුම්ඇති; තමොනුදා, එකි එකී දිගින් නවලක්‍ෂයක් නවලක්‍ෂයක් යොදුන්පමණ තන්හි අඳුරුදුරු කරන්නාවූ; චන්‍දොච, චන්‍ද්‍රයාද; සූර්යොච, සූර්යයාද යනු; උභො, දෙදෙනා; යාවතා, යම් ප්‍රමාණප්‍රදෙශයෙක්; ඔභාසයං, බබුලුවමින්; අනුපරියන්‍ති, ඇවිදිද්ද හෙවත් හැසිරෙද්ද; අන්‍තලික්ඛගා, ආකාශගාමීවූ හෙවත් අහසින්යන්නාවූ; දිසාවිරොචනා, පෞරස්ත්‍යාදි සියලුදිශාවෙහි වොරජනාවූ; තෙපන, ඒ චන්‍ද්‍රසූර්යයී දෙදෙනා වනාහි; නභෙපභාසන්‍ති, අහස දිලියෙද්ද; හෙවත් විරොචනාව බබලන්නාවූ; තෙපන, ඒ චන්‍ද්‍රසූර්යයී දෙදෙනාවනාහි; දිසාපභාසන්‍ති, දිගුන්බබුලුවද්ද.

"එතස්මිං යංවිජ්ජති අන්‍තරෙධනං
මුත්තාමණිං වෙළුරියඤ්ච භද්දකං
සිඞ්ගීසුවණ්ණං අථවාපි කඤ්චනං
යංජාතරූපං හාටකන්‍ති වුච්චති"

එතස්මිං අන්තරෙ, මේ අතුරෙහි හෙවත් සතිස්ලක්ෂ දසදහස්
තුන්සිය පනස් යොදුන් පමණ වට ඇති මේ චක්‍රවාලාභ්‍යන්තර
යෙහි; මුත්තා, සමුද්‍රිකාදි අෂ්ටප්‍රකාර මුතුද; මණිං, ඉන්ද්‍රනීල
මහානීලාදි මැණික්ද; භද්දකා, ශ්‍රේෂ්ඨවූ; වෙළුරියඤ්ච, වෛඩූර්‍ය්‍ය
මයවූ මැණික්ද; සිඞ්ගීසුවණ්ණං, ගවශෘඞ්ග සදෘශව උපන්
හෙයින් ඒ නමැති සුවර්ණයද; අථවා අපි, නොහොත්; කච
නං, පර්වතයෙහි ජාතසුවර්ණයද යනු; යංචනාං විජ්ජති, යම්
වස්තුවෙක් ඇද්ද;; ජාතරූපං, ශාස්තෘ වර්ණ සුවර්ණයයි
කියාද; හටකනාති, කුඹුඹුවන්විසින් ඇදනිකුත්කල හෙයින්
හාටක සුවර්ණයයි කියාද; වුච්චති, කියනුලැබේද; වැළිත්යම්
වස්තුවෙක්ඇද්ද—

"අට්ඨඞ්ගු පෙතස්ස උපොසථස්ස
කලම්පිතෙනානු භවන්ති සොළසිං
චන්දප්පභා තාරගණාව සබ්බේ
තස්මාහි නාරීච නරෙච සීලවා"

තෙ, ඒ සියලු වස්තූහු; චන්දප්පභා, චන්ද්‍රාලෝකයට; සබ්බේ තා
රගණාඉව, සියලු තාරකා සමූහයාගේ ආලෝකයමෙන්; අට්ඨඞ්ගු
පෙතස්ස උපොසථස්ස, අහෝරාත්‍රියෙහි විසූ පෙහෙවස්හුගේ පින්
කම්; සොළසිං, සොලොස් කොටසක්කොට බෙදූකල; කලම්පි
නානු භවන්ති, භාගයකටද නොපැමිණෙන්නාහ; තස්මාහි,
එසෙහෙයින්; සීලවා සිල්වත්වූ; නාරීච, ස්ත්‍රීද; නරෙච
පුරුෂද—

"අට්ඨඞ්ගුපෙතං උපවස්සු පොසථං
පුඤ්ඤානිකත්වා න සුඛුද්‍රයානි
අනින්දිතාසග්ග මුපෙන්ති ඨානන්ති."

අට්ඨඞ්ගුපෙතං, අෂ්ටාඞ්ගයෙන් යුක්තවූ; උපොසථංඋපව
සිත්වා, පෙහෙවස් සමාදන්ව රක්ෂාකොට; (අනිකුත්ද) සුඛුද්‍රයානි,
සුඛවිපාක දෘයකවූ හෙවත් සුඛවේදනීයවූ; පුඤ්ඤානිකත්වාන,
දානාදි කුසල්කොට; අනින්දිතා, අගර්හිත; සග්ගංඨානං, රූප
ශබ්දාදි පඤ්චකාම සම්පත්තියෙන් සුෂ්ඨුඅග්‍රහෙයින් ස්වර්ගයයි
කියනලද දෙවලොකයෙහි; උපෙන්ති, උත්පත්තිවශයෙන් එළ
ඹෙත් හෙවත් දෙවලොකයෙහි උපදනාහුයයි වදාළසේක.

'ඉදමවොච භගවා අත්තමනා විසාඛා භගවතො භාසිතං අභි
නන්දීති'—

භගවා, භවසයුරු පසුරුවන් ලොවගපත් කිරුළුවන් අචාබිය
සතුරුවන් තිලොවට කතුරුවන් ගණඳුරට ළහිරුවන් මුදුනබැ

දිතුහුරුවන් සව්සතුන් පිණිස වැඩමකල ලෙව් තමන්වෙත නතුකල අපහසිත රජහංස වෘෂභ වරවාරණ මෘගරාජ ගමන විලාසඇති භාග්‍යවත් සම්‍යක්සම්බුද්ධ සර්‍වඥරාජොත්තමයාණන් වහන්සේ; ඉදං; මේ උපොසථ සූත්‍රදෙශනාව; අවොච; වදාළසේක; අත්තමනා, සර්‍වඥගත ප්‍රීතින් ඔදවැඩියාවූ සිත්ඇති; විසාඛා, විශාඛාතොමො; භගවතො භාසිතං, මේ උතුම් උපොසථසූත්‍රය බ්‍රහ්මස්වරයෙන් වදාරන්නාවූ භාග්‍යවත් බුදුරජාණන්වහන්සේගේ වචනයට; අභිනන්දි, සන්තොෂයෙන් අනුමොදන්ව සුභාසිතය සුලපිතය සාධු සාධූයි කියා මස්තකයෙන් පිළිගත්තාය.

නිමි

---

## ශුද්ධිපත්‍රය.

| පිට. | පෙළ. | අශුද්ධ. | | ශුද්ධ. |
|---|---|---|---|---|
| 3 | 2 | ඛාදනීයං | ... | ඛාදනියං |
| ,, | ,, | භොජනීයං | ... | භොජනියං |
| 4 | 20 | ඣවිනි | ... | ඣවනි |
| ,, | 21 | නකිංචනතසම්ං | | කිංචනතසම්ං |
| ,, | ,, | ඣවිනි | ... | ඣවනි |
| ,, | ,, | කිංචනංනජීති | ... | කිංචනතජීති |
| 4 | 27 | සබෙබ | ... ... | සවෙව |
| 5 | 36 | ඣවිනි | ... ... | ඣවනි |
| 6 | 1 | ඣවිනි | ... ... | ඣවනි |
| ,, | 3 | කිංචනංනජීති | ... | කිංචනානාඅජීති |
| 6 | 12 | දැනගන්නාහුමය | | දැනගන්නේමය |
| 6 | 21, 22 | සමාදපෙතබබා, සමාදන් කරවියයුතුවූ; යෙ, යම් සත්වකෙනෙක්ඇද්ද; තෙ සබෙබ, ඒ සියල්ලවුන්; | | සවෙව, සත්‍යයෙනි; සමාදපෙතබබා, සමාදන් කරවිය යුත්තාහුද; |
| ,, | 34 | නමපජලො | ... | නමහපජලො |
| 7 | 25 | ශත්‍රූන් | ... | ශත්‍රෑන් |

# ශුද්ධි පත්‍රය.

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 7 | ,, / 26 | මාර්ගඥණයෙන් * | මාර්ගඥානයෙන් |
| ,, | 28 | සබ්ධානැමති ... | ශුද්ධානැමැති |
| ,, | 29 | ශීලෙහි ... | ශීලයෙහි |
| 8 | 12 | ඉන්ද්‍රියයෙහි ... | සීලසංවරය, ඉන්ද්‍රියෙහි |
| ,, | 13 | අනපත්‍රපා ... | අපත්‍රපා |
| ,, | 13 | බාහුශ්‍රෘත්‍ය ... | බාහුශ්‍රැත්‍ය |
| 9 | 31 | එසේම පණස්යොදුන් පමණවූ ... | එසේම පනස් පනස් යොදුන් පමණවූ |
| ,, | 33 | විස්තාරෙත්සදඇති | විස්තාරෙතෙසධඇති |
| 10 | 17 | දුෂ්කරකරශාහි ... | පුෂ්කරසාදි |
| 13 | 12 | අකාලිකෙ ... | අකාලිකො |
| 16 | 35 | උපකක්මෙන ... | උපක්කමෙන |
| 17 | 1 | විශාඛාව ... | විසාඛාව |
| 20 | 29 | දෙවතා ... | තාදෙවතා |
| 22 | 17 | නාලිසණ්ඩසංච ... | නාළිසණ්ඩාසංච |
| 27 | 32 | උපොසථොච ... | උපොසථොචමෙ |
| 28 | 9 | විගුසනාඨානා ... | විගුසනාථානා |
| 29 | 1 | අරහනෙතා ... | අරහන්තො උච්චාසය න මහාසයනං පහාය |
| ,, | 10 | දුප්ඵත්තිලි ... | පුප්ඵත්තිලි |
| 32 | 6 | මාණුසකංවස්සසතං | යංමානුසකං වස්සසතං |
| ,, | ,, / 7 | මාණුසිකා වෂීසිසියයෙන් | යම් ඒ මානුසික වෂී සියයෙක් ඇද්ද |

* අක්ෂරයොජකයන්ගේ දෝෂයෙන්වූ මෙබඳු අශුද්ධ අක්ෂර වින්‍යාසස්ථාන පෝර්ම එකෙක දෙකෙක පමණක්ම තවතිපතැ නත්තිබේ එසින් අර්ථහානියක් නොපැනෙන බැවින් එබඳු තැන් ශුද්ධිපත්‍රයට අඩංගුනොකෙළෙමු.

